සබ්බ දානං ධම්ම දානං ජිනාති......

හැම දන් පරදවා ධර්ම දානය ජයගනී.............

# සුගතිය සහ නිවනට මග

ධර්ම දානය පිණිසයි
මුදලට විකිණීම සපුරා තහනම්

ලුණු අටුව සදහම් ග්‍රන්ථ - 03

දෙවන මුද්‍රණය - ශ්‍රී බුද්ධ වර්ෂ 2603
- ක්‍රිස්තු වර්ෂ 2014
- සිදුහත් බෝසත් උප්පත්ති වර්ෂ 2338
- සම්මා සම්බුද්ධ පරිනිර්වාණ වර්ෂ 2558

## සම්පාදනය

**ගල්ගමුවේ සාසන සිරි හිමි**
ලුණුඅටුව රජගල්ලෙන් ආරණ්‍ය, නවරත්නගොඩ, උඩතැන්න, මාතලේ

## සමාරාධනය

පූජ්‍ය රම්මුතුගල බුද්ධවංස හිමි
බෝධිමළු විවේක සේනාසනය, කිරිඔයගම, අතරගල්ලෑව.

## පරිගණක අකුරු සැකසුම

ෂෙරීකා ඈන්
(ෂෙරීකා කොමියුනිකේෂන්, අංක 07, නාගරික පොදු වෙළඳසල, ගොංගාවෙළ, මාතලේ)
දු.අ. 077 - 4104665
ඊ -තැපෑල :sherikacom@gmail.com

## මුද්‍රණය

ඊසි ප්‍රින්ට්
(කාවින්ද කුමාර, අංක 20, උඩුපිටිය, උකුවෙල, මාතලේ)
දු.අ. 077 - 8787959/ 0717 -772 772

## ධර්ම දනය

ෂෙරීකා ඈන් සහ ඇයගේ සහෝදර, නෑදෑ හිතවත් අයගේ මූල්‍ය දායකත්වයෙන් ධර්ම දානයක් වශයෙන් මෙම පොත මුද්‍රණය කර, නොමිළයේ බෙදා හරින ලදි.

# උපහාර පූජාව

අග මුල නොපෙනෙන අද්ධාන සංසාර ගමනේ පාරමී සපුරා
උප්පත්තිය අවසන් කරගෙන උප්පත්තියේ අවසානය
සංසාර ගමනේ නිමාව වදාළා වූ
තථාගත අරිහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේටත්
ශ්‍රී සද්ධර්ම රත්නයටත්
ආර්ය මහා සංඝ රත්නයටත්
මෙය උතුම් පූජාවක් ම වේවා !!!

තථාගත ශ්‍රී සද්ධර්මය
වසර දෙදහස් පන්සිය ගාණක් සුරක්ෂිතව පවත්වාගෙන ආවාවූ
පූර්වාචාරීන් වහන්සේලාට හා
කළ්‍යාණ මිත්‍ර වූ ආචාර්ය උපාධ්‍යාය උතුමන් වහන්සේලාට ද
උතුම් පූජාවක් වේවා !!!

මෙවැනි පොතක් ලියා දෙන ලෙස
ඉතා ගෞරවයෙන් ආරාධනා කළ
බුද්ධවංස ආයුෂ්මත් වහන්සේගේ හා
ලුණුඅටුවට පොත් පූජා කළ සැමගේ හා
ධර්මකාමීන් අතට මේ පොත පත් කිරීම දක්වා
අවශ්‍ය කාර්යයන් ඉටු කළා වූ ද
බරපැන් දායකත්වය දැරුවා වූ ද
සැමගේ සමාධයක් සංකල්පනා ඉටු වී උතුම් සැනසුම වේවා.
මෙම පොත කියවා ප්‍රයෝජන ගන්නා සැම දෙනාට ද
දහම් දැනුම තුළින් පාරමී කුසල් වඩා
සසර ජයගෙන උතුම් සැනසුම ලබත්වා !!!

කතු හිමි

ධර්ම දානයේ උතුම් පරමාර්ථ

ධර්ම ඥාණ

මාර්ග ඥාණ

ඵල ඥාණ

පිළිවෙළින්

කෙළෙස් ගිනි කඳ නිවී

උපත හා විපත නොලබන

සංසාර විමුත්තිය පිණිස

## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

# සංඛාරුප්පත්ති සූත්‍රය

(මජ්ඣිම නිකාය - උපරිපණ්ණාසකය)

දේශනා කළේ - සියල්ල දැන ගත් අප සම්බුදු රජාණන් වහන්සේ

### සූත්‍ර නිධානය

මේ මහා භද්‍ර කල්පයේ පටන් අතීතයට ගණින විට මීට කල්ප ලක්ෂයකට පෙර දඹදිව හංසවතී නුවර රජ කළ නන්ද රජතුමාට සහ සුමේධා දේවියට දරුවෙක්ව මහා බෝධිසත්ව කුමරෙක් උපන්නේ ය. උත්තර කියා නම් තබන ලදි. එම උත්තර කුමාරතුමා තරුණ වියෙහිදී කාම සම්පත්වලින් පිරුණු රාජකීය ගිහි සැප අතහැර, පැවිදිව, ජය ශ්‍රී මහා බෝධි මූලයේ වැඩ හිඳ, මාර පරාජය කර, උතුම්ම අවබෝධය නම් වූ බුද්ධත්වය ලබා, එහිම සතියක් වැඩ හිඳ, බිම ශ්‍රී පාදය තැබීමට පාදය දිගහරින විට මහ පොළොවෙන් නෙළුම් මල් මතු විය. එසේ නෙළුම් මල් මතින් වඩින විට තබන පියවරක් පාසා නෙළුම් මල් මතු වූ නිසා නෙළුම් මලට පාලි බසින් පදුම නමින් ව්‍යවහාර කරන බැවින් උත්තර නාමයට මුලින් පදුම නම එක්වී පදුමුත්තර නමින් ප්‍රකට වූ සේක. හෙළ භාෂාවෙන් පියමතුරා නමින් හඳුන්වනු ලැබේ.

එම බුදු රජාණන් වහන්සේට දේවල, සුජාත නම් රහතන් වහන්සේලා දෙනමක් අග්‍ර ශ්‍රාවක වූහ. අමිතා, අසමා නම් භික්ෂුණියන් වහන්සේලා දෙනමක් අග්‍ර ශ්‍රාවිකා වූහ. සුමන නම් ස්වාමීන් වහන්සේ නමක් අග්‍ර උපස්ථායක වූහ. පදුමුත්තර බුදු රජාණන් වහන්සේ ලක්ෂයක් ශ්‍රාවක රහතන් වහන්සේලා සමඟ පියතුමාට අනුග්‍රහ පිණිස හංසවතී නුවර සමීපයෙහි වාසය කළ සේක. බුදු රජාණන් වහන්සේගේ

බාල සහෝදර වූද, නන්ද රජතුමාගේ බාල පුත් කුමරා සුමන නම් විය. හංසවතී නුවර සිට යොදුන් එකසිය විස්සක් දුරින් පිහිටි පළාත් (ප්‍රාන්ත) රාජ්‍යයක් පාලනය සඳහා බාර දෙන ලදි. කුමාරයා එම ප්‍රදේශය පාලනය කරමින් වරින් වර හංසවතී නුවරට පැමිණ පිය මහ රජතුමා බැහැ දැක සම්මා සම්බුදු රජාණන් වහන්සේ හමු වී යන සිරිතක් විය.

මෙසේ කල් ගත වන විට සුමන කුමාරයාට බාර ප්‍රදේශයේ කැරැල්ලක් ඇති වී මහ රජතුමාට දන්වන ලදි. මහ රජතුමා විසින් කැරැල්ල සංසිඳවීමේ කාර්ය සුමන කුමාරයාට ම පවරන ලදුව කුමාරයා විසින් සාර්ථකව කැරැල්ල මැඩ පවත්වා මහ රජතුමාට දැන් වූ පසු මහ රජතුමා විසින් කුමාරයාට එන ලෙස දන්වන ලදුව පිය රජතුමා තමාට එන්න කියන්නේ තමා කෙරෙහි පැහැදී වරයක් (ප්‍රසාද දීමනාවක්) දීමට යැයි දැන ඇමති මණ්ඩලය සමඟ මේ පිළිබඳව සාකච්ඡා කළ අතර, එක් එක් කෙනා විවිධ දේ යෝජනා කළ අතර, ඇතැම් අය මෙසේ පැවසූහ. ඔබ මහ රජතුමාගේ පුතා බැවින් ඔබට නොලැබෙන දෙයක් නැත. ඒ සියල්ල අතහැර පරලොව යාම සිදු වේ. නමුත් අපි කරන පින් රැගෙන යන්නෙමු. එබැවින් බුදු රජාණන් වහන්සේට උපස්ථාන කිරීමට වරයක් ඉල්ලන්න යැයි කීහ.

ඔබලා මගේ හොඳ මිතුරෝ, මට එහෙම සිතක් තිබුණේ නැහැ. මේ යෝජනාව ඉතා හොඳයි. එයම ලබාගමු යැයි පවසා සුමන කුමාරා මහ රජු හමුවට ගියේ ය. පිය මහරජතුමාට වැඳ ගෞරව කළ පසු, තොරතුරු විමසා, සතුටු වූ රජු වරයක් දෙන ලදි. වරප්‍රසාද වශයෙන් බුදු රජාණන් වහන්සේ වඩමවාගෙන ගොස් උපස්ථාන කිරීමට ඉල්ලුවේ ය. දෙදෙනාගේ වාද විවාදයෙන් පසුව බුදු රජාණන් වහන්සේගේ කැමැත්ත විමසීමට තීරණ විය. බුදු රජාණන් වහන්සේ දන් වළඳා කුටියට වැඩම කළ වේලාවේ සුමන කුමාරයා විහාරස්ථානයට ගියේ ය. මා පැමිණියේ බුදු රජාණන් වහන්සේ හමුවීමටය, මට බුදු රජාණන්

වහන්සේ මුණ ගස්සවන්න යැයි ශාලාවේ රැස්ව සිටි ස්වාමීන් වහන්සේලාගෙන් ඉල්ලීම කරන ලදි.

(බුදු රජාණන් වහන්සේගේ සහෝදරයාවූ ද, රටේ මහ රජුගේ පුතා වන රජ කුමාරයා සිල්වතුන් ඉදිරියේ තම බලය පාවිච්චි නොකළේ ය. බුද්ධිමත් නිසා නිහතමානීව ආචාර ධර්ම ගරු කළේ ය. ඔබද මේ ගුණ පුරුදු කරන්න.)

අපට ඕනෑ ඕනෑ වේලාවට බුදු රජාණන් වහන්සේ ළඟට යාමට නොහැක. අර ස්වාමීන් වහන්සේට පුළුවන් යැයි උපස්ථායක ස්වාමීන් වහන්සේ වෙත කුමාරයා යැවූ සේක. උන් වහන්සේ ළඟට ගොස් තමා පැමිණි කාරණය දැන් වූ පසු, එම වේලාවේ ම ආපෝ කසින සමාපත්තියට සම වැදී පොළොව ජලය මෙන් අධිෂ්ඨාන කොට එතැනින් කිමිදී භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙන් මතු වී කුමාරයා පැමිණි බව දන්වා, ආසනයක් රැගෙන ඒ අයුරින් ම පැමිණ කුමාරයා ඉදිරියෙන් මතු වී එතැන ආසනය පැන වූ සේක. භාග්‍යවතුන් වහන්සේ පැමිණ, අසුනෙහි වැඩහුන් පසු, වන්දනා කර, තොරතුරු කතා කිරීමෙන් පසුව, ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, මම ඔබ වහන්සේ හමුවීමට ආවෙමි. මට ඔබ වහන්සේ මුණගස්වන්න යැයි අනෙක් ස්වාමින් වහන්සේලාට කී විට උන් වහන්සේලාට එය කළ නොහැකි යැයි කියා මේ සුමන ස්වාමීන් වහන්සේ ළඟට එවූ අතර, මේ ස්වාමීන් වහන්සේ එම වේලාවේ ම ඉටු කර දුන්නා. උන් වහන්සේ මේ ශාසනයෙහි විශේෂ වරප්‍රසාද ඇති බලවත් කෙනෙක් යැයි සිතමි යනුවෙන් කුමාරය පැවසූ විට, ඔව්, කුමාරය, මුන් වහන්සේ මේ ශාසනයට විශේෂ හිමිකාරයෙක් යැයි වදාළ සේක.

ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, මමත් බුදු සසුනට හිමිකාරයෙක් වෙන්න කැමතියි. එම නිසා හෙට මගේ දානය පිළිගන්නා සේක්වා යැයි ආරාධනා කර, රාත්‍රී එළිවෙන තුරු කටයුතු කර, දනය සූදානම් කර, එක දිගට දින හතක් දානය පුදා, තුන් මාසයක් තමාට අනුග්‍රහ පිණිස

වැඩමවන ලෙස ආරාධනා කළේය. ආපසු යන ගමනේ යොදුනෙන් යොදුන විහාරස්ථාන වශයෙන් එක් දිනක් නැවතීමට ශාලා ඉදි කරවමින් ගොස්, තමාට අයත් රාජ්‍ය සීමාවෙහි සෝභන නම් උද්‍යානය මිළට ගෙන එහි විහාරස්ථානයක් ඉදි කරවා භාග්‍යවතුන් වහන්සේ වඩමවා ගත්තේ ය. අනතුරුව තම පිරිස් රැස් කර, අප බොහෝ දුර සිට භාග්‍යවතුන් වහන්සේ  වඩමවා ගත්තේ බුදු රජාණන් වහන්සේලා ආමිසයට වඩා ධර්මයට ගරු කරන්නේ. මම මේ වස් තුන් මාසය දස සිල් සමාදම් වී, විහාරයෙහිම ගත කරමි. ඔබලා අඩුවක් නොකර දානය සපයන්න යැයි ඔවුනට පවරා රාජකීය ඇඳුම් ඉවත් කර, පඬු පෙවූ වස්ත්‍ර හැඳ, උපස්ථායක වූ සුමන ස්වාමීන් වහන්සේගේ  කුටිය ළඟම නවාතැන් ගෙන උන් වහන්සේ කරන සියලු වතාවත් හොඳින් අධ්‍යනය කරමින් ගතකර, වස් තුන් මස අවසන් වූ පසු තමා විසින් ම දින හතක් දන් දී, හත් වෙනි දින තුන් සිවුරු පුද, මා විසින් කරන ලද මෙම පින්කම් අනාගතයෙහි බුදු සසුනක මෙම සුමන ස්වාමීන් වහන්සේ මෙන් බුදු රජාණන් වහන්සේ නමකට උපස්ථාන කරන කෙනෙක් වෙම්වා යැයි පැතුවේ ය.

එම පැතුම වැරදීමක් නැතිව ඉටුවෙන බව බුදු රජාණන් වහන්සේ විසින් වදාළ පසු, බුදු රජාණන් වහන්සේලාගේ වැරදීමක් නැත. ඒකාන්තයෙන් මාගේ පැතුම ඉටුවේ යැයි කල්ප ලක්ෂයකට පසුව ලැබෙන තනතුර පිළිබඳව හෙට ලැබෙන දෙයක් හා සමානව හැඟී ඉමහත් ප්‍රමෝදයෙන් එම කාලයෙහි ආයුෂ අවුරුදු ප්‍රමාණය පරිදි අවුරුදු ලක්ෂයක් ම එම ජීවිතයෙහි බොහෝ දානාදි පින්කම් කර, මරණින් පසු සුගතියේ උපන්නේ ය.

මෙසේ සසර ගෙවා ගෙන විත්, කාශ්‍යප බුදු රජාණන් වහන්සේගේ කාලයෙහි පිඬුසිඟා වැඩියා වූ ස්වාමීන්  වහන්සේ නමකට

තමාගේ උතුරු සළුව පිදුවේ ය. වෙනත් ජීවිතයක රජ කෙනෙක්ව අහසින් වැඩියා වූ පසේ බුදු රජාණන් වහන්සේලා අට නමක් දැක, ආරාධනා කර, තම රජ උයනේ කුටි අටක් කරවා, එහි නවත්වාගෙන රජ මාළිගයේ වටිනා රත්න ජාති යොදා, ආසන අටක් කරවා, පාත්‍රා තැබීමට මැණික් ඔබ්බවන ලද ආධාරක අටක් කරවා, දිනපතා වඩමවා දස දහසක් අවුරුදු ආයුෂ ඇති එම කාලයෙහි ජීවිතාන්තය දක්වාම උපස්ථාන කළේ ය.

මේ විශේෂ පින්කම්වලට අමතරව ජාතක දේශනාවන් හී සඳහන් පරිදි අප මහා බෝධිසත්වයන් වහන්සේ සමග කල්ප ලක්ෂයක් ම සසර ගමනෙහි කුසල් කරමින් පැමිණ, බෝධි සත්වයන් වහන්සේ සමග තුසිත පුරයේ උපන්නේ ය. කලක් එහි වාසය කර, එයින් චුතව සුද්දෝධන රජතුමාගේ සහෝදර වූ අමිතෝධන රජතුමාට දුව පුත්‍රව ඉපිද සියලුම ඥාතීන්ට සතුට ගෙන දුන් බැවින් ආනන්ද යැයි නම් ලබා මහත් වූ ඉසුරු සැපවිඳිමින් සිට, බුදු රජාණන් වහන්සේ රජගහ නුවරින් කපිලවස්තු නුවරට වැඩම කළාට පසු, දේවදත්ත, භගු, කිම්බිලි කුමරුවන් සහ උපාලි කපුතුමා සමඟ පැවිදිව පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනාවක් අසා සෝතාපන්නව ආර්ය ශ්‍රාවකයන් වහන්සේ නමක් විය. සිද්ධාර්ථ කුමාරයන් වහන්සේ උපන් දිනම උපන් බැවින් බුදු රජාණන් වහන්සේට සමාන වයස ඇත්තේ ය. මහා පින් බලයක් තිබූ බැවින් ශරීර වර්ණයෙන්ද, දේහ සම්පත්තියෙන් ද, මනාව පිරුණු සිරුරකින් යුතු වූ බැවින් ද ගති ගුණ අතින් ද උසස් වූ බැවින් සැම දෙනාටම ප්‍රිය මනාප කෙනෙක් විය.

අප තථාගතයන් වහන්සේට පළමු විසි වර්ෂයෙහි නාගසමාල, නාගිත, සුනක්ඛත්ත, චුන්ද, සාගත, රාධ, මේඝිය යන නම් ඇති ස්වාමීන් වහන්සේලා වරින් වර උපස්ථාන කළෝ ය. එක් දිනක්

නාගසමාල ස්වාමීන් වහන්සේ සමග මාර්ගයෙහි වඩින විට දෙමං සන්ධියක දී බුදු රජාණන් වහන්සේ යමු යැයි වදාළ මාර්ගයෙන් නොගොස් බුදු රජාණන් වහන්සෙගේ පාත්‍රා සිවුරු බිම තබන්න හදා හිතුවක්කාර ලෙස අනෙක් මාර්ගයෙන් ගොස් සොරුන් විසින් පහර දී හිසත් පලා පාත්‍රා සිවුරු පැහැර ගත් පසු මේ විපත දැනගෙන තමා බුදු රජාණන් වහන්සේ මාගේ ගමන වැළැක්වූයේ මට දැන් බුදු සරණ හැර වෙන සරණක් නැතැයි සිතා ආපසු ආවේ ය. තමන් වහන්සේගේ පාත්‍රා සිවුරු ඉල්ලාගෙන බුදු රජාණන් වහන්සේ උපේක්ෂකව තනිවම වැඩිසේක.

තවත් වරෙක මේඝිය ස්වාමීන් වහන්සේ උපස්ථාන කරමින් සිට භාග්‍යවතුන් වහන්සේ එපා කියද්දිම මේඝිය ස්වාමීන් වහන්සේ අඹ උයනකට භාවනා කරන්න ගොස් උයනට පිවිසි තැන් පටන් කාම ව්‍යාපාද විහිංසා විතර්කවලින් පීඩා විඳ, භාවනා කළ නොහැකිව ආපසු පැමිණියේ ය.

**අග්‍ර උපස්ථායක තනතුර ලැබීම.**

සැවැත් නුවර ජේතවනාරාමයේ දම් සභාවෙහි සඟ පිරිස රැස් ව සිටි වේලාවක ඉහත සඳහන් කරුණු ඉදිරිපත් කර, මහණෙනි, මම දැන් මහලු වයසෙහි සිටිමි. එබැවින් යම් කෙනෙක් ස්ථිර උපස්ථායක ලෙස පත්වීමට සුදුසු යැයි වදාළ සේක. එම අවස්ථාවේ සෑම දෙනා වහන්සේලාම මහත් සංවේගයට පත්ව, අග්‍ර ශ්‍රාවක දෙනම පටන් අසූ මහ ශ්‍රාවකයන් වහන්සේලා උපස්ථාන කිරීමට ඉදිරිපත් වු විට, භාග්‍යවතුන් වහන්සේ එම සියලු දෙනාගේ ඉල්ලීම් හේතු දක්වමින් ප්‍රතික්ෂේප කළ සේක. එයට හේතුව කල්ප ලක්ෂයකට පෙර පදුමුත්තර බුදු රජාණන් වහන්සේ ළඟ අනාගත උපස්ථායක තනතුර පැතූ සුමන

කුමාරයා, ආනන්ද නමින් පැවිදිව මේ සඟ පිරිසේ ම සිටීමත්, එයට උන් වහන්සේට ඉඩ දීම සඳහාය.

එම වේලාවේ ආනන්ද ඔබත් උපස්ථායක තනතුර ඉල්ලන්න. මෙතෙක් වේලා එම තනතුර නොඉල්ලූ ආනන්ද ස්වාමීන් වහන්සේට සෙසු ස්වාමීන් වහන්සේලා බල කළ වේලාවේ, ඉල්ලලා ගන්න තනතුර නොවටී, භාග්‍යවතුන් වහන්සේ කැමති නම් පත්කරගනු අතැයි ආනන්ද ස්වාමීන් වහන්සේ පැවසූ සේක. එම කථාව ඇසී, මහණෙනි, ආනන්දට කවුරුවත් බල කළ යුතු නැත. තමන් ම දැනගෙන උපස්ථාන කරනු ඇතැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එවිට ආනන්ද නැගිටින්න භාග්‍යවතුන් වහන්සේ ඔබගේ උපස්ථානයට කැමතියි, වහාම නැගිට එය ලබාගන්න යැයි ස්වාමීන් වහන්සේලා උත්සාහ කරවූහ.

**ආනන්ද ස්වාමීන් වහන්සේගේ වරප්‍රසාද ඉල්ලීම**

ආනන්ද ස්වාමීන් වහන්සේ නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ගෞරවයෙන් යුතුව ප්‍රතික්ෂේප හතරක් සහ ඉල්ලීම් හතරක් කළ සේක.

**ප්‍රතික්ෂේප සතර**

ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේට ලැබෙන වටිනා චීවර මට නොදෙන්නේ නම්, ප්‍රණීත වටිනා පිණ්ඩපාත මට නොදෙන්නේ නම්, භාග්‍යවතුන් වහන්සේට ලැබෙන ආරාධනාවලට මාව එක්ක නොයන්නේ නම්, භාග්‍යවතුන් වහන්සෙගේ කුටියෙහි ඉන්න නොදෙන්නේ නම් මම උපස්ථාන කරන්න කැමැත්තෙම් යැයි පැවසූ සේක.

ආනන්ද ඔබ කුමන ආදීනවයක් දැකලාද මේ ප්‍රතික්ෂේප හතර ඉල්ලන්නේ? ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේට ලැබෙන හොඳම සිවුරු, හොඳම දානේ පරිභෝග කරමින්, ඔබ වහන්සේට ලැබෙන විශේෂ ආරාධනාවලට යමින් ඔබ වහන්සේ උදෙසා සැදැහැති දායක අය සාදා දෙන වටිනා කුටියෙහි වාසය කරමින් කවුද උපස්ථාන කිරීමට අකමැති වන්නේ කියා කරන චෝදනාවෙන් බේරීම සඳහා ය.

## ඉල්ලීම් සතර

මට ලැබෙන ආරාධනාවලට භාග්‍යවතුන් වහන්සේ වඩින්නේ නම්, දුර පළාත්වලින් පැමිණෙන අය ඒ වෙලාවේම ඔබ වහන්සේ වෙත පැමිණවීමට හැකි නම්, මට යම් සැකයක් ඇති වූ විට, පැමිණ එම සැක දුරු කර ගැනීමට අවස්ථාව ලැබේ නම්, මා නැති තැනෙක දී දේශනා කරන ලද ධර්මය නැවත මට දේශනා කරන්නේ නම්, මම උපස්ථාන කිරීමට කැමැත්තෙමි.

## අනන්දය, කුමන ආනිසංස දකිමින් ද මගෙන් මෙම ඉල්ලීම් කරන්නේ?

භාග්‍යවතුන් වහන්ස, ඇතැම් අය භාග්‍යවතුන් වහන්සේට දානය දෙන්න ඉඩක් නොලබා මගෙන් ඉල්ලුවොත් ස්වාමීන් වහන්ස හෙට භාග්‍යවතුන් වහන්සේ සමඟ අපේ දානයට වඩින්න කියා, භාග්‍යවතුන් වහන්සේ නොවැඩියොත් අපේ දානයකටවත් වඩමවා ගන්න බැරි නම්, සැකයක් ඇතිවන වේලාවේ ඒ සැකය දුරු කර නොදෙන්නේ නම්, පැමිණෙන අය කැමති වෙලාවට මුණ ගස්සන්න බැරි නම් භාග්‍යවතුන් වහන්සේ මේ විදියේ අනුග්‍රහයක්වත් නොකරන්නේ නම් ඔය උපස්ථාන කිරීමෙන් ඇති ඵලය කුමක් ද? කියා කරන චෝදනාවෙන් මිදීම සඳහා

ය.

ආනන්ද මේ ගාථාව, මේ සූත්‍රය, මේ ජාතකය දේශනා කළේ කොහෙදී දැයි අසන විට එයට පිළිතුරු දීමට මට නොහැකි වුණොත්, ඔබ වහන්සේගේ සෙවණැල්ල වගේ පස්සෙන් යනවා. මේ ටිකවත් නොදන්නෙහි නම් ඔය උපස්ථානයෙන් ඇති ඵලය කුමක්දැයි ඇසිය හැකිය. එබැවින් එම චෝදනාවෙන් මිදී අසන අයට කියාදීම සඳහා මා නැති තැන්වලදී වදාළ ධර්මය මට නැවත දේශනා කරන ලෙස ඉල්ලමි යැයි ආනන්ද ස්වාමීන් වහන්සේගේ පිළිතුර විය.

එදා පදුමුත්තර බුදු රජාණන් වහන්සේගේ සහෝදරයෙක්ව සිට කරන ලද පැතුම එයටම අනුරූප කුසල් කළ නිසා මෙදා ගෞතම බුදු රජාණන් වහන්සේට ඥාති සහෝදරව ඉපිද පැතූ පරිදිම අදහස් සපිරී විසිපස් වසරක් අඛණ්ඩව බුද්ධ උපස්ථාන කර, තනතුරත් ලැබ, සංසාර විමුක්තියත් ලැබූ සේක.

(තමන්ට උරුම වූ පැතුම් පරිදිම ලැබෙන උතුම් ම තනතුරක් නිසි කලට සුදුසු පරිදි ලැබෙන තනතුරු සියලු සුදුසුකම් තිබෙද්දිත් උත්සාහ නොකර සිටීම, සුදුසුකම් නැතිවත් තනතුරු සඳහා නොකළ යුතු දේ පවා කරන අනුවණ අයට හොඳම ආදර්ශයකි)

**එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං බහුස්සුතානං සතිමන්තානං ගතිමන්තානං ධිති මන්තානං උපට්ඨාකානං යදිදං ආනන්දො** - (අංගුත්තර නිකාය, ඒකක නිපාතය)

''මහණෙනි, බහුස්සුත වූ සතිමත් වූ ගතිමත් වූ ධිතිමත් වූ උපස්ථායක වූ මගේ ශ්‍රාවක භික්ෂූන් අතර මේ ආනන්ද භික්ෂුව අග්‍ර වේ''. යනුවෙන්

බුදු රජාණන් වහන්සේ විසින් තනතුර ප්‍රදානය කරන ලදි.

**බහුස්සුතානං** - මේ සාසනයෙහි ධර්මය උගත් බොහෝ රහතන් වහන්සේලා සිටියත් මේ ස්වාමීන් වහන්සේ ධර්මය අසා, ධර්මය ආරක්ෂා කරගෙන, පවත්වාගෙන යාම සඳහා ම බොහෝ ධර්මය අසා උගත් භික්ෂූන් වහන්සේලා අතර අග්‍ර වූ සේක.

**සතිමන්තානං** - මේ ස්වාමීන් වහන්සෙගේ ධර්මය මතකයේ තබා ගැනීමේ සිහිය අන් හැම දෙනාට වඩා බලවත් නිසා සිහිය ඇති භික්ෂූන් වහන්සේලා අතර අග්‍ර වූ සේක.

**ගතිමන්තානං** - ගති නම් යාමයි. මෙහි කියන යාම දහම් පද අනුව යන ඥාණයයි. මේ ස්වාමීන් වහන්සේ එක වර පද හැටදහක් දරා ගැනීමේ හැකියාව ඇති බව සඳහන් වේ. භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ පරිදිම දැන ගැනීමේ ඥාණ ගති ඇති නිසා ඥාණගති ඇති ස්වාමීන් වහන්සේලා අතර අග්‍ර වූ සේක.

**ධිතිමන්තානං** - ධිති නම් දරා ගැනීමේ ඇති හැකියාව යි. මේ ස්වාමීන් වහන්සේගේ ඉගෙන ගැනීමේ, සජ්ඣායනා කිරීමේ, ධර්මය දරා ගැනීමේ සහ උපස්ථාන කිරීමේ වීරිය අන් භික්ෂූන් වහන්සේලාට වඩා ඇති බැවින් ධෛර්යවන්ත භික්ෂූන් වහන්සේලා අතර අග්‍ර වූ සේක.

**උපට්ඨාකානං** - උපට්ඨාන නම් සැලකීමයි. මේ ස්වාමීන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උණු පැන් අවශ්‍ය වෙලාවට උණු පැන්ද, සිසිල් පැන් අවශ්‍ය වෙලාවට සිසිල් පැන් ද ලබා දෙමින් මේ මේ වෙලාවට මේ මේ දේවල් පිළිගැන්විය යුතු දේ නියමිත වේලාවට පිළිගන්වමින්, අත් පා සම්භාහනය කළ යුතු වේලාව දැන, එය කරමින්, කුටි මිදුල් ඇමදිය

යුතු වේලාව දැන, ඒවා කරමින්, රාත්‍රියට නව වතාවක් පමණ ආලෝක පන්දමක් ගෙන කුටිය වටා යමින් භාග්‍යවතුන් වහන්සේගේ අදහසට අනුවම සිත් දිනාගෙන වෙනත් ස්වාමීන් වහන්සේලාට වඩා දීර්ඝ කාලයක් සැලකීම කළ නිසා උපස්ථායක භික්ෂූන් වහන්සේලා අතර අග්‍ර වූ සේක. (මේ චරිතාපදානය මනෝරථපූරණී අංගුත්තර අට්ඨකථාවෙනි)

බොහෝ සූත්‍ර දේශනාවල නිධානය ප්‍රථම සංගායනා අවස්ථාවෙහි භාරසිය අනූ නව නමක් මහ රහතන් වහන්සේලා ඉදිරියෙහි **"එවං මෙ සුතං....."** මා විසින් මෙසේ අසන ලදි. යැයි ප්‍රකාශ කළ පරිදි මේ පොතට මාතෘකා කර ගන්නා ලද සූත්‍ර දේශනාවට ම අදාළ වන දෙයකින් ම ආරම්භ කරමින් මා විසින් මෙසේ අසන ලදි යැයි ප්‍රකාශ කළේ කවුරුන්දැයි හඳුන්වා දෙමින් බුද්ධ උපස්ථායක වූ ධර්ම භාණ්ඩාගාරික වූ ආනන්ද ස්වාමීන් වහන්සෙගේ චරිතාපදානයෙන් බිඳක් මෙසේ ඉදිරිපත් කළෙමි.

**"එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථ පිණ්ඩිකසස ආරාමෙ තත්‍ර බො භගවා භික්ඛූ ආමනෙත සි භික්ඛවො'ති භදනෙත'ති බො තෙ භික්ඛූ භගවතො පචචසෙසාසුං භගවා එතදවොච".**

සංඛාරුප්පත්ති නම් වූ මෙම සූත්‍ර දේශනාව ආනන්ද නම් වූ මා විසින් ඇසුවේ මෙලෙසිනි. එක් කාලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ අනාථ පිණ්ඩික සිටුතුමාගේ ජේතවනය නම් වූ ආරාමයෙහි වාසය කරන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, යැයි ඇමතූ සේක. පිංවතුන් වහන්ස යැයි භික්ෂූන් වහන්සේලාද පිළිතුරු දුන් සේක. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය වදාළ සේක.

අප තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් ධර්ම විනය වශයෙන් ද, නවාංග ශාස්තෘ සාසනය වශයෙන් ද වදාළ ධර්මය තථාගත පරිනිර්වාණයෙන් පසු, ප්‍රථම ධර්ම සංගායනාවේ දී පිටක හා නිකාය වශයෙන් බෙදා වෙන් කරන ලදි. දහම පිළිබඳව නිවැරදි නිරවුල් සම්පූර්ණ දැනීම සඳහා දහම් කොට්ඨාශවල ස්වභාවය දක්වා පසුව මාතෘකා කරන ලද සූත්‍ර දේශනාව විස්තර කරමි.

**''යො ඉමස්මිං ධම්ම විනයෙ අප්පමත්තො විහෙස්සති පහාය ජාති සංසාරං දුක්ඛස්සන්තං කරිස්සති''** යනුවෙන් යමෙක් මේ ධර්ම විනයෙහි අප්‍රමාදීව වසන්නේ නම් නැවත නැවත හටගන්නා වූ ස්කන්ධ ආයතන ධාතු පරම්පරාව වූ මේ සංසාරය (උපදිමින් මැරෙමින් යළි ඉපදී මැරී) යන ජීවිත පරම්පරාව අතහැර දුක් කෙළවර කරන්නේ ය. යනුවෙන් මෙසේ තථාගතයන් වහන්සේ විසින් ම ධර්ම විනය යන වචන දෙක බුදු දහම හැඳින්වීම සඳහා භාවිත කර ඇත. පිටක වශයෙන් බෙදීමේදී විනය පිටකය, විනය වශයෙන්ද, සූත්‍ර - අභිධර්ම දෙක ධම්ම වශයෙන් ගැනීම ව්‍යවහාර ක්‍රමය යි. එහෙත් විනය පිටකයෙහි ධර්මයත් සෙසු පිටක දෙකෙහි විනයත් ඇති බැවින් මුළු ත්‍රිපිටක ධර්මය ම ධර්ම විනය දෙකින් යුක්තයි.

සූත්‍ර, විනය, අභිධර්ම යන තුන් පිටයකයම **''අත්ථජ්ඣාසය, පරජ්ඣාසය, අට්ඨුප්පත්ති, පුච්ඡාවසික''** යැයි සතරාකාර වේ. මෙහි භාග්‍යවතුන් වහන්සේ හෝ ශ්‍රාවකයන් වහන්සේලා තම අදහසට අනුව දේශනා කළ දෙය අත්ථජ්ඣාසය යි. අනුන්ගේ අදහස් පරිදි දේශනා කරන ලද දහම පරජ්ඣාසය යි. යම් යම් කරුණක්, හේතුවක් මුල් කරගෙන වදාළ දහම අට්ඨුප්පත්තිකයි. ප්‍රශ්න විචාරීම් වශයෙන් වදාළ දහම පුච්ඡාවසික යි.

බුදු රජාණන් වහන්සේ සහ පසේ බුදු රජාණන් වහන්සේලා විසින් වදාළ දහම බුද්ධ භාසිතය යි. බුදු රජාණන් වහන්සේගේ දහමට අනුවම ශ්‍රාවකයන් වහන්සේලා වදාළ දහම සාවක භාසිතය යි. දෙවියන්, බ්‍රහ්මයන්ගේ ප්‍රකාශ දේව භාසිතය යි. බෝධි සත්ත්වයන් වහන්සේ ඇතුළු තාපසවරුන්ගේ ප්‍රකාශ ඉසි භාසිතයි.

මෙබඳු වූ දහම නිකාය හෙවත් කොට්ඨාශ වශයෙන් පහයි. මෙයින් දිගම දේශනා සමූහය වර්ග වශයෙන් තුන කි. සූත්‍ර වශයෙන් තිස් හතරයි. එය දීඝ නිකාය යි. වර්ග පහළවකින් සහ සූත්‍ර එකසිය පනස් දෙකකින් යුක්ත වූයේ මජ්ඣිම නිකායයි. සූත්‍ර හත් දහස් හත්සිය හැට දෙකකින් යුතු දේශනා සංයුක්ත නිකාය යි. එකේ සිට එකොළහ දක්වා දහම් කරුණු ගලපා නව දහස් පන්සිය පනස් හතකින් යුතු සූත්‍ර දේශනා අංගුත්තර නිකාය යි. ධම්ම පද, විමාන වත්ථු, පෙත වත්ථු, ඉති වුත්තක, උදාන, පටිසම්භිදා, මග්ග, ඛුද්දක පාඨ, සුත්ත නිපාත, චරියා පිටක, බුද්ධ වංස නිද්දෙස යන ඉතිරි දේශනා ඛුද්දක නිකාය යි.

සූත්‍ර නාමය ලබන දේශනා කොටස සුත්ත වශයෙන් ද, ගාථා සහිත සූත්‍ර දේශනා ගෙය්‍ය වශයෙන් ද, ගාථා නැති දේශනා වෙය්‍යාකරණ කියා ද, ධම්ම පද ආදී තනිකර පාලි කවි ගාථා වශයෙන් ද, සොම්නස් සහගත ඥාණයෙන් යුතු ව වදාළ දේශනා උදාන වශයෙන් ද, තමන් වහන්සේගේ අදහස් අනුවම මෙය කියාදිය යුතු යැයි සිතා වදාළ දහම් ඉතිවුත්තක වශයෙන් ද, අතීත ජීවිත සම්බන්ධ දේශනා ජාතක වශයෙන් ද, පුදුමය දනවන දහම් අබ්භූත ධම්ම වශයෙන් ද, සතුට ලැබ ප්‍රශ්න කිරීම් අනුව කරන ලද දේශනා වෙදල්ල වශයෙන් අංග වශයෙන් නව වාදෑරුම් වෙන දහම,

**''ද්වාසීති බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො**

**චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො''**

යනුවෙන් බුදු රජාණන් වහන්සේගෙන් අසූ දෙදහසක් ද, භික්ෂූන් වහන්සේලාගෙන් දෙදාහක් යැයි මා විසින් අසා දරාගෙන, ඇති ධර්මය කොටස් අසූ හාර දහසක් යැයි ආනන්ද රහතන් වහන්සෙගේ ප්‍රකාශය යි.

මහ සාගරයේ ජලය කවදා, කොතැනින්, කෙසේ, කුමන වේලාවක ගත්තත් එහි ඇත්තේ එකම ලුණු රසයම යි. එමෙන් ම බුදු රජාණන් වහන්සේ වදාළත්, ශ්‍රාවකයන් වහන්සේලා වදාළත්, කුමන රටක, කුමන කෙනෙක් වුවත්, කුමන භාෂාවකින්, කුමන කුලයකට අයත් කෙනෙක්, කුමන වෙලාවක දේශනා කළත්, ඇසුවත් මැනවින් පිළිපදින්නේ නම් මේ උතුම් වූ සද්ධර්මයේ ඇත්තේ එකම නිවීමේ දුකින් හා කෙළෙසුන්ගෙන් මිදීමේ ස්වභාවය වන විමුක්ති රසයයි. ''සබ්බං රසං ධම්ම රසො ජිනාති'' සියලු රස පරදවා ධර්ම රසය ජයගනී යැයි වදාළේ ඒ නිසාමයි. (මජ්ඣිම නිකාය අට්ඨ කථා)

වර්තමානයෙහි නිවැරදි දහම කුමක් ද? කවුරු කියන දෙය හරි ද, වැරදි දහම කුමක් ද? කවුරු කියන දෙය වැරදි ද? කියා තේරුම් ගත නොහැකි පරිදි ධර්මය කියා දීම, ලිවීම සිදු වෙන බැවින් ධර්මකාමීන් අතරමං වී ඇත. එය පුදුමයක් නොවේ. වැරදීම පෘතග්ජන ගතියයි. එය අපටද සිදු වේ. එහෙත් හරියැයි සිතා සිටි දෙය වැරදි ලෙසත්, වැරදි යැයි සිතා සිටි දෙය නිවැරදි ලෙස යම් දිනෙක යම් ක්‍රමයකින් වැටහුණේ නම් තමන් කුමන තත්වයේ කෙනෙක් වුණත් වැරදි වැටහීම අතහැර නිවැරදි දෙය ගැනීම, පිළිගැනීම ඥාණ ගතිය යි. සත්පුරුෂ ගතිය යි.

**එක්තරා දෙවියෙකුගේ ප්‍රශ්නයක්**

**"කස්සච්චයා නවිජ්ජන්ති - කස්ස නත්ථි අපාගතං**
**කො න සම්මොහමාපාදි - කොච ධීරො සදා සතො?"**

වැරදි නැත්තේ කාගේ ද? පිරිහීමක් නොවන්නේ කාගේ ද? මුලා නොවන්නේ කවු ද? සෑම ද සිහි නුවණින් වසන්නේ කවුද?

**"යස්සච්චයා නවිජ්ජන්ති - යස්ස නත්ථි අපාගතං**
**යො න සම්මොහමාපාදි - සොච ධීරො තථාගතො"**

යමෙකුගෙ වැරදීම් නැත්තේ ද, පිරිහීමක් නොවන්නේ ද, මුලා නොවන්නේ ද, සැමදා සිහි නුවණින් වසන්නේ තථාගතයන් වහන්සේ ය. (සංයුක්ත නිකාය - දේවනා සංයුක්තය)

**කෑල ගසේ උපමාව**

කෑල ගසක් පිළිබඳ ඇසූ විට, කොළ හැලී තිබෙන කාලයේ දුටු කෙනෙක් එය හරියට දැවිච්ච කණුවක් වගේ යැයි ද, හොඳට කොළ වැඩී තියෙන කල්හි දුටු කෙනෙක් නුග ගසක් මෙන් යැයි ද, මල් පිපී ඇති කල්හි පමණක් දුටුවේ නම් එය මස් වැදලි එල්ලෙනවා වගේ රතුම රතු පාට යැයි ද, කරල් සැදී ඇති කාලයේ පමණක් දුටුවේ නම් වෙනත් ආකාරයෙන් ද, එක් එක් කෙනා දැක්ක පරිදි පිළිගෙන අනෙකා කියන දෙය වැරදි යැයි කීවොත් එය නිවැරදි කීමක් නොවේ. නමුත් කෑල ගස නිවැරදිව හඳුනන කෙනෙක් නම් ඒ නිසා සෑම දෙනාම පවසා ඇත්තේ ඔවුන් දැක්ක පරිදිය. ඒ ඒ කාලයට මෙබඳු වේ යැයි පැවසුවොත් එය නිවැරදි ය.

## අන්ධ උපමාව

කිසි දිනක ඇතකු දැක නැති අන්ධ පිරිසකට ඇතෙකුගේ සොඬ, කන් ආදී එක් එක් අංග අල්ලන්න සලස්වා ඇතා කෙබඳු දැයි ඇසුවොත් තම තමාට දැනුන පරිදි කියනු ඇත. එහෙත් අනෙකා කී දෙය වැරදි යැයි යමෙක් කියයි නම් එය වැරදි නිගමනයකි. එමෙන් ම ධර්මය පිළිබඳව එක් ක්‍රමයක් අසා හෝ කියවා මෙය පමණයි හරි අනෙක් ක්‍රමය වැරදි යැයි කීමට ඉක්මන් නොවී හේතු ඵල දහමට හා සත්‍ය සතරට ගලපා, ධර්ම විනයට සසඳ ප්‍රකාශ කළ යුතු ය. තථාගතයන් වහන්සෙගේ දැනුම විශයානික්ක්‍රාන්ත ය. තථාගත නුවණ හා අපගේ දැනුම සැසඳුවොත් මහ සයුර ළඟ දිය බිඳක් මෙන් ද මහ කන්දක් පාමුල අබ ඇටයක් මෙන් අපගේ දැනුමයි. මෙහි දේශනා සහ උපුටා ගන්නා ලද කරුණු තහවුරු කරගෙන සැක දුරු කර ගැනීම සඳහා මුල සිටම පෙල හා අටුවා ග්‍රන්ථවල නම් යොදා ඇත.

## ප්‍රාර්ථනාවෙන්, ඉල්ලීමෙන් නොලැබෙන දේ

ගෘහපතිය, මේ ලෝකයේ ඉතා උසස් වටිනාකමක් ඇති කවුරුත් කැමති වෙන ප්‍රිය මනාප දේවල් පහක් ඇත. ඒවා නම් ආයුෂය, වර්ණය, සැපය, යසස නම් වූ (කීර්තිය, පිරිවර, භෝග සම්පත්) ස්වර්ගය යන පහයි. මේවා යාඥා කිරීමෙන් හෝ ප්‍රාර්ථනා කිරීමෙන් නොලැබේ. ගෘහපතිය, මේවා ප්‍රාර්ථනා කිරීමෙන් ලැබේ නම් මෙලොව කිසිවෙක්, කිසිම දෙයකින් පිරිහීමක් නොවන්නේ ය. ගෘහපතිය, ආයු, වර්ණ, සැප, යසස සහ ස්වර්ගය කැමති වන ආර්‍ය ශ්‍රාවකයා ඒවා ලැබේ වා යැයි යාඥා කරමින් ආශා නොකළ යුතු ය. ඒවා කැමති වන්නේ නම්, ඒවා ලැබෙන පිළිවෙත අනුගමනය කළ යුතු ය. එසේ පිළිපදින කෙනා දෙව් මිනිසුන් අතර ආයු, වර්ණ, සැප, කීර්තිය, යසස, පිරිවර උසස් කුලවත් බව ලබන්නේ ය. මේ කියන ලද කාම

සම්පත්වලට කැමති කෙනා විසින් ඒ සඳහා වෙන් වූ පිංකම් අප්‍රමාදයෙන් කළ යුතු ය. එසේ කරන කෙනා දෙලොවම ජය ගන්නා බැවින් එවැනි අය ඥානවන්තයෝ ය. (අංගුත්තර නිකාය - පඤ්චක නිපාතය)

**ආයුෂ ලැබීමේ පිංකම්**

ආයු, වර්ණ, සැප, යසස සහ ස්වර්ගය පිණිස පවතින පොදු පිංකම් මෙන් ම වෙන් වෙන් වූ පිංකම් ද ඇත. තෙරුවන් වන්දනාව, සිල්වත්, ගුණවත් ස්වාමීන් වහන්සේලාට, මව්පිය ගුරුවර වැඩිහිටි අයට වැඳීම, ආහාර පානාදිය දීම පොදු පිංකම් වේ.

දාගැබ්, විහාරස්ථාන, කුටි, සේනාසන ප්‍රතිසංස්කරණය දීර්ඝායුෂ ලැබීමේ පිංකම් ය. භාවනා කිරීම, ඉද්ධිපාද වැඩීම, සතුන් මැරීමෙන් වැළකීම සහ අභය දානාදිය දීර්ගායුෂ ලැබීමේ පිංකම් ය. බ්‍රහ්මචාරී වීම ආයු වර්ණාදී සියල්ල ලැබීමට හේතු වේ. බුද්ධ සාසනය ධර්මය බොහෝ කාලයක් පැවැත්ම සඳහා කටයුතු කිරීම, ධර්ම ග්‍රන්ථ නැවත නැවත මුද්‍රණය කරමින් දිගට පවත්වාගෙන යාමට කටයුතු කිරීමද හේතුඵල දහමට අනුව ආයුෂ ලැබීමේ පිංකම් වන අතර ගිලන් උපස්ථාන සුදුසු බෙහෙත් පරිත්‍යාගය ද ආයු ලැබීමේ පිංකම් ය.

**වර්ණය ලැබීමේ පිංකම්**

වර්ණ යන වචනයේ තේරුම් කීපයක් ඇත. ශරීර වර්ණය එකක්, උසස් කුලවත් බව එකක්, ගුණවත් බව තව එකක්, එමෙන් ම ඇසට අරමුණු වෙන සියලුම දේ වර්ණය යි. මෛත්‍රී භාවනාව, මාර්ග, සෑ මලු,

බෝ මලු, විහාර මලු ඇමද පිරිසිදු කිරීම, මල් පූජාව, වස්ත්‍ර, චීවර පූජාව, සිත ප්‍රසන්නව තබා ගැනීම සද්ධාව දියුණු කිරීම ද, රන් බුද්ධ රූප සෑදීම, වර්ණ දානය ද එම පිංකම් අතර වේ. දාගැබ්, බුදු මැදුරු, දාන ශාලා, ධර්ම ශාලා, කුටි, සෙනසුන්, ගෘහ භාණ්ඩ වර්ණාලේප කිරීම ශරීර වර්ණය ලැබීමේ පිංකම් ය. ගුණවතුන්ගේ ගුණ කීම, ගුණ වර්ණය ලැබීමට හේතු වේ. ගරු කළ යුත්තන්ට ගරු කිරීම, වැඳිය යුත්තන්ට වැඳීම. පිදිය යුත්තන්ට පිදීම, මාන්නය යටපත් කර නිහතමානී වීම ධර්මාසන පූජාව ආදිය උසස් කුල වර්ණය පිණිස හේතු වේ.

**සැප ලැබීමේ පිංකම්**

පාවහන් ලබා දීම, වාහන ලබා දීම සහ වාහනවලින් නොමිලේ ගමන් පහසුව සැලසීම, ගෙවල්, වාසස්ථාන, කුටි, සේනාසන සාදා දීම, දාන, ශීල, භාවනා, උපෝෂථ වාසය සහ අනුන්ට කරදර පීඩා නොදී සැපසේ වාසය කරන්න සැලැස්වීම අනුන්ගේ සැපය සඳහා කරන සියලු දේ තමන්ගේ සැපයට හේතු වේ.

**යසස ලැබීමේ පිංකම්**

යසස වශයෙන් භව භෝග සම්පත්, කීර්ති ප්‍රසංසා හා පිරිවර සම්පත් යන සියල්ලම කියවේ. පිරිස් සමග එකතුව පිංකම් කිරීම පිරිවර ලැබීමට හේතු වේ. භව භෝග සම්පත් ලැබීමට, වස්තු පරිත්‍යාගය, උත්සාහය, වීරිය, අලස නොවී නුවණින් කටයුතු කිරීම, උපායශීලී වීම, සොරකම් නොකිරීම, සිල් රැකීම බුද්ධානුස්සති ආදී භාවනා කුසල් ද වේ.

## ස්වර්ගය පිණිස හේතු වන පිංකම්

ඉහත කරුණු සියල්ල සවර්ගය පිණිස හේතු වෙන අතර, සියලුම පුණ්‍යක්‍රියා ද, පස් පවු, දස අකුසලින් වැළකීම, ලෝභ දෝස මෝහ යටපත් කර අලෝභ, අදෝෂ, අමෝහ දියුණු කිරීම ආයු වර්ණාදී සියල්ල පිණිස හේතු වේ. තථාගතයන් වහන්සේ ඉහත දේශනාවෙන් කර ඇත්තේ ආයුවර්ණාදිය නොපැතිය යුතු බවක් නොවේ, ඒවා ලැබීමට හේතු වන දේ නොකර ඉල්ලුවාට, යාඥා කළාට නොලැබෙන බවය. ලැබෙන ප්‍රතිපදාව වන පින්කම් කළොත් පැතුවත්, නොපැතුවත් ලැබේම ය.

## කසස කොපමාව (ගොවි උපමාව)

මේ ලෝකයෙහි ගොවි මහතා වහ වහා කුඹුර සී සෑම, මඩ කිරීම, වී වැපිරීම කළත්, අද පැළ වී හෙට පීදී අනිද්දා පැසී අස්වනු ලබා ගැනීමේ ඉද්ධියක්, ආනුභාවයක් ඔහුට නැත. බීජ නියාමයට අනුව පැළවී, උතු නියාමයට අනුව සුදුසු කාලයෙහි අස්වනු ලැබේ.

එමෙන් ම සසර බිය ඇති ශ්‍රාවකයා වහ වහා නොපමාව සීල, සමාධි, ප්‍රඥා වැඩිය යුතු වුවත් අද ම හෙට හෝ අනිද්දා සිත කෙළෙස්වලින් මුදවා ගැනීමේ ඉද්ධියක් ආනුභාවයක් ඔහුට නැත. සීල, සමාධි, ප්‍රඥා සම්පූර්ණ වූ විට සිත කෙළෙසුන්ගෙන් මිදීම වූ මාර්ගඵල නිවන් අවබෝධ වේ. (අංගුත්තර නිකාය - තික නිපාතය)

ගොවි උපමාවෙන් දැක්වෙන පරිදි බීජ නියාමය සහ උතු නියාමයට අනුව නියමිත කාලය ගෙවී යාමෙන් පැළවීම, පීදීම, පැසීම සිදු වුවත් ජලය, පොහොර නොලැබුණොත්, වල් මර්දනය

නොකළොත්, සතුන්ගෙන් ආරක්‍ෂා නොකළොත් අස්වනු නොලැබේ. එමෙන් ම සීලය පිරීමෙන්, සමාධිය පිරීමෙන්, ප්‍රඥාව පිරීමෙන් ම කර්ම නියාම චිත්ත නියාමයන් ට අනුව ලෝකෝත්තර මාර්ගඵල නිවන් ලැබීම සිදු වුණත්, කල්‍යාණ මිත්‍ර ඇසුර ධර්ම ශ්‍රවණය, නුවණින් මෙනෙහි කිරීම යන විදර්ශනාවල නොයෙදුණොත් මාර්ඵල නිවන් නොලැබේ. තවද, කිලේස අන්තරාය, උපවාද අන්තරාය, කම්මන්තරාය, අහේතුක දුහේතුක ප්‍රතිසන්ධිය සහ මාර්ගඵල නිවන් ලැබීමේ කැමැත්ත නැති බව යන කරුණු නිසා මාර්ගඵල නිවන් නොලැබේ.

## කිලේසාන්තරාය

භවය සදාකාලික යැයි පිළිගන්නා වූ සාස්වත දිට්ඨිය සහ මරණින් පසු ඉපදීමක් නැතැයි පිළිගන්නා වූ උච්ඡේද දිට්ඨිය යන දෙකට බ්‍රහ්ම ජාල සූත්‍රයේ සඳහන් දෙසැටක් වූ මිත්‍යා දිට්ඨි ඇතුළත් වේ. මෙවැනි වූ දිට්ඨි නියත හා අනියත කියා දෙවැදෑරුම් ය. මෙයින් කල්‍යාණ මිත්‍ර සම්පත්තියෙන් නිවැරදි ධර්ම ශ්‍රවණයෙන් නුවණින් මෙනෙහි කිරීමෙන් පහවෙන දිට්ඨිය අනියත මිත්‍යා දිට්ඨිය යි. එය මාර්ගඵල නිවන් ලබා ගැනීමට බාධාවක් නොවේ. කල්‍යාණ මිත්‍ර ඇසුර ලැබී ධර්ම ශ්‍රවණය ලැබී අත නොහරින දිට්ඨිය නියත මිත්‍යා දිට්ඨිය යි. උපතිස්ස, කෝලිත වැනි උතුම් කල්‍යාණ මිත්‍රයන් ලැබුණත් සංජය පිරිවැජියාට නිවන් අවබෝධ කළ නොහැකි විය. බුදු රජාණන් වහන්සේ ළඟ පැවිදිව උපස්ථාන කරමින් උපස්ථාන කළත්, සුනඛයෙක් ලෙස හැසිරෙන නිරුවත් තවුසෙක් දැක, මේ තමා නියම රහත් උතුමා යැයි මිත්‍යා දිට්ඨි ගත් සුනක්ඛත්ත භික්‍ෂුවට ද නිවන් අවබෝධ නොවුණි. මෙසේ වැරදි දේ හරි යැයි, හරි දේ වැරදි යැයි ද ගෙන අත නොහරින දැඩි මිත්‍යා දිට්ඨිය වූ නියත මිත්‍යා දිට්ඨිය කිලේසාන්තරයයි.

## උපවාද අන්තරාය

බුදු, පසේ බුදු, මහ රහත්, අනාගාමී, සකදාගාමී, සෝතාපන්න යම් ආර්ය ශ්‍රාවක කෙනෙකුට දෙස් කීම උපවාද අන්තරාය යි. සමාකර ගන්නා තුරු මගඵල නිවන් නොලැබේ. බුදු සසුනේ පැවිදිව අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලාගේ ශිෂ්‍ය නමක් වූ කෝකාලික භික්ෂුව අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලාට දෙස් කියා සමාව නොගත් බැවින් මගඵල නිවන් නොලබා මැරී ගොස් පදුම නිරයේ උපන්නේය.

## කම්මන්තරාය

පඤ්ච ආනන්තරිය කර්ම කිරීම කම්මන්තරාය යි. පියා මැරූ අජාතසත්තු රජු හා දේවදත්ත හිමි පියතුමා මරවා බුදු සිරුරින් ලේ සෙලවීම කළ බැවින් මගඵල නිවන් නොලබා අපා ගත වූහ.

## අහේතු දුහේතු ප්‍රතිසන්ධි

අලෝභ අදෝස අමෝහ යන කුසල හේතු නැති උපේක්ඛා සහගත සංතීරණ සිතින් උපන් අය අහේතු ප්‍රතිසන්ධිකයෝ ය. නුවණින් තොරව අලෝභ අදෝස කුසල හේතු සහිත වූ ඤාණ විප්පයුත්ත විපාක සිතින් උපන් අය දුහේතුක ප්‍රතිසන්ධිකයෝ ය. අකුසල විපාක අහේතුක සිතින් උපදින සියලු සත්වයෝ ද අහේතුක ප්‍රතිසන්ධිකයෝ ය. මේ සියල්ලෝ ම මගඵල නිවන් නොලබන්නෝ ය.

## අචඡන්දිකයො (කැමැත්ත නැත්තෝ)

කොතෙක් පින් තිබුණත්, හොඳ ඇසුර ලැබුණත්, ධර්ම ඇසුවත්,

කාමයන්ට වසඟව සසර දුකම සැප යැයි එයටම ඇලී බැඳී මතු සසරේද දෙව් මිනිස් සැපම පතමින් කුසල් කරන අයට මාර්ග ඵල නිවන් නොලැබේ. එපමණක් නොවේ, මේ සියලු හේතු සම්පත් ඇතිව ක්ෂේම භූමියක් කරා යන මාර්ගය පෙනී පෙනී තිබුණත් එම මාර්ගයේ නොගොස් රුදුරු කාන්තාර මාර්ගයේ ගොස් විනාශ වෙන්නාක් මෙන් බුදු උපත සිදු ව නිවන් මග පෑදී මිනිසත් බව ලබා, අංගවිකල නොවී, ප්‍රඥාව ලැබ සිටත් නිවන් මඟ නොයා නම් නිවන් නොලැබේ. මඟඵල නිවන් අවබෝධයට හේතු සම්පත් ඇතිව සිටි කෝටිපති පවුල් දෙකක තරුණ යුවලක් පාපමිත්‍ර සේවනයෙන් යුතුව කා බී සියලු ධනය නසාගෙන මහලු කල සිඟමනෙන් ජීවත් වූහ. මෙසේ මාර්ගඵල නිවන් අවබෝධයට කැමැත්ත නැත්තෝ අචඡන්දිකයෝ ය.

මුහුදෙහි හෝ ගඟෙහි යාත්‍රාව යායුතු ගමක්, රටක්, තොටුපළක්, ගොඩබිමක් පිළිබඳව ස්ථිර අරමුණක් නැතිව අත්‍යාවශ්‍ය දේ ගැනීමට තාවකාලික තොටුපළකට, වරායකට ළඟා නොවී පැදෙව්වොත්, තිබෙන ආහාර පාන අවසන්වී යාත්‍රාවද අබලන්ව දිරාපත්ව සයුරෙහි අතරමංව හෝ යායුතු දිසාව, මඟ, කාලය නොදැන යාමෙන් කුණාටුවලට හසුව හෝ බිහිසුණු පෙදෙස්වලට පිවිස හෝ ගල්පරවල සැපී, එහිදීම විනාශයට පත් වේ. එමෙන් ම මහා ධන සිටු යුවලද අරමුණක් නැතිව, අනාගත සැලැස්මක් නැතිව පෙර පින් හේතුවෙන් මව් පියවරු විසින් උපයා තිබූ ධනය පරිහරණය කරමින් ජීවිත යාත්‍රාව ධනය හා දුශ්චරිත මත පාවෙන්න හැර, ධන ඉපයීමක්, කුසල් කිරීමක් නොකර පෙර පින් ද, ධනයද අවසන්ව මෙලොව පරලොව ලෞකික සැපයෙන් ද ලෝකුත්තර මග ඵල නිවනින් ද පිරිහී සසරෙහි අතරමංව මහා දුකකට පත් වූහ.

## අරමුණත් නැති යාත්‍රා ගමන

යායුතු දිශාව, ගම, රට දැනගෙන අවශ්‍ය දේ ලබා ගැනීමට අසවල් තොටුපළට, අසවල් වරායට මෙපමණ දින ගාණකින් ළඟා වන්නෙමු යැයි නිගමනය කර ගල්පර, කුණාටු බිහිසුණු පෙදෙස් මඟ හැර යන අය යාත්‍රාවද, තමන් ද සුරැකිව නිරුපද්‍රිතව නියමිත ඉලක්කය කරා ගොස් අදහස් සඵලව අරමුණු ඉටු කරගන්නෝ ය. ගොඩබිම් මාර්ගයක වුවත් යායුතු නිවැරදි මඟ දැන ගෙන සැලසුම් සහගතව යන ගමන් සාර්ථක වේ.

## කාන්තාරය මැදින් ක්ෂේම භූමිය කරා....

දිගු මඟ ගෙවා ක්ෂේම භූමියක් සොයා යන ගමනේ දී කඳු හෙල් ද, තැනිතලා ද, රුදුරු වන සතුන්, අමනුෂ්‍යයන් පිරි වනාන්තරද, ආහාර පාන සුලභ උවදුරු නැති ගම් නගර පසු කර සුන්දර උයන් වෙල් යායවල් ද පසු කර යා යුතු ය. මෙම ගමනේ දී රුදුරු වන සතුන්, අමනුෂ්‍යයන් පිරි වනාන්තරයක නතර වුනොත් දුක් කරදර පීඩා විඳ අතර මඟදී ම මහා ව්‍යසනයකට පත් වේ. එසේ නොවුනොත් විශම මාර්ගවල ගොස් රුදුරු වනයෙහි, කාන්තාරයෙහි අතරමංව ක්ෂේම භූමිය නොදැක මැරෙන තුරු දුක් විඳ විඳ දුකෙන් ම මරු වසඟයට පත් වේ.

මේ දිගු සංසාර ගමනත් එබඳු ය. ලෝභය මසුරුකම නිසා ආහාර පාන නැති වැලි කතරට මෙන් ප්‍රේත ලෝකයට වැටේ. වෛර, ක්‍රෝධ බහුලකමෙන් අමනුෂ්‍ය කතරට මෙන් නිරා දුකට වැටේ. රුදුරු වන සතුන් ගහන වූ වන කතරට මෙන් මුලාවෙන් පවු කම් කර තිරිසන් අපායට වැටී බොහෝ කල් සසර කතරේ අතරමං වී දුක් විඳීමට සිදු

වේ. නිවන් සොයන ඇතැම් අයට හරි මඟ නොදුටුවහොත් සසර අතරමංව සතර අපා දුකට පත් වේ.

කේෂ්ම භූමිය ඉලක්ක කරගෙන, කාන්තාර මඟ හැර, රුදුරු සතුන් අමනුෂ්‍යයන් පිරි වනාන්තර මඟ හැර, ආහාර පාන සුලභ ගම් නගරවල නැවතී, ඒ තැන්වලින් මාර්ග උපකරණ සපයාගෙන නුවණ සහ වීරිය සිහිය ඇති අය කේෂ්ම භූමිය කරා ලඟා වේ. යා යුතු මාර්ගය මෙ යැයි සැලසුම් කරගෙන ම යනවා වගේ මේ දිගු සංසාර ගමනත් දිනකින් දෙකකින් යා නොහැකි සැලසුම් සහගතව නිවන් පරතෙරට යා යුතු සිහි නුවණ, වීරියෙන් යුතු ව සද්ධාදී මාර්ග උපකරණ සපයාගෙන නිවන් පරතෙරට සීල සමාධි ප්‍රඥා ගුණ සපුරමින් දිගු සංසාර ගමන යා යුතු යි. කේෂ්ම භූමි කරා යන ගමනේ රැගෙන ගිය මඟ වියදම් අවසන් වූ පසු හෝ අවසන්වීමට පෙර මාර්ග උපකරණ සපයා ගත නොහැකි කාන්තාර වනාන්තරවල නොනැවතී ඒවා මඟ හැර, විවේකයට පහසු මාර්ග උපකරණ සපයාගත හැකි ගම් නගරවල නැවතී යන්නාක් මෙන්,

නිවන් පරතෙර සොයා යන කෙනෙක් සද්ධා සීලාදී මාර්ග උපකරණ රැගෙන යන ගමනේ දී නිවනට පැමිණීමට පෙර මඟ දී සද්ධා, සීලාදී මඟ වියදම් අවසන් වෙන්න නොදී එම මඟ වියදම් සපයාගත හැකි සුගති සංඛ්‍යාත මිනිස් ලොව සහ විවේක ගැනීම සඳහා දෙව් මිනිස් සුගති නමැති ගම් නගරවල තාවකාලිකව නතර විය යුතුමය. කාන්තාර වැනි ප්‍රේත භවයටත්, රුදුරු සතුන් සහිත වනාන්තරය වැනි වූ තිරිසන් භවයටත්, අමනුෂ්‍යයන් පිරි පෙදෙස වැනි නිරයටත් නොවැටී යාමට නම් කේෂ්ම භූමිය කරා යන ගමන අස්ථිර වූ, උපද්‍රව සහිත නිසා ස්ථිර, දැඩි අධිෂ්ඨානයෙන් නිවැරදි මඟ දැන, නැවතිය යුතු ගම්, නගර කල් ඇතිව සනිටුහන් කර ගන්නා මෙන්, අස්ථිර වූ මං මුලා විය හැකි සසර ගමනත් නිවන් පරතෙර දකින තුරු,

ලඟාවෙන තුරු සීල සමාධි ප්‍රඥා සද්ධාදි මාර්ග උපකරණ සපයා ගත හැකි තැන් කල් ඇතිව සනිටුහන් කරගෙන, ඉලක්ක කරගෙන ගියොත් ගමන ඉතා දුෂ්කර නොවූ නොවරදින ඉතා සාර්ථක ගමනකින් නිවන් පරතෙර යා හැකි ය. ඒ සඳහා ම නිවන් පරතෙර වැඩියා වූ තථාගතයන් වහන්සේ විසින් නිවන් පිණිස පාරමී නොපිරුණු තව දුරටත් භව සම්පත් ලබනු කැමති අයට සිවු අපායෙන් මිදී, යායුතු මඟ සනිටුහන් කර ගන්නා වූ ක්‍රමයක් මේ සංඛාරුප්පත්ති සූත්‍ර දේශනාවෙන් විස්තර වේ.

**''සඞ්ඛාරුපපත්තිං වො භික්ඛවෙ දෙසිස්සාමි. තං සුනාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමි. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ පච්චස්සොසුං භගවා එතදවොච....''**

මහණෙනි, මම ඔබලාට සංස්කාරයන්ගේ උප්පත්ති ක්‍රමය කියා දෙන්නෙමි. එය හොඳට අහන්න. හොඳින් මෙනෙහි කරන්න. එහෙමයි පින්වතුන් වහන්ස, යැයි ඒ භික්ෂූන් වහන්සේලා පිළිතුරු දුන් පසු භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

(මෙහි සංස්කාර යනු හේතූන් නිසා හටගන්නා වූ සියල්ල යි. එයිනුත් පුඤ්ඤාභිසඞ්කාර නිසා හට ගන්නා වූ රූප, වේදනා, සඤ්ඤා, සංකාර, විඤ්ඤාණ යන ස්කන්ධයන්ගේ හටගැනීම පිළිබඳ ව දේශනාවකි.)

**''ඉධ භික්ඛවෙ භික්ඛූ සද්ධාය සමන්නාගතො හොති සීලෙන සමන්නාගතො හොති. සුතෙන සමන්නාගතො හොති චාගෙන සමන්නාගතො හොති පඤ්ඤාය සමන්නාගතො හොති.''**

මහණෙනි, මේ සාසනයෙහි සසරට බිය ඇති ශ්‍රාවකයා සද්ධාවෙන් යුක්ත වූයේ වේ ද, සීලයෙන් යුක්ත වූයේ වේද, දහම් දැනුමෙන් යුක්ත වේද, පරිත්‍යාගයෙන් යුක්ත වේද, නුවණින් යුක්ත වූයේද වේ.

මෙහි සද්ධාව යනු ධර්ම වශයෙන් අරූපී ධර්මයකි. සිතෙහි පවතින බැවින් චෛතසිකයකි. එබඳු සද්ධාවේ විවිධ අවස්ථා ඇත. අසද්ධාදී අකුසල ධර්ම යටපත් කිරීමට බලවත්ව ක්‍රියා කරන විට සද්ධා බලය වශයෙන් ද, කුසල ධර්මයන් හි මූලික වන විට සද්ධා ඉන්ද්‍රිය වශයෙන් ද, සසර ගමනට මඟ වියදම් රැස්කිරීමට ආධාර වෙන නිසා සදධා පාතෙයයං නමින් ද, පිං නමැති අස්වැන්න ලබා දෙන බැවින් සදධා බීජං වශයෙන් ද, සසර සැඩපහර ඉක්මවා යාමට ආධාර වන බැවින් සදධාය තරතී ඔඝං'' යනුවෙන් වදාරා ඇති අතර, ලෝකෝත්තර ගුණ ලබා දෙන බැවින් සදධා ධනයකි. උදක ප්‍රසාද මැණික බොර ජලයට දැමූ විට ජලය පිරිසිදු වෙන්නාක් මෙන් සිත කෙළෙසන උපක්ලේෂවලින් සිත පිරිසිදු කරන බැවින් පසාද සදධා නම් වේ. ඇදහීම් විශ්වාස කිරීම් වශයෙන් පහළවන විට ඔකපපන සදධා නම් වේ.

යමෙකුගේ සිතෙහි මෙවැනි සද්ධාව ඇත්නම්, ඔහු සද්ධාවන්තයෙකි. **''දස්සන කාමො සීලවතං සද්ධම්මං සොතුමිච්ඡති විනෙය්‍ය මච්ඡෙර මලං එසො සද්ධොති වුච්චති.''** සිල්වතුන් දකිනු කැමැත්තේ ද, සද්ධර්මය අසනු කැමැත්තේ ද, මසුරු, කිලුට දුරුකරගෙන සිටීද ඔහු සැදැහැවතෙකි. **''සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං....''** තථාගතයන් වහන්සේගේ අවබෝධය විශ්වාස කරයි. මෙය ''සද්ධා හන ලක්ඛණ'' සද්ධාවයි. භවයෙන් භවයට දියුණු වීගෙන එන සද්ධාව ''ආගම සද්ධාවයි''. මාර්ගඵල සිත්වල

ඇත්තේ අධිගම සදධාවයි.

යමෙක් තෙරුවන් සරණ යන්නේ සද්ධාවෙනි. ඔහු ත්‍රිවිධ රත්නයේ ම ගුණ අදහයි. එබැවින් බුදු රජාණන් වහන්සේ විසින් වදාළ ධර්මයට අනුව කර්මඵල විශ්වාස කරයි. මෙසේ කර්මඵල ඇදහීම විශ්වාසය නිසා සංසාරයට ඇති බිය නිසා පැවිදි වේ. **"සද්ධාය සමන්නාගතො භික්ඛූ"** යැයි වදාළේ එබඳු කෙනාටයි. සසරට බිය වී සසරින් මිදීමට කටයුතු කරන සියලු දෙනාම භික්ඛු නම් වේ.

**සීලෙන සමන්නාගතො හොති...**

සද්ධාවන්තයා ගිහි කල්හි පඤ්ච ශීලය රකිමින්, පස් පවින් වැළකේ. සිල්වතෙකු වේ. පැවිදි ව සාමණේර දස ශීලයෙන් යුක්ත වේ. එය ක්‍රම වශයෙන් පනහක් වේ. හික්මිය යුතු ආචාර ධර්ම හැත්තෑ පහක් සමඟ එකසිය විසිපහකින් යුක්ත ය. අනතුරුව ලෝකයෙහි ඇති උසස් ම සීලය වන ක්‍රම වශයෙන් කෝටි ගණනක් වූ සික පද ඇති උපසම්පදා ශීලයට පත් වේ. මෙබඳු ශීලයට පැමිණි කෙනා කය වචන දෙකෙ හි සංවරය පිණිස පනවා, වදාළ ශික්ෂා පද සමූහය (**අත්තානුවාද භය**) තමාගේ සිත දොස් කීම, (**පරානුවාද භය**) අනුන් දොස් නඟාවි යන බිය, (**දණ්ඩ භය**) වරදට දඬුවම් ලැබීමේ බිය, (**දුග්ගති භය**) වරද නිසා අපායට යාමේ බිය යන සතරෙන් වළක්වා, ආරක්ෂාව සලසන නිසාත්, ශීලයන් අතර උසස් ම ශීලය නිසා ප්‍රාතිමෝක්ෂ සංවර සීලය යි. ඇස, කන, නාසය, දිව, කය, මනසට එන අරමුණු නිසා අකුසල් ඇති වෙන්න නොදී රැක ගැනීම ඉන්ද්‍රිය සංවර සීලය යි.

පැවිදි කෙනා විසින් ජීවිකාව සඳහා වෙදකම්, යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්, සෙත් කවි - වස් කවි සාදා දීම, කේන්දර බලා ඵලාඵල කීම, අත් බලා ඵලාඵල කීම, රැකියාවන් කිරීම, දේහ ලක්‍ෂණ බලා ඵලාඵල කීම, හොර, මැර, තක්කඩිකම්, වංචා, දූෂණ ක්‍රියා කිරීම, ගිහි අයගේ පණිවිඩ ගෙන යාම, සාසන ධර්මයට නොගැළපෙන අයුරින් ගිහි කටයුතු කිරීම, සාසනයට ලැබෙන දේ ගිහි අයට දීම ආදී වැරදි ක්‍රම මගින් සිවුපසය ලබානොගෙන, සැදැහැති අය පිං ඵල අදහාගෙන දෙන දෙයින් පමණක් යැපෙමින් ආජීව පාරිසුද්ධි සීලය රකිමින්, දැහැමෙන් ලැබෙන දෙයද ප්‍රයෝජන සලකා සිහි නුවණින් පරිභෝග කිරීම ප්‍රත්‍ය සන්නිස්සිත ශීලය යි. මෙවැනි ශීලයන්ගෙන් සමන්නාගත වූ කෙනා එයින් නොනැවතී දහම් දැනුම ඇති කර ගනී.

**සුතෙන සමනනාගතො හොති...**

සුත නම් ඇසීමෙන් ලබා ගන්නා ලද දහම් දැනුමයි. **''ඉධ භික්ඛු ධම්මං පරියාපුනාති සුත්තං, ගෙය්‍යං, වෙය්‍යාකරණං ගාථං උදානං ඉති වුත්තකං ජාතකං අබ්භූත ධම්මං වෙදල්ලං.''** යනුවෙන් මුල දී විස්තර කරන ලද නවාංග ශාස්තෲ ශාසනය නම් වූ තථාගත දේශනාව වූ ශ්‍රී සද්ධර්මය අසා කියවා ධාරණය කරගෙන දහම් දැනුම ලබා ඇති ධර්මය උගත් භික්ෂුව සුතෙන සමනනාගතො භික්ඛු නම් වේ.

**චාගෙන සමන්නාගතො හොති...**

දැහැමෙන් ලැබෙන දෙය තනිව පරිභෝග නොකර, සුදුස්සන්ට සුදුසු තැන සුදුසු පරිදි පරිත්‍යාග කිරීමේ ගුණයෙන් යුක්ත, අන්‍යයාගේ යහපත වෙනුවෙන් තමන් සතු දෙය හා ශ්‍රමය, කාලය, පරිත්‍යාග කිරීමයි. එසේ කරන පැවිදි භික්ෂුවට සසුනට ලැබෙන දෙයින් තමන් සතු දෙය වුවත් සැමට දිය නොහැක. අනෙකුත් පැවිදි අය සඳහා දිය

හැක. ගිහි අයගෙන් මව්පිය දෙදෙනාටත් ළඟ සිට උපස්ථාන කරන අයටත් වැඩක් කරවා ගන්නා විටදී ඔවුන්ටද තමා වෙත පැමිණෙන අසරණ අයට දිය හැක.

**''ගිහීනමුපකරොන්තානං - නිච්ච මාමිස දනතො**
**කරොථ ධම්ම දනෙන - තෙසං පච්චුප කාරකං''**

නිරන්තරයෙන් සිවු පසයෙන් උපකාර කරන ගිහියන්ට අනුකම්පා කරන පැවිද්දන් විසින් ප්‍රත්‍යුපකාර වශයෙන් ධර්ම දානය කරන්න යනුවෙන් වදාරා ඇති බුද්ධානුශාසනාව පරිදි ගිහි අයට දිය යුතු උසස් ම දේ ධර්ම දනය යි. මෙසේ නොකොට ආමිසයෙන් ගිහි දයකාදීන්ට පරිත්‍යාග කරන භික්ෂුව කුල දුෂණ වරදට හසු වේ. කුල දූෂණය නම් ගිහියන්ගේ සද්ධාදී ගුණ නසා දැමීම යි. පැවිද්දන් විසින් ධර්මය හැර වෙනත් දේ ගිහියන් ට දීම නිසා එයින් සතුටුව පැවිද්දන්ට දන් දේ නම් මහත්ඵල නොවේ. එසේ ලබන සිවුපසය පරිභෝග කරන භික්ෂුවගේ ආජීව පාරිශුද්ධි සීලය නැති වේ.

**පති පිණ්ඩ දනය**

අතීතයෙහි වාහන නැතිව පාගමනින් ගොස් නවාතැනක් වූ අම්බලමක පසේ බුදු රජාණන් වහන්සේ නමක්, තාපස කෙනෙක්, බ්‍රාහ්මණයෙක්, තරුණයෙක් නවාතැන් ගත්හ. එතැනින් ගිය කෙනෙක් පියකරු පෙනුමැති තරුණයාට ආහාර ගෙනැත් දුන්නේ ය. එම තරුණයා තමාට ලැබුණ ආහාරය බ්‍රාහ්මණයාට දෙන ලදුව ඔහු විසින් තාපසතුමාට දෙන ලදි. තාපසතුමා විසින් පසේ බුදු රජාණන් වහනසේට දුන්නේ ය. උන් වහන්සේ කිසිවෙකුට නොදී ප්‍රත්‍යවේක්ෂාවෙන් සන්සුන්ව වැළඳූ සේක. ආහාර රැගෙන ආ

සිට නොසතුටින් ඒ ගැන විමසීය.

පිංවත, ඔබ විසින් තරුණයාට පුදන ලදි, තරුණයා විසින් තමාට වඩා උසස් බමුණාට පුදන ලදි, බමුණා විසින් තමාට වඩා උසස් තාපසතුමාට පුදන ලදි. තාපසතුමා විසින් අග්‍ර දක්ෂිණෙය්‍ය වූ පසේ බුදු රජාණන් වහන්සේට පුදන ලදි. තරුණයා සහ බමුණා ගිහි අය වූ බැවින් ද, තාපසතුමා තමාට ආහාරය දුන් කෙනා නිසා සංග්‍රහ කිරීම සඳහා ඔහුට දීම පැවිදි අයට නොසුදුසු බැවින් වෙනත් පැවිදි අය නැති නිසා තමන් වහන්සේ තනිවම වැළඳූ බව පසේ බුදු රජාණන් වහන්සේ වදාළා පසු, මාගේ දානය පිළිවෙළින් සුදුසුම තැනට පැමිණියා යැයි ආහාර ගෙනා කෙනා සතුටු වූ අතර, මහත්ඵල වීම සඳහා දිය යුත්තේ කාට දැයි ඔහු දැන ගත්තේ ය. මහත්ඵල වෙන්නේ කාට දුන්නොත් දැයි එදා දැන ගත්තේය. (භික්ඛා පරම්ප රා ජාතකය - ජාතකට්ඨ කථා)

**පඤ්ඤවාය සමන්නාගතො හොති...**

ප්‍රඥාව විස්තර කිරීමට වෙනම පොතක් ලිවිය යුතු යි. එහෙත් සීලය දේශනා කළ බොහෝ තැන්වල පඤ්ච සීලය වදාළා මෙන් ප්‍රඥාව පිළිබඳ බොහෝ දේශනාවල ඇති පාඨයක් මජ්ඣිම නිකායෙහි බෝධිරාජ සූත්‍ර දේශනවේ පධානියංග වශයෙන් වදාළ දේශනා පාඨය මෙසේ ය.

**''ඉධ රාජ කුමාර භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථ ගාමිනියා පඤ්ඤාය සමන්නාගතො හොති. අරියාය නිබ්බේධිකාය සම්මා දුක්ඛක්ඛය ගාමිනියා.......''.**

රාජ කුමාරය, මේ ශාසනයෙහි භික්ෂුව පඤ්ච උපාදනස්කන්ධයෙහි ඇති වීම හා ඇතිවීමේ හේතු ද, නැති වීම හා නැති වීමේ හේතු දන්නා වූ ද, ලෝභා දී අකුසල ධර්ම නිවැරදිව බිඳ දැමීමට සමර්ථ වූ මැනවින් දුක් නැති කරමින් යන පිළිවෙළ දන්නා වූ ප්‍රඥාවෙන් යුක්ත වුයේ වෙයි.

අභිධර්ම දේශනාවට අනුව ධම්ම සඞ්ගණියෙහි ප්‍රභේද වශයෙන් ප්‍රඥාවේ ස්වභාවය දේශනා කර ඇත්තේ මෙසේ ය. ඒ ඒ දෙයෙහි අර්ථ ප්‍රකටව දැන ගැනීමේ අර්ථයෙන් **පඤ්ඤා** නම් වේ. එයම සිංහලෙන් ප්‍රඥාව නමින් හඳුන්වයි. ප්‍රඥාවෙන් දක්නා ලද දෙය ප්‍රකටව දැන ගැනිම් අර්ථයෙන් **''පජානනා පජානාති''** නම් වේ. අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් වෙන් වෙන්ව දැකීම **''විචය පවිචය**'' කියා ද, සතර සත්‍ය පිළිබඳව වෙන් වෙන්ව විනිශ්චය කිරීම් අර්ථයෙන් **''ධම්ම විචය''** කියා වේ. අනිත්‍යාදි ලක්ෂණ වශයෙන් සලකා බැලීම් අර්ථයෙන් **''සල්ලක්ඛණා''** නම් වේ. පණ්ඩිතයන්ගේ ස්වභාවය වන නිසා **''පණ්ඩිච්චං''** කියා ද, නිපුණත්වය, පුහුණුව ඇති කරන අර්ථයෙන් **''නෙපුඤ්ඤං''** නාමයෙන් ද, දක්ෂ බවට පත් කරන බැවින් **''කොසල්ලං''** යන නම යෙදේ. නුවණින් කරුණු සලකා බලන අර්ථයෙන් **''උපපරික්ඛා''** නම් වේ. මහ පොළොව මෙන් පැතිරෙණ ස්වභාවය ඇති නිසා **''භූරි''** කියා වේ. වහා වැටහෙන අර්ථයෙන් **''මෙධා මෙධාවි''** නම් වේ.

මේ ප්‍රඥාව යමෙකුගේ සිතේ උපදී ද, එකල් හී තමා සමඟ එකට උපදින සිත හා සිතිවිලි අර්ථාවබෝධය පිණිස පමුණුවන නිසා පරිනායිකා යන නම් වේ. අනිත්‍යාදි වශයෙන් නැවත නැවත බලමින් යම් දෙයක පවත්නා ස්වභාවයත්, එයට හේතු විමසා බලන අර්ථයෙන් විපස්සනා නම් වේ. එබැවින් විපස්සනා හෝ විදර්ශනා භාවනාව යනු

ප්‍රඥා භාවනාවයි. ප්‍රඥාව වැඩීමයි. නිවන් අවබෝධ වන්නේ විදර්ශනා හෙවත් විපස්සනාවෙනි. වෙනත් ක්‍රමයකින් දක්වතොත් නාම රූපයන් අනිත්‍යාදී වශයෙන් නැවත බලන්නාවූ ලෞකික ප්‍රඥාවම වැඩි දියුණු වීමෙන් ලෝකෝත්තර මාර්ග ප්‍රඥාවෙන් නිවන් දැකීම වේ.

යම් දෙයක එහි පවත්නා ස්වභාවය සම්මුති, පරමාර්ථ දෙයාකාරයෙන් දක්නා ස්වභාවය **සම්පජඤ්ඤ** නම් වේ. වැරදි මඟට යොමු වන සිත නිවැරදි මඟට යොමු කරවන ප්‍රඥා ප්‍රභේදය පතොද නම් වේ. චිත්ත චෛතසික ධර්ම තමාට අනුගත කර ගනිමින් දැකීම් කෘත්‍යයේ අධිපතීත්වය දරණ විට පඤ්ඤ ඉන්ද්‍රිය කියා වේ. නොදැනීම නම් වූ අවිද්‍යාදී ධර්ම යටපත් කිරීමට ක්‍රියා කරන විට පඤ්ඤ බලං නමින් හඳුන්වනු ලැබේ. කෙළෙස් මාර නමැති සතුරන් කපා දමන අර්ථයෙන් **පඤ්ඤා සත්ථං පඤ්ඤාවුධං** කියා වේ.

ස්වාමීන් වහන්සේලා පිරිසක් එක් වස් කාලයක කමටහන් ගෙන, කැලයේ විදර්ශනා වඩමින්, පඤ්චස්කන්ධ නම් වූ මේ ජීවිතයේ ඇති වීම හා නැතිවීම බලමින් සිටින විට, මේ ශරීරය ඉතාමත් දුර්වල බැවින් මැටි බඳුනක් සේ සලකා බලන විට මේ කය මැටි බඳුනක් වැනි ය. පවුරු දිය අගලින් වට කර රකින නගරයක් මෙන් පිටතින් එන සතුරාට පඤ්ඤාවුධයෙන් පහර දෙන්නැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. තවත් වරෙක මහා කස්සප මහ රහතන් වහන්සේ දිවැසින් උපදින මැරෙන සත්වයන් බලමින් සිටිනවා දැක **පඤ්ඤා පාසාදමාරුය්හ අසොකො සොකිනිං පජං....** ප්‍රඥා ප්‍රාසාදයට නැග නිශ්සෝකීව ශෝක කරන සත්වයන් බලයි යනුවෙන් වදාරා ඇත.

අවිද්‍යාවෙන් අඳුරු කරන සිත් ආලෝකමත් කරන බැවින් පඤ්ඤා ආලොකො නම් වේ. **ධම්මචක්කප්පවත්තන** සූත්‍රයෙහි ආලොකො උදපාදි යැයි වදාළේ ප්‍රඥාව පහළ වූ බවයි. සූර්යයා නිසා අඳුරු දුරු වී ආලෝකය පැතිරෙන්නාක් මෙන් එම එළියෙන් ම හිරු සඳු තරු ප්‍රකටව බැබළෙන්නාක් මෙන් ප්‍රඥාව නිසා ඔහුත්, ඔහු නිසා අන් අයගේ ජීවිතත් බැබළේ.

**''යොච පුබ්බෙ පමජ්ජිත්වා පච්ඡා සො නප්පමජ්ජති සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමාති''** යමෙක් අවිද්‍යාව නිසා පළමුව ප්‍රමාදයෙන් පවු කරමින් සිට පසුව ප්‍රඥාව ලැබ අප්‍රමාදව කටයුතු කිරීම නිසා වළාකුළින් මිදුන සඳ මෙන් තම ජීවිතය බබුළුවයි. අංගුලිමාල ස්වාමීන් වහන්සේ මෙනි. මෙසේ ප්‍රඥාවෙන් බැබළී ප්‍රකටවීම් අර්ථයෙන් **පඤ්ඤාඔභාසො** නමින්ද හඳුන්වනු ලැබේ.

ආලෝකය නිසාම හිරු සඳු තරු විදුලි බුබුළු බැබළෙන්නාක් මෙන් ප්‍රඥාව නිසාම ප්‍රඥාව ඇති පුද්ගලයා දෙව් මිනිසුන් අතර ප්‍රකටව බැබළේ. බුදු රජාණන් වහන්සේගේ ප්‍රඥාලෝකයෙන් අනන්ත අප්‍රමාණ සක්වළ දෙවු බඹුන් අතර බැබළුණේ ය. බැබලෙන්නේ ය. මෙසේ බැබලෙන අර්ථයෙන් **පඤ්ඤා පජ්ජොත** නම් වේ.

**ශීලයේ බලෙන් රහත් වූ හිමි නමක්**

ස්වාමීන් වහන්සේ නමක් චාරිකාවේ වඩිමින් එක් ගල් ලෙනක නැවතිණ. අසල ගමෙන් දානය ලබා ගන්නා ලදි. එම ගල් ලෙනෙහි සිටි අමනුෂ්‍යයෙක් උන් වහන්සේ එතැනින් පන්නා ගැනීමට හේතුවක් සෙවීය. කිසි වරදක් නොදුටු විට ගමේ දායක ගෙදරක දරුවෙකුට

ආවේශ වී, ඔබලා උපස්ථාන කරන ස්වාමීන් වහන්සේගෙන් වැල් මී හෝ පෙරුම්කායම් ටිකක් ඉල්වාගෙන දරුවාට බෙහෙත් කරන්න යැයි කීවේ ය. ඒ සැදැහැති ප්‍රඥාවත් මව, මගේ දරුවා මැරුණත් උන් වහන්සේගෙන් බෙහෙත් නොඉල්ලවමියි යැයි කීයවා ය. එසේ නම් දනයට වැඩි පසු, උන් වහන්සේගේ දෙපා සේදූ ජලය දරුවාගේ හිසට දමන්න කීවේ ය. එය නම් කළ හැකි යැයි කියා, දානයට වැඩි පසු උන් වහන්සේට දන්වා පා සේදූ ජලය දරුවාගේ හිසට දැම්මාය. අමනුෂ්‍යයා දරුවා අතහැර ගල්ලෙනට ගොස් සිටියේ ය. ස්වාමීන් වහන්සේ දන් වළඳා කුටියට වඩින විටම ''මහ වෙදා, මෙහි ඇතුල් නොවෙන්නයි'' එම අමනුෂ්‍යයා කීවේ ය. ඔබ කවුදැයි විමසූ විට, මම මෙහි වසන දේවතාවා වෙමි. ඔබ අද උපස්ථායක ගෙදර අමනුෂ්‍ය ආබාධයෙන් පෙළුණ දරුවෙක් සුව කළා නේද? ඒ නිසා නුසුදුසු දේ කරන ඔබ මෙතැනින් පිටවෙන්න යැයි කීවේ ය. ගිහි අයට වෙදකම් කිරීම පැවිද්දන්ට අකැපයි. එහෙත් පා සේදූ දිය දයකයන් සතුයි. ඒවා ස්වාමීන් වහන්සේ නොදුන්නේ ය. ඒ නිසා වරදක් නැත.

අමනුෂ්‍යයා කළ චෝදනාවෙන් පසු තම ශීලය විමසා බැලූ ස්වාමීන් වහන්සේ ශීලයෙහි අඩුවක් නොදැක අහෝ, දෙවියන් පවා අපගේ ශීලය ගැන විමසිල්ලෙන් ඉන්නවා යැයි සිතමින් පිරිසිදු ශීලයෙන් සතුට උපදවාගෙන, ප්‍රීතිය යටපත් කර, විදසුන් වඩා ඒ මොහොතේ ම රහත් බව ලැබී ය. අනතුරුව මා නොව මෙහි නොසිටිය යුත්තේ ඔබමයි වහා මෙතැනින් පිටවෙන්නැයි වදාළ සේක. රහතන් වහන්සේගේ නියෝගය ඉක්මවිය නොහැකි වූ අමනුෂ්‍යයා නික්මී ගිය පසු උන් වහන්සේ පිරිනිවීම දක්වාම එහිම වාසය කළ සේක.

**"තස්ස එවං හොති අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා ඛත්තිය මහාසාලානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති"** මෙසේ ශීලයෙන් දහම් දැනුමෙන් ත්‍යාගයෙන් නුවණින් යුතු කෙනාට අනේ මම මරණින් පසු ක්ෂත්‍රිය මහාසාර කුලයේ උපදිනනේ නම් හොඳ යැයි සිතෙයි.

**"සො තං චිත්තං දහති තං චිත්තං අධිට්ඨාති. තං චිත්තං භාවෙති"** ඔහු ඒ සිතම තබා ගනී. එම අදහසෙහිම සිත පිහිටුවා ගනී. ඒ සිතම වැඩි වැඩි දියුණු කරයි.

**"තස්ස තෙ සංඛාරාච විහාරාච එවං භාවිතා බහුලීකතා තත්‍රූපපත්තියා සංවත්තන්ති. අයං භික්ඛවෙ මග්ගො අයං පටිපදා තත්‍රූපපත්තියා සංවත්තන්ති"** ඔහුගේ එම පුණ්‍යාභි සංස්කාර සංඛ්‍යාත කුසල චේතනාද ඒ සඳහා හැසිරීම ද වැඩියෙන් පවත්වයි ද, බහුල කරයි ද, ඒ හේතුවෙන් ක්ෂත්‍රිය මහා සාර කුලයෙහි ඉපදීම පසඳහා ම පවතී. මහණෙනි, එහි ඉපදීමට මේ මාර්ගයයි. මේ ප්‍රතිපදාවයි.

ලෝකයෙහි යම් යම් රටවල ක්ෂත්‍රිය මහා සාර කුලය අවසන් වී ඇත් නම් උපදින්නේ කොහේදැයි තර්ක කරන්නන්ට ඇසිය හැක. එයටද පිළිතුරක් තබමි. යමෙක් පාන් ගැනීමට වෙළඳසලට යයි. පාන් අවසන් වී ඇත. ඔහු වෙනත් සුදුසු. ඇත්තා වූ ආහාරයක් ගනී. භාණ්ඩයක් ගැනීමට යයි. එම වෙළඳ සැල වසා ඇත. වෙනත් තැනකට යයි. එහි ඇති භාණ්ඩ ගනී. එමෙන් ම ක්ෂත්‍රීය මහාසාර කුලය ලොව නොපවතී නම් බ්‍රාහ්මණ කුලයේ හෝ ගහපති මහාසාර කුලයේ හෝ ඉපදීම සිදුවිය හැකි ය. එහෙත් ජනපති, අගමැති තනතුරු ඇති බැවින් එවැනි ජන ප්‍රධාන මෙකලට උසස් යැයි සම්මත කුලවල උපදී. මේ දේශනාව කර ඇත්තේ බෝහෝ රජ පරම්පරා තිබූ වසර දෙදාහකට

පෙර ය. මෙකල රජ පෙළපත් නැති නිසා නැති දේ නොපතා ඇති දේ පතනු ඇත. ලෝකය පරිවර්තනය වී නැවත රජ පෙළපත් ඇති වීමද වන්නේ ය. (මෙතැන් සිට කෙටියෙන් අර්ථ පමණක් දක්වමි)

මහණෙනි, නැවත අන්‍ය කරුණක් කියමි. මේ ශාසනයෙහි සද්ධා, ශීල සුත චාග ප්‍රඥාවෙන් යුක්ත වූ, කෙනෙකුට මම බ්‍රාහ්මණ මහාසාර කුලයේ උපදින්නෙමි යැයි සිතෙයි. ඒ පැතුමෙන් යුතු චේතනාව සිතෙහි තබා ගනී. පිහිටුවයි. වැඩි දියුණු කෙරේ. එම චේතනා සහිත සිත ද ඒ සඳහා හැසිරීම ද වැඩි වැඩියෙන් පවත්වා ද එය බ්‍රාහ්මණ මහාසාර කුලයෙහි ඉපදීමට මෙය ම මඟයි. මෙය ම ප්‍රතිපත්තිය යි.

තවද මහණෙනි, සද්ධා, ශීල, සුත, ත්‍යාග ප්‍රඥාවෙන් යුතු කෙනෙකුට මම මරණින් පසු ගෘහපති මහා සාර කුලයේ ඉපදීමට සිතෙයි. ඒ පැතුමෙන් යුතු චේතනාව සිතේ තබාගෙන, පිහිටුවාගෙන, වැඩි දියුණු කරයි. එසේ හැසිරීමද කුසල චේතනා බහුල කිරීම ගෘහපති මහාසාර කුලයෙහි ඉපදීම පිණිස හේතු වේ. මහණෙනි, එයට මේ මඟයි. මේ ප්‍රතිපදාව යි.

තවද මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව සද්ධා, ශීල, සුත, ත්‍යාග, ප්‍රඥාවෙන් යුක්ත වේ. අවුරුදු අනූ ලක්‍ෂයකට දීර්ඝායුෂ ඇති වර්ණවත් අධික සැප ඇති දෙවියන් පිරිසක් චාතුම්මහාරාජික නමින් ඇතැයි ඔහුට අසන්න ලැබේ. අනේ මමත් චාතුම්මහාරාජික දෙවියන් අතර මරණින් පසු උපදින්නෙමියි ඔහුට සිතෙයි. ඔහු ඒ සිත තබයි. පිහිටුවයි. වඩයි. ඔහුගේ ඒ ප්‍රාර්ථනාව සහිත වූ චේතනාවෙන් යුතු සිත මෙසේ වඩන ලද්දේ බහුලව උපදවන ලද්දේ එහි උපත පිණිස පවතියි. මහණෙනි, එහි උපත පිණිස මේ මාර්ගය යි. මේ ප්‍රතිපදාවයි.

තවද මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව සද්ධා, ශීල, සුත, ත්‍යාග, ප්‍රඥාවෙන් යුතු වේ. බොහෝ ආයුෂ ඇති, වර්ණවත්, අධික සැප ඇති, තාවතිංස, යාම, තුසිත, නිම්මාණරතී, පරනිම්මිත වසවත්ති නමින් දෙවියෝ ඇතැයි ඔහුට අසන්නට ලැබේ. අනේ මමත් මරණින් පසු තාවතිංස හෝ යාම හෝ තුසිත හෝ නිම්මාණරතී හෝ පරනිම්මිත වසවත්තී හෝ දෙවියන් අතර උපදින්නෙම් නම් හොඳ යැයි සිතෙයි. ඒ පැතුම් ඇති, චේතනා සිත් ප්‍රාර්ථනා වශයෙන් තබයි. එහි ඉපදීමට අදිටන් කර ගනියි. එම කුසල් සිත් නැවත නැවත උපදවයි. ඔහුට එම කුසල් සිත් නම් වූ පුඤ්ඤාභි සඞ්ඛාරද, හැසිරීමද බහුල වශයෙන් කිරීමද, වැඩි දියුණු කිරීමද ඒ දෙවියන් අතර ඉපදීම පිණිස හේතු වේ. මහණෙනි, එහි උපත පිණිස මේ මාර්ගය යි. මේ ප්‍රතිපදාවයි.

තවද මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව සද්ධා, ශීල, සුත, ත්‍යාග, ප්‍රඥාවෙන් යුතු වේ. දහසක් ලෝක ධාතූන් හි ආලෝකය පැතිරවිය හැකි බැවින් සහස්ස නම් බ්‍රහ්මයෝ දීර්ඝායුෂයි, වර්ණවත් ය. සැප බහුල යැයි අසන ලද වෙයි. මහණෙනි ඒ බ්‍රහ්මයෝ දහසක් ලෝක ධාතුවෙහි ආලෝකයද සිතද, දිවැසද පතුරුවා දස දහසක් ලෝකද, එහි වසන සත්වයන්ගේ සිත් ද දැනගෙන වසයි. අනේ මමත් මේ බ්‍රහ්ම ලෝකයෙහි උපදින්න ඕනෑ යැයි සිතයි. සිත ඒ සඳහා යොමු කරයි. එම අදහසෙහිම පිහිටා සිටියි. ඒ සඳහා භාවනා වශයෙන් සිත වඩයි. වඩන ලද ඔහුගේ භාවනා සිතද සද්ධාදී පඤ්ච ධර්මයෝ ද, එහි උපත පිණිස පවතී. මහණෙනි, මේ භාවනා මාර්ගය සද්ධාදී ප්‍රතිපදාව එම බ්‍රහ්ම ලෝකයෙහි උපතට හේතු වේ.

සමාන කරුණු බැවින් ඉදිරියට සූත්‍ර දේශනාව කෙටි කර දක්වමි. තවද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව සද්ධාවෙන්, ශීලයෙන්, දහම් දැනුමෙන්, පරිත්‍යාගෙන්, ප්‍රඥාවෙන් යුක්ත වේ. දෙදාහක් ලෝක

ධාතුවෙහි ....., තුන්දාහක් ලෝක ධාතුවෙහි ...., හාරදාහක් ලෝක ධාතුවෙහි ...., පන් දාහක් ලෝක ධාතුවෙහි..., දස දාහක් ලෝක ධාතුවෙහි...., ලක්‍ෂයක් ලෝක ධාතුවෙහි ආලෝකය, දිවැස පතුරුවා එහි වසන සත්වයන් දැකීමට සිත පැතිරිය හැකි දීර්ඝායුෂය ඇති, වර්ණවත්, සැප බහුල බ්‍රහ්මයෝ ඇතැයි අසන්න ලැබේ. මරණින් පසු මමත් එම බ්‍රහ්ම ලෝකයක උපදින්නෙමි යැයි පැතුම් ඇතිව, ඒ සඳහා සිත් යොමු කර, අදිටන් කර, භාවනා වශයෙන් සිත දියුණු කරයි. ඔහුගේ නැවත නැවත වඩන ලද, බොහෝ සෙයින් වඩන ලද, ඒ සිතද සද්ධාදී පඤ්ච ධර්මයෝ ද, එහි උපත පිණිස පවතී. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව එහි උපත පිණිස හේතු වේ.

තවද මහණෙනි, මේ ශාසනයෙහි භික්‍ෂුව සද්ධා, ශීල, සුත, ත්‍යාග, ප්‍රඥාවෙන් යුතු වේ. පරිත්තාභා, අප්පමාණාභා, ආභස්සරා, පරිත්ත සුභා, අප්පමාණ සුභා, සුභකිණ්න, වේහප්ඵලා, අවිහා, අතප්පා, සුදස්සා, සුදස්සී, අකනිට්ඨා බ්‍රහ්ම දෙවියන් අතර උපදිම්වා යැයි අදිටන් කරගෙන, ඒ සඳහා සිත් යොමු කර, නැවත නැවත වඩන ලද, බොහෝ සෙයින් වඩන ලද, ඔහුගේ එම සිතද සද්ධාදී පඤ්ච ධර්මයෝ ද, එහි උපත පිණිස පවතී. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව එහි උපත පිණිස හේතු වේ.

තවද මහණෙනි, මේ ශාසනයෙහි භික්‍ෂුව සද්ධා, ශීල, සුත, ත්‍යාග, ප්‍රඥාවන්ගෙන් යුක්ත වේ. ආකාසානඤ්චායතනයට ගිය, විඤ්ඤාණඤ්චායතනයට ගිය, ආකිඤ්චඤ්ඤායතනයට ගිය නේවසඤ්ඤා නාසඤ්ඤායතනයට ගිය බ්‍රහ්ම දෙවියෝ දීර්ඝායුෂය ඇති, බොහෝ කල් සිටින, සැප බහුලව වාසය කෙරේ යැයි අසන්න ලැබේ. මමත් මරණින් පසු එහි උපදිම්වා යැයි සිත් ඇති වේ. පැතුම් සහිත ඒ සිත තබාගෙන, අදිටන් කරගෙන, ඒ සඳහා සිත දියුණු කෙරේ.

භාවනා වශයෙන් නැවත නැවත වඩන ලද, බොහෝ සෙයින් වඩන ලද, ඔහුගේ එම සිතද සද්ධාදී පඤ්ච ධර්මයෝ ද, එහි උපත පිණිස පවතී. මහණෙනි, මේ වඩන ලද සිතද, සද්ධාදී ප්‍රතිපත්තියද එහි උපතට හේතු වේ.

තවද මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව සද්ධා, ශීල, සුත, ත්‍යාග, ප්‍රඥාවන්ගෙන් යුක්ත වේ. **''අහොවතාහං ආසවානං ඛයා අනාසවං චෙතො විමුත්තිං පඤ්ඤා විමුත්තිං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යං ''** අනේ මම ආශ්‍රව ධර්ම නැති කර, අනාශ්‍රව කෙනෙක් ව තමාම මනා නුවණින් දැනගෙන ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ කරගෙන නිකෙළෙස් වූ ලොකුත්තර තත්වයට පැමිණ වාසය කරන්නේ නම් හොඳ යැයි අදහස් වෙයි. හෙතෙම එසේ ම ආශ්‍රව ධර්ම නැති කර ලෝකුත්තර වූ රහත් බව ලබා වාසය කෙරේ. **අයං භික්ඛවෙ, භික්ඛු න කත්ථචි උප්පජ්ජති න කුහිඤ්චි උප්පජ්ජති** මහණෙනි, මේ භික්ෂුව කොහේවත් කොතැනවත් නොඋපදී.

**සූත්‍ර නිගමනය**

අපුඤ්ඤාභි සඞ්ඛාර, පුඤ්ඤාභි සඞ්ඛාර, ආනෙඤ්ජාභි සඞ්ඛාර යනුවෙන් සංඛාර තුන් කොටසකි. එයින් ''අපුඤ්ඤාභි සඞ්ඛාර'' කර්ම බවට පත්වෙන අකුසල චේතනා සහිත සිත් අපුඤ්ඤාභි සඞ්ඛාර වේ. කර්ම බවට පත්වෙන කුසල චේතනා සහිත කාමාවචර, රූපාවචර කුසල් සිත් පුඤ්ඤාභි සඞ්ඛාර වේ. කුසල චේතනා සහිත අරූපාවචර චේතනා ආනෙඤ්ජාභි සඞ්ඛාරයි.

මේ දේශනාවෙන් අපුඤ්ඤාභි සඞ්ඛාර අත හැර දේශනා කර ඇති බව උප්පත්ති ස්ථාන දැක්වීමෙන් ම පැහැදිලි වේ. සංඛාර නම් වූ

කර්මයන්ට අනුව උපදින්නේ සම්මුති වශයෙන් සත්වයන් වුවත් පරමාර්ථ වශයෙන් උපදින්නේ නාම රූපයි. එම නාම, රූප කර්ම නමැති සංඛාර හේතුවෙන් උපදින බැවින් සඞ්ඛාරුපපත්ති යැයි සූත්‍රයට නම් තබා ඇත.

අකුසල කර්මත් සංඛාර වුවත් මෙම දේශනාවට ඒවා ඇතුළත් නොවූයේ ඇයි? මෙම දේශනාවෙන් ප්‍රාර්ථනා පිහිටුවා උප්පත්තිය හා අනුප්පත්ති නිවන ලබා ගන්නා ක්‍රමය වදාළ දේශනයකි. අපුඤ්ඤාභි සඞ්ඛාර වූ අකුසල කර්මයෙන් උපදිනුයේ සතර අපායෙහි ය. අපායෙහි ඉපදීමට ප්‍රාර්ථනා කරන කෙනෙක් නැත. කලාතුරකින් දැඩි වෛරය නිසා එසේ පතන අය ඇත. එයද මෝහයෙන් මුලා වී කරන පැතුම් ය. සුගති භූමි විසි හතට වඩා සතර අපායෙහි උපදින සත්වයෝ අධික යි. තණ්හාවෙහි ස්වභාවය තත්‍ර තත්‍රාභිනන්දිනී සතර අපායෙහි උපන්නත්, උපන් පසු එම ජීවිතයට බැඳීම වුවත්, අපායෙහි ඉපදීමට පතන කෙනෙක් නැත. සුගති උපත කර්මානුරූපව සිදු වුවත් එහි උපදීමට පතන අය අප්‍රමාණ ය. සසරට බියව සංසාර විමුක්තිය බලාපොරොත්තුවන සැවොම සසරින් මිදෙන තුරු සුගතිය ම පතනු ලැබේ. එහෙයින් සතර අපායෝත්පත්තියත්, අකුසල සංඛාරත් හැර ප්‍රාර්ථනා සහිත කුසල කර්ම සංඛාරයන්ගෙන් සිදුවන උප්පත්තිය ස්ථාන පිළිබඳව සියල්ල දන්නා වූ, දක්නා වූ තථාගත බුදු රජාණන් වහන්සේ වදාළ සේක.

**''ඉධ භික්ඛු ති''** යන පදයෙන් බුද්ධ ශ්‍රාවකයාම හැඳින්වෙන බැවින් අන්‍ය තීර්ථකයන් පතන අසඤ්ඤ සත්ව රූපාවචර බ්‍රහ්ම ලෝකයද අතහැර ඇත. කර්මානුරූපව අකුසල කර්මයෙන් සතර අපායෙහි උපදිනවා වාගේ ම දුර්වල කුසල කර්මයෙන් පෙර පසු අකුසල චිත්තයන්ගේ උපනිශ්‍රය ප්‍රත්‍ය ලැබ සුගතියක් වන මිනිස් ලොව

අංගවිකලව, මන්ද බුද්ධිකව, දුර්වර්ණව, පහත් කුලවල, දුර්භාග්‍යව උපදින අතර එවැනි තත්වයක් කිසිවෙක් නොපතන බැවින් හා නොපැතිය යුතු බැවින් එම තත්වය ද මෙම දේශනාවට ඇතුළත් නැත.

යමෙක් දානයත් ශීලයත් යන්තං ටිකක් කළොත් ඒ අය මනුෂ්‍ය ලෝකයේ උපන්නත් දුර්භාග්‍ය ජීවිත ලබන බව ද, දාන ශීල දෙක මධ්‍යම ප්‍රමාණයට කළොත් මනුෂ්‍ය ලෝකයේ සෞභාග්‍ය ජීවිත ලබන අතර, දාන ශීල දෙක බොහෝ සේ කළොත් දිව්‍ය ලෝක සයේ උපදින බව තථාගත දේශනාවයි. දැන ගනු කැමතියන් විසින් අංගුත්තර නිකායෙහි නවක නිපාතයේ පුඤ්ඤකිරිය වත්ථු සූත්‍රය බැලිය යුතු ය.

සංඛාරුපපත්ති සූත්‍රයෙහි ඇති සද්ධා දී අංග පහෙන් ශීල හා ත්‍යාග යන අංග දෙක පුඤ්ඤකිරිය වත්ථු සූත්‍රයෙහි දාන, ශීල දෙකට ඇතුළත් වන අතර, සද්ධා, සුත, පඤ්ඤා යන අංග තුනදාන ශීල දෙකට ආධාර වේ. මනුෂ්‍ය ලෝකයේ බොහෝ කල් ජීවත් නොවීමත්, ආයු ප්‍රමාණය අස්ථිර නිසාත්, **දීඝායුකා** වචනයත්, ඇතැම් අය වර්ණවත්, ඇතැම් අය දුර්වර්ණ වන නිසා **වණ්ණවන්තා** වචනයත්, සැප දුක් මිශ්‍රව ඇති නිසා **සුඛ බහුලා** වචනයන් නැතුව සද්ධා, ශීල, සුත, චාග, පඤ්ඤා යන පඤ්ච ධර්ම සහිත කුසල කර්මයෙන් උසස් කුලවල උපදින බැවින් **ඛත්තිය බ්‍රාහමණ ගහපති මහාසාර** තත්වය පමණක් මිනිස් ලොව සම්බන්ධව දේශනා කර ඇත. දිව්‍ය බ්‍රහ්ම ලෝකවල ආයු ප්‍රමාණය වැඩි නිසා දෙවියන් සෑම දෙනාම වර්ණවත් නිසාත්, වර්ණවත් බව රූප කය නිසාම පැවතීම හා සැප අධික නිසා **දීඝායුකා වණ්ණවන්තා සුඛ බහුලා** වශයෙන් දිව්‍ය ලෝක සහ රූපාවචර බ්‍රහ්ම ලෝක පිළිබඳව දේශනා කළ අතර, අරූපාවචර බ්‍රහ්ම ලෝක සතරෙහි රූප කය නැති බැවින් **වණ්ණ වන්තා** වචනය නැතුව අනෙක් සියලු තැන්වලට වඩා ආයුෂ වැඩි බැවින් **චිරට්ඨිතිකා** යනුවෙන් දේශනා කර ඇත.

එවැනි ආයුෂ කාලයක් ගත කළත් බුදු සසුනෙන් පිට අරූපාවචර ධ්‍යාන ලාභීහු ඒ දීර්ඝායුෂ ගෙවීමෙන් පසු අපාගත වීමේ හැකියාව ඇති බවත් ආර්ය ශ්‍රාවකයෝ එහිදීම පිරිනිවන් පානා බව අංගුත්තර නිකායෙහි සූත්‍ර දේශනාවක ඇත.

මනුෂ්‍ය ලෝකයේ උසස් කුලවලත්, දිව්‍ය ලෝක සයෙහිත් රූප, අරූප භවයන්හි ඉපදීමට ප්‍රාර්ථනා සහිත එයට අනුරූප කාමාවචර, රූපාවචර, අරූපාවචර කුසල් කිරීම හේතු කරගෙන හැකියාව ඇති බව මෙම සංඛාරුපපතති සූත්‍ර දේශනාවෙන් පෙන්වා දී ඇත. ප්‍රාර්ථනා කළත් සද්ධා, ශීල, සුත, චාග පඤ්ඤා සහිත කුසල කර්ම නොකළොත් එහි උපත සිදු නොවේමය. අවසාන දේශනා පාඨයේ හැටියට මේ ජීවිතයේ දීම ආශ්‍රව නැති කර, නිවන් අවබෝධයට ද ප්‍රාර්ථනාව නම් තිබිය යුතුමයි.

**''තසස එවං හොති අහො වතාහං ආසවානං ඛයා අනාසවං චෙතො විමුත්තිං පඤ්ඤ විමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤ සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යං''** යන දේශනා පාඨයෙන් ප්‍රකාශ වේ. **''විහරෙය්‍යං''** යන ක්‍රියා පදයෙන් කියවෙන්නේ වාසය කෙරෙම්වා හෝ වාසය කරන්නේ නම් ඉතා හොඳයි යන තේරුමයි. **''තසස එවං හොති''** ඔහුට මෙසේ සිත් වේ. අදහස් වේ. යන්නෙන් ද එය තහවුරු වේ. නිවන් අවබෝධය ද ප්‍රාර්ථනා කළ පමණින් ම සිදු නොවේ. එම ප්‍රාර්ථනාවට අනුරූප ප්‍රතිපදාව පිරිය යුතුය. එම ප්‍රතිපදාව සම්පූර්ණ වී තිබීමට භික්ෂුව සද්ධා, ශීල, සුත, චාග, ප්‍රඥා යන ධර්ම පහෙන් යුක්ත වේ යන දේශනා පාඨයෙන් තහවුරු වේ. මෙය නිවන් දැකීමේ ප්‍රාර්ථනාව, නිවන් දැකීමේ අදහස, නිවන් දැකීමේ කැමැත්ත කීවත් නිවැරදියි. සමාන තේරුම් වේ. සඳ හිරු එළිය ලැබුණත් මෝරා නැති නම් මල් නොපිපෙනවා මෙන් නිවන් දැකීමේ කැමැත්ත අදහස පැතුම

තිබුණත් ප්‍රතිපදාව සම්පූර්ණ නැති නම් නිවන් අවබෝධ නොවේ.

**පාරමී**

**"පර හා පාර"** යන වචනවල තේරුම එහා පැත්ත, එතෙර යන්නයි. පර තෙර නම් එහා තීරය යි. පර ලොව නම් එහා ලොවයි. **"පාර ගඞගායං"** යනු ගඟෙන් එහා යන්නයි. සක්කාය නම් වූ සංසාරය මෙතෙර යි. නිවන එතෙරයි. එතෙර වූ නිවන සඳහා උපකාර වෙන කුසල ධර්ම සමූහය පාරමී හෙවත් පාරමිතා යි. ප්‍රාර්ථනාවෙන් තොරව පාරමී නොපුරා මාර්ගඵල නිවන් අවබෝධ වේ නම් එසේ කියන ගිහි පැවිදි සියල්ලෝ ම මේ වනවිට රහත් වී සිටිය යුතු යි. එසේ නොවේ නම් එවැනි අය දෙසනවා විනා පිළිවෙත් පුරන්නෝ නොවිය හැකි ය. එතගග පාලි, අපදන පාලි, ථෙර ථේරී ගාථා, පාලි ජාතක පාලිවල දැක්වෙන පරිදි සියලුම දෙනා රහත් බව ලබා ඇත්තේ පෙර බුදු සසුන්වල නිවන් පතා පාරමී පිරීමෙන් අනතුරුවයි.

**පැතුම අනුව උපත**

උඩට දමන ලද ලීයක් මුලින් හෝ අගින් හෝ මැදින් හෝ බිම පතිත වේ. මුල පළමුව බිම වදී කියා හෝ අගින් පළමුව බිම වදී කියා හෝ පළමුව මැද බිම වදී කියා හෝ ස්ථිරව කිව නොහැක. එමෙන් ම මරණින් පසු නිරයට යාවි ද, ප්‍රේත ලෝකයට යාවි ද, තිරිසන් ලෝකයට යාවි ද, මිනිස් ලොවට ඒවි ද, දෙව් ලොවට යාවි දැයි පෘතග්ජන සත්වයාගේ උපත අස්ථිර ය.

නමුත් ලීයේ ඊයම් ආදී බර දෙයක් එක් පැත්තක ගැට ගසා උඩ දැමුවොත් බර පැත්ත පළමුව බිම පතිත වන්නාක් මෙන් යම්

කෙනෙකුගේ සද්ධා දී පඤ්ච ධර්ම වැඩී ඇති නම් ප්‍රාර්ථනාවද ඇත්නම් ඒ අනුව උපත සිදුවේ. සිල්වත් සාමණේර හිමි නම අපවත් වෙන්න පෙර, පැතූ පරිදි සිත පිහිටවූ පරිදිම විහාර මහා දේවියගේ කුසෙහි පිළිසිඳ ගත්තා මෙනි. පෘතග්ජන යමෙකුගේ  සද්ධාදී පඤ්ච ධර්ම ඇතත් පැතුමක් නැත්නම් මතු උපත අස්ථිර ය. පැතුම ඇතත් සද්ධාව, ශීලය, දහම් දැනුම, පරිත්‍යාගය, ප්‍රඥාව  නැති නම් ඔහුගේ ද මතු උපත අස්ථිර යි.

සෝතාපන්න, සකෘදාගාමී, අනාගාමී ආර්ය උතුමන්ගේ අපායගාමී අකුසල කර්ම නැති බැවින් උත්පත්තිය ස්ථිර ය. සුගතියේ ම උපදී. අරහත් උතුමෝ කොතැනකවත් නොඋපදී. එබැවින් මාර්ගඵල නොලැබූ අය සද්ධාදී ගුණ පුරමින් නැවත නැවත කුසල් කර, කැමති යම් භවයක ඉපදීමට සිත පිහිටුවා ප්‍රාර්ථනා කළ යුතු බව සංඛාරුපපත්ති සූත්‍ර අට්ඨ කථාවෙහි පෙන්වා ඇත.

**''ඉජ්ඣති භික්ඛවෙ සීලවතො චෙතො පණිධි විසුද්ධත්තා තඤ්ච ඛො සීලවතො වදාමි, නො තථා දුස්සීලස්ස ''** මහණෙනි, පිරිසිදුකම නිසා සිල්වතාගේ සිතේ ප්‍රාර්ථනාවන් සිදු වේ. එය ද සිල්වතාට මිස දුශ්ශීලයාට නොවේ.

**බඹලොව යාමට පැතූ බමුණා**

දඹදිව තුදී ගමේ ධනවත් තෝදෙය්‍ය බමුණා බඹලොව යාමට පැතූ කෙනෙකි. සියලුම බ්‍රහ්ම භක්තිකයෝ බඹලොව යාමට පතති. නමුත් ඔවුන් තුළ සද්ධා දී පඤ්ච ධර්මයන් වැඩී නැත. බඹ ලොව උපතට හේතු වන ධ්‍යාන භාවනා වැඩීමක් නැත. ඒ නිසා පැතූ පමණින් බඹලොව යාම සිදු නොවන නිසා තද මසුරු ගති ඇති තෝදෙය්‍ය බමුණා බඹලොව යාම වෙනුවට ඔහුගේ සිත තුළ සද්ධා, ශීල, සුත චාග

පඤ්ඤා වෙනුවට වැඩුණේ, දියුණු කරන ලද්දේ ලෝභය, මාන්නය, මිත්‍යා දිට්ඨිය මෝහය හා මසුරුකමයි. එබැවින් මරණින් පසු උපන්නේ බලු පැටියෙක් ව තිරිසන් භවයෙහි ය. **''මානෙන මක්කටො හොති අති මානෙන කුක්කුරො''** මාන්නය නිසා වඳුරන්ව උපදී. දැඩි මාන්න නිසා බලුව උපදී.

**පැතුම් සපිරුණ සුමනා කුමරිය**

අතීතයේ විපස්සී බුදු රජාණන් වහන්සේගේ පියා වන බංදුම රජතුමා කිසිවෙකුට ඉඩ නොදී බුදු රජාණන් වහන්සේට උපස්ථාන කළේ ය. මේ සම්බන්ධව මහජන විරෝධයකින් පසුව අනෙක් අයටත් දන් දීමේ අවස්ථාව උදා විය. මේ සඳහා සේනාපතිතුමා මුල් වූ බැවින් පළමු දින දානය ඔහුගේ නිවසින් දීමට නියම විය. දානය දින අතරමඟදී කිසිවෙකුට කිසිවක් පූජා කරන්න ඉඩක් නොදී ආරක්‍ෂකයන් යොදා ශ්‍රාවක සඟ පිරිස සමඟ බුදු රජාණන් වහන්සේ වඩමවන ලදි.

මේ අතර සුමනා නම් සිටු කුමරියක් දිය නුමුසු කිරි බතක් උයා රන් පාත්‍රයකට බෙදා රන් පියනකින් වසා සමන් පිච්ච මල් වැලවලින් වෙලා මල් බෝලයක් ලෙස ගෙන ගොස් ආරක්‍ෂකයන් මුලා කර, මල් බෝලයක් ලෙස බුදු රජාණන් වහන්සේට පූජා කළා ය. ප්‍රාර්ථනාවක් ද කළා ය. නිවන් දකින තුරු දුක්ඛිත ජීවිතයක් නොලබම්වා. උපනූපන් තැන සුමනා නාමය ලබම්වා. සමන් මල් මෙන් සැමට ප්‍රිය වෙම්වා යනුවෙනි. එදා සෙන්පති නිවසේදී අතරමඟදී ලැබුණ ප්‍රණීත කිරිබත බුදු රජාණන් වහන්සේ ඇතුළු ශ්‍රාවක ස්වාමීන් වහන්සේලාට පළමුවෙන් ම බෙදන ලදි. මේ බව දැනගත් සෙන්පතිතුමා දානය නිමවා ආරක්‍ෂකයන්ගෙන් කරුණු විමසා මෙවැනි උපායශීලී තැනැත්තියක් යම් නිවසක සිටියොත් අභිවෘද්ධියක් ම වෙන බව දැන ඇය ආවාහ

කර ගන්නා ලදි. පසුව සෙන්පතිතුමා සමඟ එක්ව එම ජීවිතයේ දී තවත් බොහෝ කුසල් කර දෙව් ලොව උපන්නා ය. උපන් දින ඇයගේ දිව්‍ය විමානය පුරා සමන් මල් වැස්සක් වැස්සේ ය. තමාගේ නමත් අරගෙන ආවා යැයි ඇයට සුමනා යයි නම තබන ලදි. කල්ප අනූ එකක් දිව්‍ය ලෝක සයෙහි සැරිසරා අපගේ බුදු රජාණන් වහන්සේගේ කාලයෙහි කෝසල දේශාධිපති මහ රජුට දුවක් වී උපන්නා ය.

පැතුම් පරිදි සුමනා නාමයම එහිදී ද ලැබිණ. සුදත්ත සිටුතුමා ජේතවන විහාරය පූජා කළ දිනයේ ඔහුගේ ඇරයුමින් එක දවසේ උපන් දැරියන් පන්සියයක් සමඟ සුදු ඇඳුමින් සැර සී මල් අතැතිව බුදු රජාණන් වහන්සේ පිළිගැනීමට ගොස් ධර්මය අසා සත් හැවිරිදි වියේදීම සෝතාපන්න ආර්ය ශ්‍රාවිකාවක් වූවා ය.

ඇයට සද්ධාව නොඅඩුව තිබුණි. සුත සම්පත්තිය වූ දහම් දැනුම තිබුණි. උසස් ආචාර ධර්ම සහිත ශීලය ද තිබුණි. නොමසුරු පරිත්‍යාග ගුණයද තිබූ බැවින් රන් බඳුන සමඟ කිරි බත් පුදන ලදි. ආරක්ෂකයන් මුලා කොට, මල්වලින් වසා මල් බෝලයක් ලෙස ගෙන ගොස් දානය පිදීමට උපායශීලී ප්‍රඥාව ද තිබිණි. මේ පඤ්ච ධර්මයෙන් යුතුව සොම්නස් සහගතව ඤාණසම්ප්‍රයුක්ත අසංඛාරික සිතින් දුර්ලභ වූ වටිනා පින්කමක් කර, ප්‍රාර්ථනා තුනක් ද කළා ය. ඇයගේ එම පුඤ්ඤදහි සංඛාර දෙව්ලොව ද මිනිස් ලොව රජ කුලයේ උපතට හා ළමා වියේ දීම නිවන් අවබෝධයටත් හේතු විය.

**දීම සහ නොදීමෙහි වෙනස**

කාශ්‍යප සම්මා සම්බුද්ධ සාසනයෙහි යහලුවන් දෙදෙනෙක් පැවිදි වූහ. දෙදෙනාම මාර්ගඵල නිවන් නොලබා ම අපවත් වී දෙව්

ලොව උපන්හ. එකට විසූහ. එයින් එක වර, එක දින, එකම තැන මිනිස් ලොව උපන්හ. දෙදෙනාම සද්ධාවෙන් සමාන යි. එක් ව මහණ දම් පිරූහ. එක් නමක් තමන්ට ලැබුණ දෙයින් අනෙක් ස්වාමීන් වහන්සේලාට බෙදා දීම් වශයෙන් ත්‍යාගවන්ත වූහ. එක් නමක් තමාගේ යැපෙන පමණට පිළිගත් බැවින් දීමට දෙයක් නැති බැවින් බෙදා දීම් නොකරන ලදි. ඒ නිසා බෙදාදීම් වශයෙන් දන් දුන් කෙනා සම්පත්වලින් පිරි රජ කුලයෙහි උපන් අතර, බෙදා දීම් වශයෙන් පරිත්‍යාග නොකළ කෙනා එම රජ ගෙදරම සම්පත් නැති දාස දරුවෙකුව උපන්නේ ය. දෙදෙනාම මහණදම් පිරුවේ නිවන් දකින්නයි. නිවන් දැක්කා නම් දෙදෙනාම සමානයි. සංසාර විමුක්තියේ වෙනසක් නැත. නිවන් දැකීමට පාරමී අවශ්‍ය නැති නම් උන් වහන්සේලා එම ජීවිතයේ නිවන් දැකිය යුතු යි. නිවන් නොදැක්කේ ප්‍රතිපත්තියේ නොයෙදීමෙන් නම් අපවත් වී ඉපදිය යුත්තේ දුගතියේ ය. එසේ නොවී සුගතියෙහි උපන්නේ සද්ධා ශීලාදී ධර්ම පහ ම තිබු කෙනා රජ කුලේ උපන් අතර, ත්‍යාග ගුණය නැතිව ඉතිරි ධර්ම තිබූ කෙනා දාස දරුව ඉපදීම ඉහතින් දැක් වූ අංගුත්තර නිකායෙහි පුඤ්ඤකිරිය වස්තු සූත්‍රයටද හොඳින් ගැලපේ. ළමා මනසකින් යුතු සුමනා කුමරිය සත් හැවිරිදි වියේහි නිවන් අවබෝධ කළේ ප්‍රාර්ථනා සහිත ප්‍රතිපත්තිමය පින් බලය තිබූ බැවිනි.

## ගාමිනී අභය රජුගේ උපත

අතීතයේ රුහුණු පෙදෙසෙහි විහාරස්ථානයක වැඩ සිටි සාමණේර නමක් ගලක් මත දාගැබක් සාදන විට විශාල ගල් පුවරු ගෙන යාම නිසා ගිලන්ව තිස්ස මහාරාම විහාරයට කැඳවාගෙන විත් අපවත් වීමට ආසන්නව සිටියේ ය. ඒ වන විට දරුවන් නැතිව සිටි විහාර මහ දේවිය උන් වහන්සේ වෙත ගොස් තමන්ට දරුවෙක් වීමට ආරාධනා කළා ය. උන් වහන්සේ කැමති නොවී ය. දේවිය මාළිගයට ගොස් බොහෝ පිරිකර ගෙනැවිත් උන් වහන්සේ උදෙසා සංඝයා

වහන්සේට පූජා කර නැවතත් ඉල්ලුවා ය. තමන්ට දරුව උපන්නොත් සතුරන්ට යටත්ව ඇති අපේ රටත් බේරාගෙන බුදු සසුනත් බබුළුවන්නට හැකි බව දැන් වූ විට උන් වහන්සෙත් ඒ ගැන සිත් යොමු කරමින්, මම තවම පෘතග්ජන කෙනෙක් බැවින් මතු උපත අනියතයි. කොහේ උපදී දැයි නොදනිමි. මැයට දරුව උපන්නොත් පසුව රජ වී බුදු සසුනත්, රටත්, ජාතියත් බේරා ගත හැකි යැයි ආරාධනාව පිළිගෙන ඇයට ප්‍රතිඥා දී ඒ සඳහා සිත පිහිටුවන ලදි. එතුමියට දරුව උපදින්න ප්‍රාර්ථනාව තබාගති. උන් වහන්සේ ශීලය හොඳින් රැක තිබුණි. සද්ධාව, දහම් දැනුම, ත්‍යාග ගුණය මෙන් ම ප්‍රඥාවද නොඅඩුව තිබූ බැවින් එදිනම අපවත් ව විහාර මහා දේවියගේ කුස තුළ පිළිසිඳ ගන්නා ලදි. එදා මේ දෙය සිදු නොවුණා නම් අපට අද නිදහස් රටක්වත්, නිර්මල බුද්ධ සාසනයක්වත් ඉතිරිවන්නේ නැත.

**පරිබ්බ්‍රාජිකාවකගේ පැතුම**

රම්‍යගම් නුවරට වඩින දීපංකර බුදු රජාණන් වහන්සේට සුමේධ තාපසතුමා අඳුන් දිවිසම මඩ මත එලා ඒ මත වැතිරී තම පිට උඩින් වඩින ලෙස ආරාධනා කර, උතුම් බුද්ධ උපස්ථානමය පූජාවක් කළ වේලාවේ, එතුමා පිළිබඳව අනාගතය විමසා බලා මේ උග්‍ර තේජස් ඇති තාපසතුමා අනාගතේ ගෝතම නමින් බුදු වෙන බවත්, එම ජීවිතයේ ගිහි කල යශෝධරා නමැත්තියක් බිරිඳ වන බවත්, රාහුල නම් පුතෙක් ලබන බව ආදී සියලු විස්තර සහිතව වදාරා, විවරණ දුන් වේලාවේ එතනට පැමිණ, එය අසා සිටි පරිබ්‍රාජිකාවක් තාපසතුමා උදෙසා මල් මිටි පහකුත්, තමා වෙනුවෙන් මල් මිටි තුනක් පුජා කර, තැබූ ප්‍රාර්ථනාව අනුව සසර ගමනේ එකටම පාරමී පුරමින් පැමිණ එකම දින ඉපදී, එක බුදු සසුනේ එකටම නිවන් දැක සසරින් මිදුනා ය. මෙහි මුළින් දක්වන ලද ආනන්ද ස්වාමීන් වහන්සේ ද එකම දවසේ

බෝධිසත්වයන් වහන්සේ සමඟ උපන් කෙනෙකි.

බෝසත් නමට මල් මිටි පහකුත් පිදුවා
තමන් නමට මල් මිටි තුනකුත් පිදුවා
බුදුවෙන තෙක් ම මෙතුමා අනුවම යෙම්වා
බුදුවෙන ජීවිතෙන් අග මෙහෙසිය වෙම්වා

රාහුල පුතා කුසයෙන් බිහි කරනෙම්මා
රාහුල කුමරුවන් හට අම්මා වෙම්වා
යසෝදරා තෙරණිය නම් මම වෙම්වා
යනුවෙන් එදා බුදු හිම ළඟ ඇය පැතුවා

**අන්නභාර දුගියාගේ පැතුම**

ඉතා දුක සේ දිවි ගෙවන දිළිඳු මිනිසෙකි. ඔහු දිනක් පිඬු සිඟා වඩින උපරිට්ඨ පසේ බුදු රජාණන් වහන්සේ දැක තමන් නිරාහාරව සිට තම ආහාර කොටස පූජා කර, මේ පිනෙන් උපන් උපන් තැන්වල දුක්ඛිත ජීවිතයක් නොලබම්වා. නැත යන වචනයක් අසන්න නොලැබේවා යැයි ප්‍රාර්ථනා කළේ ය. ඔහුගේ දානයට දෙවියන් සාධුකාර දුනි. පින් අනුමෝදම්ව, රන් කහවනු දෙදාහක් රජුගෙන් සහ සිටුවරයාගෙන් ලැබී ය. පරණ සිටු මැදුරක් තිබූ තැන නිවසක් ඉදි කිරීමට බිම සකසන විට නිධානයක් ද ලැබී පසුව සිටු තනතුරක් ලබා තව තවත් පින්කර දෙව් ලොව උපත ලැබී ය. පදුමුත්තර බුදු සසුනේ සහ කාශ්‍යප බුද්ධ සාසනයෙහි ආලෝක පූජා පවත්වා දිවැස ප්‍රාර්ථනා කර, සුගතිගාමීව පැමිණ, අවසන අප බුදු රජාණන් වහන්සේට ඥාති සහෝදරව ඉපිද නැත යන වචනයවත් නොඅසා මහා සම්පත් විඳ සසුන්ගතව රහත් බව ලැබ, දිවැස් ඇති රහතන් වහන්සේලා අතර අග්‍ර වූ සේක.

## පදුමාවතිගේ ප්‍රර්ථනාව

පදුමුත්තර බුදු රජාණන් වහන්සෙගේ ශාසනයෙහි දින හතක් දන් පුද, අග තනතුරක් පැතූ පින්වතියක් සසර ගෙවාගෙන එන ගමනේ දී කාශ්‍යප බුදු රජාණන් වහන්සේගේ කාලයෙහි කිකී රජතුමාට දුවෙක් ව ඉපිදී, පැවිදිවීමට අවසර නොලැබූ බැවින්, දිවි ඇති තෙක් බ්‍රහ්මචාරීව වසා, මරණින් පසු දෙව් ලොව ඉපිද, දෙව් සැප විඳ, නැවත මිනිස් ලොව ඉපදී, කුඹුරක් රකිමින් ඉන්නා විට, වැඩියා වූ පසේ බුදු රජාණන් වහන්සේ නමකට නෙළුම් මලක් සහ විලඳ පන්සියක් පූජා කර, මේ විලඳ ප්‍රමාණයට දරුවන් ලැබේවා. තබන පියවරක් පාසා නෙළුම් මල් පිපේවා යැයි ප්‍රාර්ථනා කළා ය.

එම ජීවිතයෙන් පසු දෙව් ලොව උපන් අතර, තබන පියවරක් පාසා නෙලුම් මල් පිපුණෝ ය. දෙව් ලොවින් චුත ව හිමාල පෙදෙසෙහි විලක නෙළුම් මල් මත ඕපපාතිකව ඉපදී, පසුව තාපස කෙනෙක් දුවක් වශයන් හදාගෙන වැඩි වියට පත් ව, රටේ රජතුමාගේ අග මෙහෙසිය බවට ද පත් වූවා ය. පැතූ පරිදි මහා පිං ඇති දරුවන් පන්සියයක් ලැබූ අතර, ඒ සෑම දෙනා පසේ බුද්ධත්වයට පත් වූ සේක.

## පේසකාර මවගේ පැතුම

අතීතයේ දහසක් පමණ පසේ බුදු රජාණන් වහන්සේලා වැසි කාලය ලං වන විට කුටි සාදවා ගැනීමට රටේ රජතුමාගේ අනුග්‍රහය බලාපොරොත්තු වූ නමුත්, එම කාර්ය ඉටු නොවූ අතර, ඒ බව දැනගත් සැදැහැති මවක් ආරාධනා කර, ගම් වාසීන් සමඟ කුටි සාදා දී වස් කාලයෙහි උපස්ථාන කළෝ ය. ඒ සැම දෙනා මරණින් පසු දෙව්ලොව ඉපදී එක්ව වාසය කළෝ ය.

කාශ්‍යප බුදු රජාණන් වහන්සේගේ කාලයෙහි මිනිස් ලොව ඉපදී, එකටම වාසය කළෝ ය. දිනක් බණ ඇසීමට විහාරයට ගොස් සිටි වේලාවේ වැස්සක් ඇති විය. ස්වාමීන් වහන්සේලා සමඟ ඥාති සම්බන්ධකම් ඇති අය උන් වහන්සේලාගේ කුටිවලට ගොස් වැස්සෙන් ආරක්ෂා වූහ. මේ පිරිසට ඥාති හිතවත්කම් නැති නිසා එළිමහනෙහිම සිට වැස්සට තෙමුණෝ ය. පසුව ප්‍රධාන මව්තුමිය අනෙක් අයට කරුණු අවබෝධ කරවා ශාලාවක් ඉදි කරවා, පූජා කරන ලදි. එම පූජාව දින සෑම දෙනාම චීවර පූජා කරන ලද අතර ප්‍රධාන මව්තුමිය අනෝජා මල් සමඟ වස්ත්‍රය ගෙනගොස්, බණ අසා, අනෝජා මල්වලින් බුදු රජාණන් වහන්සේට පූජා පවත්වා, චීවර වස්ත්‍රය පාමුල තබා පූජා කර, මෙතැන් පටන් අනෝජා නාමයද ලබම්වා යැයි විශේෂ පැතුමක් කළා ය.

මරණින් පසු නැවත දෙව්ලොව ඉපිදී, බොහෝ කල් දෙව් සැප විඳ, අපගේ බුදු රජාණන් වහන්සේගේ කාලයේ ප්‍රධාන යුවල රජ පවුල්වලත්, සෙසු පිරිස ඇමති පවුල්වලත් ඉපිද ප්‍රධානියා කප්පින නමින් රජ වූ අතර, ප්‍රධාන මව අග මෙහෙසිය වූවා ය. පෙර පැතුම් පරිදිම අනෝජා නාමයත්, අනෝජා මල් පැහැති ශරීරයත් ලැබුවා ය. පසුව තෙරුවන් ලොව පහළ වී ඇති බව වෙළඳුන්ගෙන් අසා දැනගෙන, රාජ්‍ය අතහැර, රජු ඇතුළු ඇමති පිරිසත්, දේවිය ඇතුළු ඔවුන්ගේ භාර්යාවරුන් බුදු රජාණන් වහන්සේ සොයා පැමිණ, පැවිදිව, පැතුම් පරිදි ලෞකික සැපත් විඳ, ලෝකෝත්තර නිවනට ද පත් වූහ. මොවුහු පෙර එකට පිං කළෝ ය. එකට සසරේ ආවෝ ය. එකට ම පැවිදි වූහ. එකට ම නිවන් දුටුවෝ ය.

**පැතුම් සපිරුණු මහා පුන්‍යවන්තයෝ**

අතීතයේ දුර්භික්ෂයක් ඇති වූ කළ එක් සිටු පවුලක ප්‍රධානියා විසින් දස, කම්කරුවන් අමතා, තම තමා කැමති තැන්වලට ගොස්, කැමති නම් සුභික්ෂ කාලයේ නැවත එන ලෙසත් අකමැති අය එහිම ඉන්නා ලෙස දැනුම් දී ඒ අය යැවූ අතර, එක් දාසයෙක් පමණක් නැවතුණි. සිටුතුමා, සිටු දේවිය, පුතා සහ ලේලිය යන පස්දෙනා පමණක් ඉතිරි වූහ. මේ පිරිස තිබූ දෙයින් කලක් යැපී, අන්තිම හාල් නැලියෙන් බත් පිස, ආහාර ගැනීමට සූදානම්ව සිටින අතර, එක් පසේ බුදු රජාණන් වහන්සේ නමක් දින හතක් ම නිරෝධ සමාපත්තියට සමවැදී සිට එම නිවසට වැඩි සේක. ඒ දුටු සිටුතුමා, මම පෙර පින් කර මදි නිසා මෙවැනි දුර්භික්ෂයකට මුහුණ දුන්නෙමි. නැවත මෙවැනි විපතකට මුහුණ නොදෙන්න පිනක් කළ යුතු යි. අද මේ ආහාර කොටස අනුභව කළොත් එක් දිනකට ජීවිතය රැකේ. පසේ බුදු රජාණන් වහන්සේට පූජා කළොත් දීර්ඝ කාලයක් හිත සුව පිණිස පවතී යැයි සිතා උන් වහන්සේ නිවසට වඩමවා, තමාගේ ආහාර කොටස පූජා කර, මට මේ පිනෙන් මෙවැනි දුර්භික්ෂ භයක් හමු නොවේවා. සියතින් වැඩ කර ජීවත්වෙන්න වීමක් නොවේවා. මුළු දඹදිව වැසියන්ට වී ලබා දීමට හැකි වේවා. එක් දහස් දෙසිය පණහක් වී කොටු ගෙවල් සුද්ධ කර, නා පිරිසිදු වී, එම වී කොටු ඉදිරියේ සිට අහස් බැලූ විට රත් හැල් වීවලින් පිරේවායි ද, මේ සිටු දේවියම බිරිය වේවා. මේ පුතාම පුතා වේවා. මේ ලේලියම ලේලිය වේවා. මේ දසයාම සේවකයා වේවා යැයි ප්‍රාර්ථනා කළේ ය.

සිටු දේවිය ද ස්වාමියා නිරාහාරව ඉන්නා විට මට ආහාර ගත නොහැකි යැයි තම ආහාර කොටස පූජා කළා ය. මතු මෙවන් දුර්භික්ෂක් හමු නොවේවා. බත් හැලියක් අතේ තබාගෙන මුළු දඹදිව්

වැසියන්ට බෙදා දුන්නත් මා හිඳගත් තැනින් නැගිටින තුරු ගන්නා ලද තැන බත්වලින් පිරේවා. මේ සැමියම සැමියා වේවා. මේ පුතාම පුතා වේවා. මේ ලේලියම ලේලිය වේවා. මේ දාසයාම දාසයා වේවා යැයි පැතුවා ය.

පුතාද තමාගේ බත් පූජා කර, මෙවැනි දුර්භික්ෂක් මතු නොම වේවා. දහසක් ඇති පසුම්බියක් අතේ තබගෙන මුළු දඹදිව් වැසියන් ට බෙදා දුන්නත්, පසුම්බිය අතේ තිබෙන තුරු එහි ධනය අවසන් නොවේ වා. මේ මව්පියන් ම මව්පියන් වේවා. මේ බිරිඳ ම බිරිඳ වේවා. මේ දාසයාම දාසයා වේවා යැයි පැතුවේ ය.

ලේලියද තම ආහාර කොටස පූජා කර මෙවැනි දුර්භික්ෂයක් මතු හමු නොවේවා. ධාන්‍ය මල්ලක් ගෙන දඹදිව් වාසීන්ටම දුන්නත් අවසන් නොවේවා යැයි පැතුවා ය.

දාසයාද තම ආහාර කොටස පූජා කර, සේනාපති තනතුර පැතුවා නම් එය ලැබේම ය. එහෙත් තම ස්වාමිවරුන්ට ඇති හිතවත් බව නිසා මා නඟුල ගෙන හාන විට එක් නඟුල් පාරට නඟුල් තල පාරවල් හත් පාරක් සී සෑවේවා. මේ ස්වාමිවරුම ස්වාමිවරු වේවා. මෙවැනි දුර්භික්ෂ භයක් ඇති නොවේවා යි පැතුවේ ය.

**''ඉච්ඡිතං පත්ථිතං තුය්හං ඛිප්පමෙව සමිජ්ඣතු පූරෙන්තු චිත්ත සංකප්පා චන්දෙ පණ්ණරසී යථා''** ඔබලා පැතූ දෙය සමෘද්ධිමත් වේවා. පිරුණු සඳ මෙන් සිතේ පැතුම් සපිරේවා යි, ආශිර්වාද කර, පසේ බුදු රජාණන් වහන්සේ ගන්ධමාදන පර්වතයට වඩින තුරුම තමන් වහන්සේ දකීවායි අධිෂ්ඨාන කර, අහසින් ම වැඩම කොට සෙසු පසේ බුදු රජාණන් වහන්සේලාට බෙදා දී වැළඳු සේක.

සිටුතුමා නිරාහාරව සතුටින් නිදා අවදි වී කුස ගිනි දරාගත නොහැකිව හැලියෙහි දංකුඩවත් ඇත් දැයි විමසුවේ ය. නැත නොකියා සිටු දේවිය කුස්සියට ගොස් බලන විට හැලිය බත්වලින් පිරී තිබෙනු දැක, අසීමිත ප්‍රීතියෙන් පස් දෙනාම කුස පුරා අනුභව කළත් හැලියෙහි බත් අඩුවක් නොවීය. එදිනම වී කොටු වීවලින් පිරී ගියේ ය. දුර්භික්ෂය අවසන් වන තුරු අසල්වාසීන්ටත් බෙදා දෙමින් සුවසේ විසුවෝ ය.

සාමාන්‍ය භික්ෂූන් ලක්ෂයකට දුන්නත්, මෙවැනි දෙයක් සිදු නොවේ. මෙවැනි දෙයක් වන්නේ කෙසේ ද? බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේ නමක් වීම, නිරෝධ සමාපත්තියට සම වැදී සිට එයින් නැඟී සිටීම, ධාර්මික වස්තුවක් වීම, සද්ධාවෙන් යුතුව උන් වහන්සේට පූජා කිරීම නිසා එදිනම හෝ දින කිහිපයකින් මෙවැනි විපාක ඇති කෙරේ. මෙය ධර්මතාවයක්. ධර්ම නියාමයක්. මේ ධර්මයේ සන්දිට්ඨික ඵලයයි.

කන බොන ආහාරයකින් මිනිස් ජීවිතය රැකෙන්නේ උපරිම දින හතයි. ආහාරයෙන් ඕජා රූප කලාප උපදින්නේ දින හත දක්වා පමණි. දින හතකට නිරෝධ සමවතට සම වැදුණොත් ආහාර ගැනීම තබා හුස්ම ගැනීමක්වත් නැත. දින හතෙන් සමවතින් නැගී සිටි විට ආහාරයක් නොලැබුණොත් එදිනම පිරිනිවන් පෑම සිදු වේ. යම් කෙනෙක් එදින දෙන දානය නිසා ජීවිතය සුරැකේ. බොහෝ දෙනෙකුට හිත සුව පිණිස තව කලක් ජීවත් වේ. එවබැවින් නිරෝධ සමවතින් නැඟිට නොවැරදීම දානය ලැබෙන සද්ධාව හා පරිත්‍යාග ගුණය ඇති අය සිටින තැනක් බලාම පිඬු සිඟා වඩිනු ලැබේ. මේ නිසා නික්ලේශී මහා ගුණ කඳක් තවත් කාලයක් පැවතීමට ආධාර වශයෙන් යමෙක් දානයක් දී යමක් පැතුවා නම් එය වැළැක්වීමට කිසිදු බලවේගයකට නොහැකි ය.

මේ පස් දෙනාම මරණින් පසු දෙව් ලොව ඉපදී, දෙව් සැපත් විඳ, සසර සැරි සරා විත්, මීට වසර දෙදහස් පන්සීයයකට පෙර දඹදිව සිටු ගෙදරක උපන් පසු, මාළිගය පිටුපස එකින් එකට සැපී රන් බැටලු රූප මතු වූ නිසා මෙණ්ඩක නමින් ප්‍රසිද්ධ විය. ඒ කල්ප අනුවකට පෙර කරන ලද බුද්ධ, ධම්ම, සඞ්ඝ පූජාවක විපාක වශයෙනි. පෙර බුදු සසුන්වල වමතින් බත් බඳුන ගෙන දකුණු අතින් හැන්ද ගෙන දන් බෙදූ නිසා වම් අල්ල පුරා නෙළුම් මල් සටහනක් දකුණු අල්ල පුරා සඳ ලකුණු වශයෙන් රේඛා සටහන්ද, පැන් බඳුන ගෙන දන ශාලාව පුරා ඇවිදිමින් පැන් පිළිගැන් වූ පිනෙන් දකුණු පතුල පුරා සඳ (චන්ද) සටහනද, වම් පතුල පුරා නෙළුම් මල් (පදුම) සටහන පිහිටි පින්වතිය සිටු දේවිය විය. මේ දෙපළගේ පුතා වූයේ ධනංජය සිටු කුමාරයා විය. (ඒ අග්‍ර ප්‍රත්‍ය දයිකාව වූ විශාඛාගේ පියතුමා ය.) ලේලියම ලේලිය විය. දාසයා ම දාසයා විය.

මේ පස් දෙනාම තම තමන්ගේ පින්කම් බලෙන් චෝදිතව තම ප්‍රාර්ථනා සපුරා ගත්හ. පැතූ පරිදිම ඒ දේවල් සිදු විය.

සංඛාරුප්ප ත්ති සූත්‍රයට අනුව ප්‍රාර්ථනාවක් කර ඒ අනුව සිත තබයි. ඒ අනුව සිත පිහිටුව යි. ඒ සිත ම වඩයි. එම ප්‍රාර්ථනා සහිත සද්ධා දී පඤ්ච ධර්මයන්ගෙන් යුක්ත වූවහුගේ ඒ චේතනාමය කුසල කර්මයට අනුව උපත වේ යන වදාළ පිරිදි මේ පස් දෙනාගේ උප්පත්ති සිදු වූ හැටි විමසා බලමු.

ප්‍රාර්ථනාව සඵලවීමට කුසල් කළ යුතු ය. සද්ධා දී පඤ්ච ධර්ම වැඩිය යුතු ය. සද්ධාව නම් ධර්ම වශයෙන් සද්ධා චෛතසිකය යි. ශීල නම් සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව වූ චෛතිකය යි. සුත නම් වූ අසා දැනගත් දහම් දැනුම සිතට ගන්නේ මනසිකාර

චෛතසිකයෙ නි. නැවත සිහිකර දෙන්නේ සති නම් චෛතසිකයෙ නි. චාගය නම් පරිත්‍යාගය, දීම සිදුවීමට මුල් වෙන්නේ අලෝභ චෛතසිකයෙ නි. මේ සියල්ලටම ආධාර වෙනවා ප්‍රඥා චෛතසිකය. මේ සියලු චෛතසික යෙදෙන්නේ කුසල් සිත්වලය ය. සද්ධා දී පඤ්ච ධර්ම වැඩීම නම් කුසල් සිත් ඉපදවීමය. කුසල් සිත් ඉපදවිය හැක්කේ සිත කය වචනයෙන් පින්කම් කිරීමෙනි. යම් පින්කමක් කරන කල්හි ඤාණ සම්ප්‍රයුක්ත සිතක් පහළ වුවොත් එම සිත සමඟ ඉහත සඳහන් චෛතසික සියල්ල එකම සිතේ පහළ වේ.

අග්‍ර දක්ඛිණෙය්‍ය වූ පසේ බුදු රජාණන් වහන්සේ අරමුණු කරගෙන දන් දීමේ දී එම පස්දෙනාගේ ම සිත් තුළ මේ පඤ්ච ධර්මයන්ගෙන් යුතු කුසල් සිත් නොඅඩුව පහළ වූහ. එසේ කළ බැවින් කරන ලද ප්‍රාර්ථනාද එලෙසින් ම සිදු විය. දාසයාගේ සිත තුළද නොඅඩුව එම ධර්ම වැඩී ප්‍රසන්න සිතින් කරන ලද කුසලයෙන් සිටු සම්පත් හෝ රජ බමුණු කුල පැතුවා නම් එබඳු තත්වයෙන් උපදී. තම ස්වාමිවරුන්ට ඇති හිතෛෂී, යටහත් භාවය නිසා දස බව සඳහා ම සිත තැබුවේ ය. එම නිසා ඔහු සිටුවරයෙකු, රජෙකු නොවී දාසයෙකු ම විය.

මේ කියන අයුරින් සසර ගමනේ දී තම මව්පිය, සොයුරු සොයුරියන් හිත මිතුරන්, ස්වාමි භාර්යාවන් ම ලබන්න කැමති නම් සම සිතින් එක්ව සමාන අදහස් ඇතිව කුසල් කරමින් ප්‍රාර්ථනා කිරීමෙන් ලැබිය හැකි බව නුවණැත්තෝ වටහා ගනිත්වා. (එයද සසර බැඳීමට නොවී, එක්ව සසරින් මිදීමටත්, සසරින් මිදෙන තුරු පමණක් වීම ඉතා සුදුසුය.)

නමුත් තමාගේ මව්පිය, දූ දරු, ස්වාමි භාර්යාදී අය අදහස්වලින්

සම නොවේ නම්, එක් අයෙක් කුසලට, ගුණයට, දහමට කැමති වෙන අතර අනෙකා පාපයට බර නම්, කුසලට නොනැමේ නම්, මව්පිය, දූ දරු, ස්වාමි භාර්යා වුවත්, ඒ විශම අදහස් ඇති අය නැවත නැවත එක් වූවොත් පෑදි දියට බොර දිය එක් වුණා හා සමානයි. ඒ අසමාන ගති සිරිත්, අදහස් ඇත්තන් සමග එක්ව අද විඳවන දුක, පීඩාව, අසහනය මතු ජීවිතවලදීත් විඳින්න සිදු වෙනවා පමණක් නොවේ එවැනි අය සමඟ එක්ව විසීම නිසා බොහෝ අකුසල් ද සිදු වේ. එවැනි මව්පියන් නිසා සමහරවිට කල්පයක් අපායේ දුක් විඳින්න වෙන ආනන්තරිය කර්ම පවා සිදු විය හැකිය.

මව් පියා දී අප සැවොම දිගු සංසාර ගමනේ දී හමුවෙන අයයි. අවිද්‍යාවෙන් ඒ බව නොදැන තණ්හාවෙන් ඒ අය සමඟ බැඳීම පෘතග්ජන සිතේ ස්වභාවය යි. මව් පියාදී අද ලැබී එක්ව සිටින අය කොහොමවත් දහමට, ගුණයට නොනැමේ නම් පවටම බරව අපා මඟම අනුගමනය කෙරේ නම් එයින් ගලවා ගත නොහැකි නම්, ඒ අය ගැන උපේක්ෂකව තම යුතුකම් කොටස පමණක් ඒ අය වෙනුවෙන් ඉටු කරමින් දහමට ලැදි, ගුණයට බර, සත් පුරුෂ වූ සිල්වතුන් හා එක් ව එකට කුසල් කරමින් එවැනි හොඳ අය මතු සසර ගමනේ දී නිවන් දකින තුරු මව්පිය, දූ දරු, සොයුර සොයුරි, ස්වාමි භාර්යා, හිත මිතුරු කළ්‍යාණ මිත්‍ර අනුශාසක ගුරු උතුමන් වශයෙන් හමුවේවා යැයි ප්‍රාර්ථනා කිරීම නුවණැති ක්‍රියාවකි.

එහෙත් සංසාර විමුක්තිය පතා බුදු සසුනට දිවි දී, පැවිදි ගුණ දම් පුරණ උත්තම උත්තමාවියන් පිළිබඳව නොමනා පැතුම් ඇති කර ගැනීම නම් ඉතාමත් භයානක යි. මෙලොවදීම ඉතා කටුක දුක් විපාක විඳීමට හේතු වේ.

**ස්ත්‍රියක් බවට පත් වූ තරුණයෙක්**

මහා කච්චායන මහ රහතන් වහන්සේගේ බැබළෙන, පිරුණු සිරුර දැක, මුන් වහන්සේ මට බිරිඳ හෝ වෙනවා නම්, මාගේ බිරිඳගේ සිරුරද මේ වාගේ වෙනවා නම් හොඳ යැයි රාගයෙන් උමතු වූ එක් තරුණයෙකුගේ ලාමක සිතුවිල්ල නිසා ඒ මොහොතේ ම පුරුෂ බව අතුරුදහන් වී ස්ත්‍රියක් බවට පත් විය. ලජ්ජාව නිසා වෙනත් පෙදෙසකට ගොස් තරුණයෙක් සමඟ යුග දිවියට ඇතුළත්ව, තම කුසෙන් දරු දෙදෙනෙකු බිහි කර, පැරණි මිතුරෙකු හමු වී ඔහුගේ උපදෙසින් රහතන් වහන්සේගෙන් සමාව ගත් පසු නැවත පිරිමි බවලබා, සසර බිය දැනී, පැවිදි බව ලබා පසුව කෙළෙස් නසා, රහත් ඵලයට පත් විය.

**ගසේ වෙලී, ගසක් නසන භවලතා (භවයේ වැල)**

අද කාලයෙත් පෙර පින් බලෙන් ලද මනා රූ සපුවකින් යුතු තරුණ භික්ෂුන් කෙරෙහි මෙබඳු නොමනා ලාමක පැතුම් ඇතිව, රාගයෙන් උමතුව උන් වහන්සේලා වසඟයට ගෙන, විපතට හෙලා, සිවුරු හරවා ගිනි ගෙයක් වූ ගිහි ගෙට ඇද ගන්නා, භව ලතාවෝ බොහෝ ඇත. පියකරු රූ සපුවකින් යුතු තරුණ භික්ෂුවක් දැක, සද්ධාවේශයෙන් රඟපාමින්, රාගයෙන් උමතුව පිට පිටම දානය රැගෙන ආ භව ලතාවක් ගැන අත්දැකීමක් හා තරුණ කළ අප මුහුණ දුන් අවස්ථා දෙකක් සහිතව අසන්නට දකින්නට ලැබුණ අත්දැකීම් ඇති බැවින් එවැනි ලාමක සිත් ඇති අය මේ මහා පාපයෙන් මිදේවා යන සිතින් මෙම කරුණු මෙයට ඇතුළත් කළෙමි. එසේ සිල්වතුන් විපතට හෙලා ඇති කර ගන්නා වූ අයගේ ජීවිතද අසාර්ථක වන අතර, ඔවුන් නිවනින් ඈත් වී, සසර දික් වී, සසර ගමනේ බොහෝ දුක් විඳීමට

හේතු වෙන බැවිනි. (මේවා පුද්ගලයින්ගේ වැරදි නොව කෙළෙසුන්ගේ ම දෝසයි.)

**අන්ධ බාල මන්ද බුද්ධිකයෝ**

තරුණ මදයෙන් මත් ව විපරීත අදහස් ඇතිව, මනෝ ලෝකයෙහි සැරිසරමින් පිරිමිකමට නොගැළපෙන, ස්ත්‍රී ආකල්ප අනුගමනය කරමින් හැසිරෙන, ඇතැම් තරුණයන් ජන සමාජයේ දැක ගත හැකි ය. දහමට අනුව එවැනි අයට කියා දිය යුතු පාඩම වන්නේ, ස්ත්‍රී ආකල්ප, ස්ත්‍රී ආකාර ස්ත්‍රී හැඟීම් නැවත නැවත අනුගමනය කෙරේ නම් ඒ අය මරණින් පසු ස්ත්‍රී භාවයට පත්වෙන බවයි.

**චරියාවෙන් චරිතය හඳුනා ගනිමු.**

තිරිසන් සත්වයෝ ප්‍රඥාව හීන වූ මෝහාධික සත්වයන් මෙන් ම ලජ්ජා භය නැති නිසා නිරුවත්ව හැසිරෙති. මහ මඟත්, මිනිසුන් ඉදිරියෙත් සුනඛාදි සත්වයෝ විලි බිය නැතුව උන්ගේ ග්‍රාමක ක්‍රියාවල යෙදෙති. එහෙත් මිනිසා ප්‍රඥාව දියුණු කළ හැකි, විලි බිය හඳුනන තිරිසන් සත්වයන්ට වඩා මනසින් උසස් සත්වයෙකි. එබඳු මිනිස් සමාජයේ ස්ත්‍රී පුරුෂ යමෙක් වසා ගත යුතු වූද, නොවැසුවොත් ලජ්ජාව ඇති වෙන අඟ පසඟ අන්‍යයාට පෙනෙන්නට විවෘතව හෝ අඩ නිරුවත්ව හෝ අඟ පසඟ කැපී පෙනෙන ලෙස ඇඳුම් අඳින්නේ නම් ඔහු හෝ ඇය රාගයෙන් උමතුව හැසිරෙන රාග චරිත ඇත්තෙකැයි නුවණැත්තෝ දනිති. මෙවැනි යමෙක් නුවණැති අය මාගේ චරිතය හඳුනා ගනී යැයි යම්තමට හෝ දැනී, විලි බිය ඇති කර ගනී නම් කිසි දිනෙක කිසි තැනෙක මෙසේ අඩනිරුවතින් හෝ අඟ පසඟ කැපී පෙනෙන, ඇඟට හිර වූ ඇඳුම් නොඅඳිනනු ඇත. යමෙක්

දැන දැනත් එසේ හැසිරේ නම් තමාගේ විරූප බව නොහඳුනන, බොහෝ කලක් තිරිසන් අපායවල සැරිසරමින් සිටි නිසා විලි බිය පුරුදු නැති මෝහාධික මිනිස් සත්වයෙකැයි ද නුවණැති අය දනිති.

මාගන්දියා තරුණිය බුදු රජාණන් වහන්සේ කෙරෙහි වෛර බැන්දා මෙන් අප කෙරෙහිද වෛර බඳින්නන් ඇති බව දැන දැන මෙසේ ලියන්නේ අන්ධ බාලයන් සඳහා නොව නුවණැත්තන් සඳහා ය. නැති නම් නුවණැස පාදා ගැනීම සඳහා ය. මිනිසුන්ගේ පරමායුෂ අවුරුදු දහයට බහින කාලය ඉතා ලං ලංව එන බැවිනි. බාලයන්ට ඇත්ත තිත්ත වුණත් ප්‍රඥාවන්තයන්ට අමා මිහිරකි. පිට ඔපයෙන් යුතු සුරූපී වූ තරුණ මාගන්දියාව පාවා දීමට පැමිණි මව්පිය දෙපළට මේ ලස්සන රූපය තුළ ඇත්තේ මළ මූත්‍රා දී අශූචි බව බුදු රජාණන් වහන්සේ විසින් පෙන්වා දුන් පසු නුවණැති මාගන්දියගේ මව්පිය දෙපළට එය අමා මිහිරක් වී නිවනින් සැනසුණ අතර තරුණ මදයෙන් හා රූප මදයෙන් මත් වී සිටි මාගන්දියා තරුණියට ඇත්ත තිත්ත වී බුදු රජාණන් වහන්සේට වෛර බැඳ මෙලොවත් මහා දුක් විඳ ඥාතීන්ටත් මරණ දුක ලබා දී අපා දුකට පත් විය. එබැවින් කෙළ, සෙම්, සොටු, අසුචි, මළ මූත්‍රායෙන් පිරී පිට ඔපයෙන් වැසී ඇති දෙතිස් කුණපයක් වූ මේ රූප කය කවර නම් නුවණැත්තෙක් ප්‍රදර්ශනය කෙරේ ද? නොකෙරේ මය. එසේ කරන්නේ නුවණ නැත්තෝ මය.

## මතු එක්වීමට පැතූ ආර්ය ශ්‍රාවකයෝ

නකුල පුතාගේ මව් පියන් වූ නකුල මාතා නකුල පිතා යුවළ තරුණ වියේ දීම එක් වී ප්‍රිය භාවයෙන්, විශ්වාසයෙන් වාසය කළ අතර, මතු භවයේ ද මෙසේ ම එක් වීමට කැමති බව බුදු රජාණන්

වහන්සේට දෙදෙනාම පැවසු විට, එය වැරදි කියා හෝ එසේ නොකළ යුතු යැයි නොවදරා ඒ වෙනුවට මතුවටත් දකිනු, එක්වෙනු කැමති නම් දෙදෙනාම සමාන වූ සද්ධා, ශීල, ත්‍යාග, ප්‍රඥාවෙන් යුක්ත විය යුතු බව වදාළ සේක. මෙසේ ප්‍රාර්ථනා නොකළ යුතු නම්, නොසුදුසු නම් බුදු රජාණන් වහන්සේ මෙය අනුමත නොකරන සේක. මේ දෙදෙනාම සෝතාපන්න වූ ආර්ය ශ්‍රාවකයෝ ය.

මේ දෙදෙනොම සද්ධා, ශීල, ත්‍යාග, ප්‍රඥා ධර්ම කල්ප ලක්‍ෂයක් ම තමාගේ සිත් තුළ වැඩුවෝ ය. මේ දෙදෙනා ජීවිත පන්සීය බැගින් මව්පියන් වී, ලොකු මව - ලොකු පියා වී, සුළු මව - සුළු පියා වී, නැන්දා - මාමා වී අප මහ බෝධි සත්වයන් වහන්සේ පෝෂණය කර ඇත. අංගුත්තර නිකායේ ඒකක නිපාතයේ ඒතදග්ග පාලියෙන් හා චතුක්ක නිපාතයේ සමජීවි සූත්‍ර හා එම අට්ඨ කථාවෙන් මෙම දෙදෙනාගේ පිවිතුරු ජීවිත පුවත කැමතියන්ට විස්තරව දැන ගත හැකි ය.

## වර්තමාන සිද්ධියක්

එක්තරා අඹු සැමි යුවළකගේ සැමියා සමඟ වාසය කළ නොහැකිව, බිරිඳ වෙන් වී තම මව්පිය නිවසට ගියා ය. සැමියා ඇය නැවත ගෙන්වා ගැනීමට උත්සාහ කර නොහැකි විය. කෝප වූ සැමියා පිහියෙන් ඇන ඇය මැරුවේ ය. නීතියෙන් ඔහුට මරනීය දඬුවම නියම විය. ඔහු එල්ලන්න පෙර දිනයේ සඟ සතු දානයක් බන්ධනාගාරයේ දී දෙන ලදි. මල්ලී මා ගැන දුක් වෙන්න එපා මං ඔබට පුතෙක් ව උපදිනවා යැයි සහෝදරයාට කීවේ ය. ඔහුගේ මරණයෙන් පසු මල්ලිගේ බිරිඳ දරුවෙක් ලැබුවා ය. මේ මැරුණ කෙනාම යැයි පසුව කළ පරීක්ෂණවලින් හෙළි විය. (මෙය පුවත් පත් පිටුවක පළ වූ වාර්ථාවකි)

**මෙහි නිගමනය**

ඔහු තම බිරිඳ මැරුවත් ඒ ගැන වැඩිය පසුතැවිලි නොවීම නිසා මතු ප්‍රතිසන්ධිය පිණිස ආචිණ්ණ කර්මයක් නොවූ අතර බලවත් කුසලයක් වූ සඟ සතු දානය ආසන්න කර්මය විය. දානමය පින්කම අනුව ඔහු තුළ ඇති වූ කුසල් සිත් හි සද්ධාදි ධර්ම පහම නොඅඩුව පැවතුණි. මල්ලිට දරුවෙක් ව උපදින්නෙමි යන පැතුම එයට එක් වීම නිසා පුඤ්ඤාභි සංඛාර කුසලයේ විපාක සිතින් ප්‍රතිසන්ධිය ලැබුවේ ය.

**නොමනා පැතුමක අනිටු ප්‍රතිඵල**

අතීතයේ මවක් සහ දුවෙක් චෛත්‍ය වන්දනාවට ගොස් පර මල් ඉවත්කර මව ආසනය සේදීමට පැන් ගේන්න ගිය පසු දුව විසින් මල් පූද, මේ පිනෙන් පිරිමින් උමතු කළ හැකි රූපයක් ලැබේවා යැයි පැතුවා ය. මව පැමිණි පසු නොසේදූ අසුන මත මල් පුද, තිබෙනු දැක, මොන චණ්ඩාලිද මේ නොසේදූ ආසනේ මල් පිදුවේ දැයි මව ඇසී ය. මම නොවෙයි චණ්ඩාලී උඹ යැයි දුව ද කීවා ය. ප්‍රසන්න සිතින් මල් පිදුවා මෙන් ම ද්වේශ සිතින් නොබැනිය යුතු කෙනෙක් වන මවට බැන්නා ය. ඇය මරණින් පසු උපන්නේ චණ්ඩාල කුලයෙහි ය. ඇගේ පපුව මැදින් රැස් විහිදෙන තිලකයක් පිහිටියේ ය.

ඇය දුටු රජවරු කිහිප දෙනෙක් ම ඇය කෙරෙහි රාගයෙන් උමතුව, චණ්ඩාල තරුණියක් නිසා පාවාගත  නොහැකිව ජීවිත නැති කරගත් අතර, ආවාහ කර ගන්නා ලද ආචාර්යවරයෙකුගේ සිසු පිරිස විසින් ඇය මරන ලදුව, ඇය නැතිව ආචාර්යවරයා ද දිවි නසා ගත්තේ ය. මෙසේ කරන නොමනා පැතුම් තමාටත් අනුන්ටත් විපත් ගෙන දේ.

## සාප කිරීමේ පැතුම්

සද්ධාව හා ප්‍රඥාව නැති එක් මවකගේ සද්ධාව හා ප්‍රඥාව ඇති පුතෙක් නිතර ස්වාමීන් වහන්සේලාට දන් දෙයි. මව එයට අකමැතිව මාගේ කැමැත්ත නැතිව මේ ගෙදර තිබෙන දේවල් ශ්‍රමණයන්ට දෙන නුඹට මේවා පර ලොව දී ලේ වෙයන් යැයි කීවා ය. ඇය ප්‍රේතියක් වී අතට ගන්නා ලද සෑම දෙයක් ම ලේ බවට පත් වේ. ඇය මෙලෙසින් බොහෝ දුක් වින්ඳාය.

## පේසකාර ප්‍රේතිය

අතීතයේ ස්වාමීන් වහන්සේලා දොළොස් නමක් වස් වසවාගෙන දන් දුන්නෝ ය. ගම් ප්‍රධානියාගේ බිරිඳ තද මසුරු වූ සද්ධාව නැති තැනැත්තියකි. ඇගේ නැගණිය සද්ධාව ඇති තැනැත්තියක් වූ බැවින් ඔහු ඇයත් කැඳවාගෙන විත් ඇයට නිවසෙහි ප්‍රධානත්වය දෙන ලදි. වස් අවසානයේ හැම දෙනාම සිවුරු රෙදි ද පූදන ලදි. නුඹ විසින් ශ්‍රමණයන්ට දෙන ආහාර පාන පර ලොවදී නුඹට අශූචි මුත්‍රා ලේ සැරව වේවා, වස්ත්‍ර ගින්නෙන් දැවෙන්නා වූ ලෝහ තහඩු වේවා යැයි දුෂ්ඨ සිතින් පැතුවා ය. සැමියා මැරී දඹදිව වින්ධ්‍යා කැලයෙහි රුක් දෙවියෙක්ව ඉපදී දෙව් සැප විඳින අතර, බිරිඳ එහිම ප්‍රේතියක් ව නිරුවත්ව වසයි. ඇය පැමිණ, මං ඔබේ බිරිඳයි. මට බඩගිනියි. කෑම දෙන්නැයි ඉල්ලන විට, දේවතාවා දිව්‍යමය ආහාර දෙයි. ඒවා අරගත් විගස අශූචි, මුත්‍ර, සැරව බවට පත් වේ. වස්ත්‍ර දුන් විට ඒවා ඇඳ පොරවා ගත් විගස ගින්නෙන් දිලිසේ. ඇය ඒවා විසි කරමින්, විලාප නඟමින් මහ දුක් වින්ඳාය.

## මෙකල පුවතක්

කිතු වසින් එක් දහස් නවසිය විසි ගණන්වල එක් ගමක සහෝදර පවුල් දෙකකින් එක් නිවසක මව සැර පරුෂ ගති ඇතිව විසුවා ය. මසුරුයි. අනෙක් නිවසේ ඇති දියණිය ලොකු මවගේ නිවසේ ඇති රට අඹ ගසෙන් ඉදී වැටෙන මිහිරි රසැති අඹ ඇහිලීමට යන විට ලොකු මව දෙස් නඟයි. දුවණිය ළමා වයසේ නිසාත්, බණින්නේ ලොකු අම්මා නිසාත් ඇය ඒවා ගණන් නොගනී. මෙසේ එම නිවසට නැවතත් යන විට දිනක් උඹ ආයේ ආවොත් මං උඹට පොළඟා වෙලා කනවා යැයි බැන්නා ය. එය ළමයාගේ සිතට බියක් ඇති කළත්, සිනාසී තම නිවසට ගියා ය. වැඩි විය පත් ඇය යුග දිවිය අරඹා සැතපුමක් දුරින් පිහිටි ගමේ සැමියාගේ නිවසෙහි සතුටින් වැසුවා ය. එක් පින්වත් දරුවකු ලබා, දණින් ඇවිදින කාලයෙහි තවත් දරුවෙක් ඇගේ කුස තුළ පිළිසිඳ ගන්නා ලදි. දිනක් අවුරුදු උත්සවය නැරඹීම සඳහා සැමියා සමඟ නගරයට යාමට සූදානම් වුවත්, බස් රථය වැරදුනි. අනෙක් බසය පැමිණීමට පැයක් ගතවේ. පාරේ පැයක් සිටින වේලේ තල හේන බැලීමට සිතක් ඇති වී දෙදෙනාම එකතුව සැමියා ඉස්සර වී ඇය පසු පසින් ගියා ය. ආපසු එන ගමනේ කලින් බැඳ තිබූ දර මිටියක් ද හිස මත තබාගෙන ඇය ඉස්සර වු අතර, සැමියා පිටුපසින් ආවේ ය. ආවේ ටික දුරකි. පාදයේ යමක් ගැටුණි. දැඩි වේදනාවකි. දර මිටිය බිම දමන ලදි. විමසා බලනවිට පොළොන් සැපිණියක දෂ්ඨ කර ඇත. සැමියාගේ දෑත් මතින් ගෙදරට ආවා ය. රාත්‍රි එළිවෙන තුරු විශ වෙදුන් දෙදෙනෙක් ම පැමිණ ප්‍රතිකාර කළත්, එම විශ නසන බෙහෙත්වලින් වෛරයේ විශ ගින්න නැසිය නොහැකි විය.

ඇයගේ අවසන් කටයුතු නිමවා දින කිහිපයක් ගත වූ පසු මිදුලේ සෙල්ලම් කරමින් සිටි දරුවා සොයා පැමිණි සැපින්න අල්ලපු නිවසේ

කෙනෙකු අතින් මරණයට පත් විය. (මෙසේ නපුරු පැතුම් තමාටම විපත් ගෙන දේ.) මෙය ගල්ගමුව ප්‍රදේශයේ සිදු වූ දෙයකි.

මෙවැනි නපුරු පැතුම් කොතෙක්වත් ජන සමාජය තුළ සිදුවන අතර, ඒවා අසන්න දකින්න ද ලැබේ. හොඳ පැතුමට සද්ධා දී ධර්ම පහ හේතු වෙනවා මෙන් නපුරු පැතුමට ලෝභ, දෝස, මාන දිට්ඨි, ඉරිසියා, මසුරුකම් හේතු වේ. මේවා අකුසල ධර්ම නිසා ඇති වන්නේ අකුසල් සිත් සමඟයි. තම සිත තුළ ඇතිවන කුසල චේතනා අනුව තමාට සැප විපාක ගෙන දෙනවා මෙන් අකුසල ධර්මද තමා තුළම උපදින බැවින් අනුනට ශාප කරමින් පැතුවත්, විපාක සිත් උපදින්නේ තමා තුළම බැවින් එහි අමිහිරි කටුක දුක් විපාක තමාටම විඳින්න වේ.

මෙහි ඇති දරුණු ස්වභාවය දන්නේ නම් උඩු සුළඟට දැමූ කුණු රොඩු තමා වෙත එන බව අදහා, සද්ධාව ඇත්නම් සිත, කය, වචනය සංවර කර ගෙන, සිල්වත්ව, ආචාර ධර්ම පුරුදු කරමින්, දිවි ගෙවමින්, දහම් පොත පත කියවා, කල්‍යාණමිත්‍ර ඇසුර ලබමින්, සාකච්ඡාවෙන්, විමසීමෙන්, දහම් දැනුම වූ සුත සම්පත්තිය ලැබ, අත හැරිය යුතු දේ අත හරිමින්, දිය යුතු දේ දිය යුතු තැනට දෙමින්, මව් පිය, දූ දරු, ස්වාමි භාර්යා, සොයුරු සොයුරියන් නෑ හිත මිතුරන් අසරණයන් දුප්පතුන් පූජ්‍ය පක්ෂය, ආගම දහම වෙනුවෙන් කාලය, ධනය, ශ්‍රමය, යුතුකම් පරිත්‍යාග කරමින්, චාග ගුණය ද වඩමින් සැපයෙහි අනිත්‍ය බව, සසරෙහි අසාර බව කෙළෙසුන්ගේ රුදුරු බව, වඤ්චනික බව හා නිවනෙහි ඇති උත්තරීතර සැනසීම දැකගත හැකි ප්‍රඥාව වඩමින් ආශ්‍රව නසා නිවන් දැකීමට ප්‍රාර්ථනා කරමින් අප්‍රමාදව කුසල් කරන්නේම ය.

**ප්‍රඥාගමනය**

මේ ගෞතම බුද්ධ සසුනේ නිවන් දුටු අග්‍ර ශ්‍රාවක, මහ ශ්‍රාවක - ශ්‍රාවිකා, පැවිදි පිරිසත් සුදත්ත - විශාඛාදී ගිහි ශ්‍රාවක පිරිසත් පෙර බුදු සසුන්වල සත් දින බැගින් දන්දී පූජා පවත්වා ආරම්භ කරන ලද පාරමී ගමනේ ද, ගරු ගාම්භීර මහා පිංකම් කරමින් නිවන් පතාම කළෝ ය. අපදාන පාලියෙහි පන්සිය පනස් නව නමක් ථේරාපදානවල විස්තර වෙන්නේ උන් වහන්සේලා නිවන් පතමින් කුසල් කළ බවයි. එසේ නිවන් පතා කුසල් කළා කියා කිසිවෙකුට කාම සැප සම්පත් නොලැබී ගියේ නැත. අන් අයට වඩා කාම සැප විඳි බවම සඳහන් වේ. මියගිය අය වෙනුවෙන් දන් පිදූ බව කියවෙන්නේ ඉතා ටික දෙනෙකි. ඒ පේත වස්තුවේ සහ අටුවාවල ය.

භික්ෂූන් වහන්සේලා ධර්ම දේශනා කර නිවන් දකින්න ප්‍රාර්ථනා කරන්න කියන විට සාධු කීවත්, නිවන් දැකීමේ හැඟීම් මාත්‍රයකුදු නැති බව චරියාවන්ගෙන් පෙනේ. අපමණ දෙනා මහා රැල්ලකට හසු වී, එකම දිසාවකට ගසාගෙන යන බව නම් පෙනේ. බොහෝ දෙනා තම ඥාතීන් මැරුණ දිනය ලබාගෙනය. දන් පුදන්නේත්, පිංකම් කරන්නෙත්. මැරුණ අයට පින් දීමට හා ජීවත් වන අයට දුක් විඳ විඳ තව කලක් වසමින් කර්ම විපාක ගෙවීමට සෙත් පතමින් ය. නිවන් මගෙහි අඩිතාලම වූ ශීලය ගැන තැකීමකුදු නැත. උපෝෂථ රකින්නෙද, විවේක ගැනීමටත්, කළ පව් ගෙවාගෙන මරණින් පසු සැප ලැබීමට ය. එසේ කරන්නේ ද සුළු පිරිසකි.

දැන් අලුත්ම රැල්ලක් සම්බුද්ධත්ව ජයන්ති නාමයෙන් ආරම්භව ඇත. මිය පරලොව ගිය අය උදෙසා ආහාර පාන, වස්ත්‍රාභරණ, ගෘහ උපකරණ, වාසස්ථාන සිල්වතුන්ට පුද පිං දුන් විට ඥාති ප්‍රේතයන්ට

දුන් දෙයට අනුරූප දේ ලැබී සැපයට පත් වෙන බවයි බුද්ධ දේශනාව. එසේ ලැබුණ බවට ද සාධක දහම තුළ පෙන්වා ඇත. ලෝභය හා මසුරුකම නිසා ප්‍රේතයන් ව ඉපිද ආහාර පාන නොලැබ දුක් විඳින අයට ධර්ම දේශනා කරවා පිං දීමෙන් ආහාර පානාදිය ලැබේ ද? එසේ ලැබේ නම් බුදු රජාණන් වහන්සේ දේශනා කරන්නේ ම ය. එය කුසගින්නෙන් පෙළෙන පිරිසකට හෝ කෙනෙකුට ආහාර පාන නොදී කුසගින්නේ සිටින්න හැර කුස ගිනි නිවා ගන්නා හැටි, ගෙවල් සාද ගන්නා හැටි, රැකියාවල් කරන හැටි කියා දෙනවා වැනිය.

වටිනා සඳුන් අරටු කුණු මෝරුවලට විකුණා මුදල් උපයන ජාවාරම්කරුවන්ට හසුව මුළු රටට ම, ලෝකයටම නම කියවා ගැනීමේ ළාමක චේතනාවෙන් දැන හෝ නොදැන මාන්නය සහ මිත්‍යා දිට්ඨි ආදියට යටව ලෝභ සිතින් ම කරන දෙයක් බව නොවැටහෙන්නේ සද්ධා දී පඤ්ච ධර්ම සිත තුළ නොවැඩී කාම සම්පත් පැතීම හේතුවෙනි.

බත් රස හඳුනන්නෝ බත සඳහා වී වගා කරති. එමෙන් ම නිවන් රස අනුමාන වශයෙන් හෝ හඳුනන්නෝ නිවන් පතා පින් කරති. බත් රස නොදන්නා වූ ඇතැම් අය පරිසරය සරසමින්, බොහෝ කල් ගොයම් වර්ග පවත්වාගෙන යාම මෙන් ජීවත්ව සිටින අයට දීර්ඝායුෂ පිණිස සෙත් පතා ද පින් කම් කරති. එසේ හෝ පින් කිරීම කෙසේවත් වරදක් නැත. පවු කරනවාට වඩා ලක්ෂ කෝටි වාරයකින් උතුම් වේ. පවු කර අපා දුක් විඳිනවාට වඩා පින් කිරීමෙන් තාවකාලික අස්ථිර භව සැප හෝ ලැබෙන බැවින් හොඳ ය. එහෙත් එයින් නිවන නම් නොලැබේ.

සැමදාම ගවයන් පෝෂණය කරමින්, ගවයන් සඳහා පිදුරු සඳහාද පරිසරය ලස්සණ කරමින්, වී වර්ග බොහෝ කල් පවත්වා

ගැනීම සඳහා වී වගා කිරීම මෙන් කාම සැප, භව සැප පතා පින් කළොත් ලැබෙන භව සැප අස්ථිරය. එය විපරිනාම දුකයි. කාම භව සැපත සඳහා නැවත නැවත පින් කළ යුතු මය. එය දුකකි. එහෙත් නිවන් දුටුවොත් එම දුක් අවසන් වේ. නැවත නැවත පින් කිරීම අවශ්‍ය නැත.

බත් සඳහා වී වගා කළොත් නිල්වන් ගොයම්න් හා රන්වන් කරලින් වෙල් යාය අසිරිමත් වී ගවයන් සඳහා පිදුරු ලැබී, බත් රසය විඳිය හැකිවාක් මෙන් නිවන් පතා කුසල් කළ විට නොඅඩුව කාම භව සැපත් ලබා නිවන් සුවයත් ලැබේමය. සසරින් මිදීමක්, නිවන් අවබෝධයේ කැමැත්තක් නැතිව භව සැප කාම සැප පතා පින් කළ අයට බුදු රජානණ් වහන්සේලා පහළ වී නිවන පිළිබඳව දේශනා කළත් අනිත්‍ය දේ, අසාර දේ අතහරින්න, පරිත්‍යාගයෙන් දන් පුදන්න, සිල්වත් වෙන්න, සමාධි විදර්ශනා භාවනා කරන්න, උපෝශථව වාසය කරන්න, මේ ජීවිත දුකින් පිරී ඇති සසර ගැන කළකිරෙන්න, ප්‍රඥාවෙන් කටයුතු කරන්න. මේ ජීවිතයටත්, ජීවිත වටා ඇති අයටත්, ඇති දේවලටත් ඇති ඇල්ම දුරු කරන්න. එවිට ඔබට දුක් නැති සැනසීම ලැබේ. මේ එයට මඟයි. පිළිවෙතැයි කියා පෙන්වා දුන්නත් එය නොතේරේ. මං කොහොමද මේවා දෙන්නේ. මං මේවා කොපමණ දුක් විඳළඳ හම්බ කළේ. මට කොච්චර දේවල් කරන්න තියෙනවද, මගේ බිරිඳ වෙනුවෙන් දරුවන් වෙනුවෙන්, මට ඕවාට වේලාවක් නැහැ. සිල් රැක්කට, භාවනා කළාට මොනවද ලැබෙන්නේ? සිල් ගන්න ගියොත් ගෙදර කර ගන්න තියෙන දේවල් කරන්නේ කවුද? රෑට පන්සලේ නතර වුනොත් ගෙදර බලා ගන්නේ කවුද? උයලා දෙන්නේ කවුද? ටෙලි නාට්‍යයේ අර කොටස බලන්න බැරි වෙනවා. රෑට බඩගින්නේ ඉන්නෙ කොහොමද? පන්සලට ගියේ අපරාදේ ගෙදර හිටියනම් කොච්චර වැඩක් කරගන්න තිබුණද? මේ ආදී කෙළෙස් මාරයා සිතට දෙන අදහස් අනුව ක්‍රියාකරමින් අර සිතූ පැතූ කාම භව සම්පත්වලටම ඇලී බැඳී සිටින නිසා

විවේක සැප නිවන් සැප නොදන්න නිසාම දුකම සැපයක් සේ වරදවාගෙන සසර දුකෙහිම බැඳී ගැලී සිටිති.

නිවන් රසයේ ඇති මිහිර හා සසර දුකෙහි ඇති අමිහිර දන්නවුන්ගෙන් අසා දැන ගත් ප්‍රඥාවන්තයෝ නිවන් සඳහා වී නමැති පුණ්‍ය බීජ වපුරා, නිල්වන් ගොයම් හා සම පුණ්‍යවන්ත ජීවිතවලින් සසර නමැති වෙල් එළිය සරසා රන්වන් කරල් වැනි පුණ්‍ය ඵලයෙන් යුතු ප්‍රඥාවෙන් ජීවිත බබුළුවා, ප්‍රඥාව නමැති වී කරල් පැසෙන තුරු කාම භව සම්පත් විඳිමින් හිඳ, යුතුකම් ඉටු කරමින් ප්‍රඥා නමැති වී කරල් පැසුණු පසු, පිදුරු දහයියා වැනි අසාරවත් කාම වස්තු හැර දමා, මිහිරි බත් රස වැනි නිරාමිස වූ නිර්වාණ සුවය අත් විඳිති. මෙවැනි ප්‍රඥාවන්තයන්ට අන් සැමදේටම වඩා දන් පිදීම, පරිත්‍යාගය, පන් සිල්, දස සිල්, උපෝෂථ සිල් වටින නිසා අන් සැම දෙයට වඩා ශීල භාවනාදී ගුණ පිරීමට විවේකය, නිදහස, වේලාව ඇත. හේතුව කොයි දේටත් නැති වේලාව මරණයට ඇති බැවිනි. සද්ධා, ශීල, සුත, චාග, පඤ්ඤා වැඩූ අය යොදුන් සිය ගණනක් දුර සිටියත්, බුදු ඇසට පෙනේ. ජේතවනාරාමය ළඟ සිටියත් චුන්ද ඌරු වැද්දා මෙන් ළඟ සිටියත් පවුකාරයන් බුදු ඇසට නොපෙනේ.

**බුදු ඇස**

මසැස, දිවැස, සමතැස, පණැස, බුදු ඇස කියා බුදු රජාණන් වහන්සේලාට ඇස් පහක් ඇත්තේ ය. පෙර පින් බලෙන් පෝෂිත වූ රූප දැකීමේ කැමැත්ත සහිත කර්මයෙන් හටගත් දීප්තිමත් නිල් පැහැති නිරෝගීමත් මසින් සැදි දෙඇස මසැස හෙවත් **මාංසමය චක්ඛුවයි**. ආලෝකය පතුරුවා. අඳුරෙහි හා දුර ඇති දේද, උපදින, මැරෙන සත්වයන් දැකිය හැකි දෙවියන්ට හා සමාන නුවණ **දිවැසයි**. නුවණින්

දැකිය යුතු යම් දෙයක් වේ නම් ඒ සියල්ල දැකිය හැකි නුවණ **සමතැස** යි. සත්වයන්ගේ සිත්වල වැඩී නොවැඩී ඇති සද්ධාදී ඉන්ද්‍රිය ධර්ම දැකිය හැකි ඉන්ද්‍රිය පරෝ පරියත්ති ඤාණය සහ සත්වයන්ගේ සිත් තුළ යටපත්ව ඇති කෙළෙස් සහ සසර පුරුදු කර ඇති දේ දක්නා වූ ආසය අනුසය ඤාණය යන ඤාණ දෙක **බුදු ඇස** යි. බුදු ඇස කියන්නේ. බුදු ඇසින් ලොව බලනවා යනු මේ ඤාණ දෙකෙන් ධර්මාවබෝධයට සුදුසු චේතනා පිහිටුවා ප්‍රාර්ථනා සහිතව සද්ධාදී පඤ්ච ධර්මයන්ගෙන් යුතුව ඤාණ සම්ප්‍රයුක්තව කුසල් වඩා පාරමී සපිරී ඇති අය කවුරුදැයි විමසා බැලීමට ය.

කුසල් සිත් තුළ සිතුවිලි තිස් ගාණක් අඩු වැඩිව යෙදෙන අතර සද්ධා, විරිය, සති, සමාධි, ප්‍රඥා ප්‍රධාන වන බැවින් ඉන්ද්‍රිය නමින් හඳුන්වනු ලැබේ. මෙයින් සද්ධාව වැඩූ අයට සද්ධාවට හේතු වෙන ධර්මත්, විරිය වඩා ඇති අයට වීරිය පිළිබඳ ධර්මත්, සිහිය දියුණු කළ අයට සතිපට්ඨානාදී ධර්මත්, ප්‍රඥාව දියුණු කර ඇති අයට ගැඹුරු ධර්මත් දේශනා කළ විට ධර්මාවබෝධය පහසුවෙන් සිදු වී මාර්ගඵල නිවන් අවබෝධය ලැබේ.

ආසය නම් සසර දී පුරුදු කරන ලද අකුසල් පැත්තේ **''සාසවත හා උචෙඡ්ද''** මිත්‍යා දෘෂ්ඨි දෙක යි. කුසල පැත්තේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය ආසය යි. **''අනුසය''** සිත තුළ නිදාගෙන මෙන් යටපත්ව සිටිය හැකි අරමුණු හමු වූ විට වහා නැගිට ක්‍රියාත්මක වන **කාම රාග, භව රාග, අවිජ්ජා, මිච්චා දිට්ඨි, පටිඝ මාන, විචිකිච්ඡා** යන සත යි. (මෙම ඤාණයන්ගේ විස්තර 5 වන සදහම් ග්‍රන්ථයෙහි ඇත.)

වර්තමානයේ ඇතැම් අය කියන පරිදි පාරමී නොපුරා නිවන් අවබෝධ වේ නම්. මේ ඤාණ දෙකින් යුතු බුදු ඇසින් ලොව බලා දහම්

දෙසීම, කමටහන් දීම අවශ්‍ය නොවේ. ආර්ය අෂ්ඨාංගික මාර්ගය වැඩිය යුතු දෙයකි. බුදු රජාණන් වහන්සේ වෙත එන බොහෝ දෙනා සද්ධාදී ධර්මයන්ගෙන් යුතුව ආර්ය මාර්ග වඩලත් නැත. අහලත් නැත. නමුත් සතර පද ගාථාවෙන් නිවන් අවබෝධ වේ. ඇතැම් අයට දීර්ඝ දේශනා කළත්, ජීවිතය පුරා පිළිවෙත් පිරුවත්, මඟ ඵල නිවන් නොලබති. යස සිටු පුතා, සුදත්ත සිටුතුමා වැනි අය කාම භෝගී ජීවිත ගෙවූ අයයි. මේ ජීවිතයේ පිළිවෙත් සපුරා නොතිබුණි. එවැනිම සැප විඳි විශාඛා, සුමනා වැනි අය සත් හැවිරිදි ළමා වියෙහිදී නිවන් දුටුවේ. පෙර සසරේ නිවන් පතා පාරමී ශීර්ෂයෙන් චේතනා පිහිටුවා සද්ධාදී පඤ්ච ධර්මයෙන් යුතු ආර්ය මාර්ගය වඩා තිබුණ නිස යි.

**නිවන් අවබෝධ කරන්නෝ සහ නොකෙරන්නෝ**

**උග්ඝටිතඤ්ඤු, විපච්චිතඤ්ඤු, නෙය්‍යා, පදපරම** කියා පුද්ගලයෝ සතර දෙනෙක් ලොව ඇත. සූර්යා උදා වූ විගස පිපීමට මේරූ මල මෙන් කෙටියෙන් ධර්මය කනට වැදුණ ගමන් අවබෝධ වෙන තරමට පාරමී ධර්ම පිරී ඇති අය **උග්ඝටිතඤ්ඤු** අයයි. හිරු උදාවී පැය ගානකට පසු පිපෙන මල වාගේ දීර්ඝ දේශනාවෙන් පසු හෝ මඟඵල නිවන් දකින අය **විපච්චිතඤ්ඤු** අයයි. දින කිහිපයකින් පිපෙන මල මෙන් බොහෝ කල් වීරිය වැඩීමෙන් මරණාසන්නව හෝ මඟ ඵල නිවන් ලබන අය **නෙය්‍යා** පුද්ගලයෝ ය. නොපිපි දිය යට ඇති මල් කැකුළු වතුරින් උඩට මතු වී නොපිපෙන මල් මෙන් මේ ජීවිතයෙහි නිවන් නොදකින පිරිස **පදපරම** ය. එවැනි අය නිවන් පතා දන, ශීල, භාවනා වශයෙන් මේ ජීවිතයෙහි සිදු කරන ලද කුසල ධර්ම මතු භවයකදී නිවන් දැකීමට හේතු වේ.

අප තුළ ආර්ය මාර්ගය වැඩී ඇති නැති බව පහසුවෙන් දැකිය නොහැකි ය. එය කලය තුළ ඇති පහණ මෙනි. අප්‍රමාද ප්‍රතිපදාවෙහි යෙදී මතු කර ගත හැකි ය. ආර්ය මාර්ගය වැඩී නිවන් දකින තුරු නැවත නැවත සසරෙහි උපදිමින් මැරෙමින් යාම සිදු වේ. පව් කළොත් නිවන් මඟ වරදී. අපා දුක් විඳීමට සිදු වේ. නිවන දක්වා යන ගමන සුවදායක වීමට නම්, ශීලයේ පිහිටා ධර්මය ඉගෙන සද්ධාවෙන් සහ නුවණින් කුසල් කරමින් නිවැරදි ප්‍රාර්ථනා කළ යුතු ය. පෘතග්ජන උපත අස්ථිර බැවින් ප්‍රාර්ථනාවෙන් තොරව දානාදී කුසල් කර, මිනිස් ලොව උපන්නත් මිසදිටු පවුලක වුවොත්, අප්‍රමාණ පවුකම් කර, අපාගත වී නිවන් මඟ වරදින බැවින් මිසදිටු නොවේවා යැයි පතමින් කුසල් කිරීම සුදුසු ය.

## ප්‍රඥාවන්තයෝ කළ ප්‍රාර්ථනා

සරද තාපසතුමා බුද්ධ ප්‍රමුඛ සඟ රුවනට සතියක් උපස්ථානය කර, ප්‍රඥාවන්තයන්ගෙන් අග්‍රව නිවන් දකිම්වා යි පතා, තවත් ජීවිත සතරකදී මත් වතුර නොබොම්වා, කිසිවෙකුට සෙනෙහසින් නොබැඳෙම්වා, ඉරිසියා නොකරම්වා, තරහා නොවෙම් වා යැයි පැතුවේ ය. කුසල බලයෙන් සියල්ල ලබා, නිවන් දුටු සේක.

## මහා කස්සප වූ වේදෙහ උපාසක

හැට අට ලක්‍ෂයක් රහතන් වහන්සේලා ඇතුළු බුදු රජාණන් වහන්සේට දන් දී, පඤ්ච ශීලය, උපෝෂථ ශීලය රැක, ධූතාංගධාරීන්ට අග්‍රව, නිවන් දකිම්ව යි පැතූ වේදේහ උපාසක කල්ප ලක්‍ෂයක් සුගති සැප විඳ පැතුම සපිරී නිවන් දුටු සේක.

**අග්‍ර නිවන් පතා.**

මතු බුදු සසුනක සියල්ලන්ට පළමුව අග්‍ර නිවන් දකිම්වායි පතා සත් දිනක් මහ දන් දී, තවත් ජීවිතයක එක කන්නයක අස්වනුවලින් නව වරක් අග්‍ර දන් දී අග්‍ර නිවන් පතා සැමට පළමුව කොණ්ඩඤ්ඤ නමින් අග්‍ර නිවන් දුටුවේ කල්ප ලක්‍ෂයක් සසර සැප විඳ ඉන් අනතුරුව ය.

**දිවැස් පතා පහන් පුද, නිවන් ලබා දුකින් මිඳී**

බුද්ධ ප්‍රමුඛ මහ සඟ රුවනට දින හතක් දන් පුද, නැත යන වචනය නොඇසේ වා, දුක්ඛිත ජීවිත නොලබම්වා යැයි පැතූ අයෙක් කල්ප ලක්‍ෂයක් සසර සැපත් විඳ, පැතුම් සපිරී අනුරුද්ධ නමින් සසර දුකින් මිඳුන සේක.

**උසස් කුලය පැතූ පිංවතා**

බුද්ධ ප්‍රමුඛ මහ සඟ රුවනට සත් දිනක් මහ දන් දී උසස් කුල සම්පත් පැතූ පිංවතෙක් ධර්මාසන පූජා කරමින්, ධර්මාසනවල ඇතිරිලි එලා, වටාපත් පුජා කර, ධර්ම කථික ස්වාමීන් වහන්සේලාට සත්කාර කර, රාත්‍රී බණ අසන විට පහන් දැල්වීමට තෙල් පුද, දන් වළඳන පසේ බුදු රජාණන් වහන්සේලාට ගල් ආසන පනවා, සසර ගමනේ පින් කරමින් චක්‍රවර්තී රජ ආදී අපමණ සැප කල්ප ලක්‍ෂයක් විඳ, භද්දිය නමින් රහත්ව උසස් කුලවතුන් අතර අග්‍ර වූ සේක. (එම නිසා නිවන් දකින තුරුම උසස් කුලවලම උපදිම්වා. කුලය නිසා මානාධික නොවී නිහතමානී වෙම්වා යී පැතීම සුදුසු ය).

**මිහිරි අඹ පිදූ කෝකිලයා**

පදුමුත්තර බුදු රජාණන් වහන්සේ ඇතුළු මහ සඟ රුවනට සත් දිනක් දන් දී, විපස්සී බුදු රජාණන් වහන්සේගේ කාලයේ කෝකිලයෙක් ව ඉපිද, බුදු රජාණන් වහන්සේගේ පාත්‍රයට මී අඹයක් පූජා කර, මිහිරි කොවුල් නාදය කර, බොහෝ පින් කර, මිහිරි කටහඬ ඇත්තන්ට අග්‍රව නිවන් දකිම්වායි පතා කල්ප ලක්‍ෂයකට පසුව පැතුම් සපිරී ලකුණ්ඨක භද්දිය නමින් නිවන් දුටු සේක.

**නිවන් සහිත සැපත් පතා, සැපත් ලබා දුකින් මිදී**

ඉහත කී පරිදි වීයසීවන්තයින් අතර අග්‍ර වෙම්වායි, සත් දිනක් දන් දී, නැවත ජීවිතයක බුදු රජාණන් වහ්නසේ නමකට කුටියක් පුදා, වටිනා රතු පලසක් පුදා, උපනුපන් තැන සිරුර පලසේ මෙන් රත් පැහැ වෙම්වා යි ද පතා, නිවන් පිණිස කුසල් කර අවසන් දිවියේ කෝටිපති පවුලක ඉපදී, රන්වන් සිරුරැතිව බිම පා නොතබා, පලස් මතින් ඇවිදීම නිසා, යටි පතුල්වලත් ලොම් සැදී, තුන් වසරක් සුවඳ කවන ලද ඇල් හාලේ බත් ම අනුභව කරමින් සිට සියලු සැප අතහැර සෝණ නමින් පැවිදිව යටි පතුල් පැලී ලේ ගලන තුරු බිම සක්මන් කර, බුදු උපදෙසින් වීරිය සමකර, නිවන් රස විඳිමින් පැතුම් සපිරූ සේක. (එබැවින් අලස නොවී නිවන් දකින තුරු වීරියවන්තයෙක් වෙම්වා යැයි පැතීම සුදුසු ය. කුසලට පසු නොබසිම්වා යි පැතිය යුතු ය.)

**ලැබීම පතා පිං කළ හැටි**

අතීතයේ පින්වතෙක් ලාභීන් අතර අග්‍රව නිවන් දකිම්වා යි. සත් දිනක් මහ දන් පුදා, පැතුවේ ය. තවත් දිවියක හැට අට ලක්‍ෂයක්

රහතන් වහන්සේලා ඇතුළු බුදු රජාණන් වහන්සේට කිරි පැණි පුද ලාභයෙන්, යසසින් අග්‍ර වෙම්වායි පැතුවේ ය. කල්ප ලක්‍ෂයකට පසුව, සීවලී නමින් රහත් ව, නිවන් ලබා, මිනිසුන් නැති මහ මුහුදේදී ද, මහ වන මැද, හිමාල වන මැද, පාණ්ඩව පර්වතයේ, අචිරවතී ගඟෙහි, ඡද්දන්න විල ලඟ, ගන්ධ මාදන පර්වතයේ දී, නුග ගහක් මුලදී, දෙවියන් ගෙන් මහා පුද සත්කාර ලැබ, ලාභීන්ගෙන් අග්‍ර වූ සේක. (දන් දී ලාභ සහිතව නිවන් පැතීම සුදුස ය.) මෙසේ නොකර සීවලී මහ රහතන් වහන්සේගේ රූපයට දුම් අල්ලා කිසිදින ලාභ නොලැබේ.

**(එබැවින් සසර වැඩීමට නොව, සසරින් මිදෙන තුරු දුකට පත් නොවීමටත්, නැවත නැවත දන් දීමටත් සසර ගමන සුවදායී වීමටත් ලැබීම පතා කුසල් කිරීම සුදුසු ය.)**

**වස්තු විනාශ නොවීමට පැතූ කෙනා**

අග්‍ර වූ ප්‍රණීත නිවන් පතා, පසේ බුදු රජාණන් වහන්සේ නමකට උක් පැණි පූජා කර, දෙව් මිනිස් සැප විඳ නැවත දිවියක බුදු මැදුරක් සාදවා, කෝටි ගණන් වස්තුව ධර්ම පූජා වශයෙන් පුද, මේ පිනෙන් මාගේ කැමැත්ත නැතිව රජුන්ටවත් මාගේ වස්තුව ගත නොහැකි වේවායි පැතූ පින්වතෙක් සසරේ අපමණ දෙව් මිනිස් සැප විඳ, අවසන දෙවියන් මැවූ සත් රුවන් මාළිගයක වැස, අජාත සත්තු රජු ඇතුලු යුධ සේනාවකටවත් ගත නොහැකිව ධර්ම බලයෙන්, පුන්‍ය ප්‍රාර්ථනා බලයෙන්, දේව බලයෙන් සුරැකී වස්තුව අතහැර, ජෝතිය නමින් නිවන් ලැබූ සේක.

## අපරාජිතගේ නොපැරදුණ පිංකම

ජෝතිය රහතන් වහන්සේ අපරාජිත නමින් බුද්ධ මන්දිරය කර වූ පිංකමට කොටස්කරුවීමට සිතූ එතුමාගේ ම නමින් යුතු අපරාජිත නම් බෑනා, මාමාගෙන් අවසර නොලැබූ බැවින් බුදු මැදුර නිමවූ පසු, ඒ ඉදිරියෙන් ධර්ම ශාලාවක් සාදවා, සත් රුවනින් ධර්මාසනයක් කරවා, රන් බැටළු රූප තබවා, ත්‍රිවිධ රත්නයට පූජා කර, සසර අපමණ දෙව් මිනිස් සැප ලබා, නිවනද ලැබී ය. පැතුම් සපිරුණු පුන්‍යවන්තයෝ මාතෘකාව යටතේ දැක් වූ අතීත සිටුවරයා මොහුය.

## ජෝතිය සිටුතුමාගේ මහා සම්පත්

දෙවියන් විසින් සාද දෙන ලද සත් මහල් ප්‍රාසාදය සත් රුවන්වලින් නිමවන ලදි. සත් රුවන් ප්‍රාකාර සතකි. එහි අතර කප් රුක් ය. සිවු කොනේ අවසන් නොවෙන නිධි කල සතරකි. සිවු කොනෙහි තල් ගස් හා උක් ගස් සතරකි. ඒවායෙහි කොළ මැණික්වලින් ද පුරුක් රනින් නිමවන ලදි. (පසේ බුදු රජාණන් වහන්සේට නිවන් පතා උක් පැණි පිදූ බව හැඟවීමට සංකේත වශයෙන් උක් ගස්ද, විපස්සී බුදු රජාණන් වහන්සේට බුදු මැදුර පුද, බණ ඇසීමට එන අයට ගැනීම සඳහා රත්රන් ද, බුද්ධ පූජා වශයෙන් මැණික් ගල් තැබූ බව හැඟවීම සඳහා ඒ බව දන්නා දෙවියන් උක් ගස් රනින් හා මැණික්වලින් මැවූහ. නිධි කල සතර සහ සත් රුවන්මය මාළිගය බුද්ධ මන්දිර පූජාවේ පුන්‍ය ඵල විපා වශයෙනි. විසි අටදහක් යක්ෂ සේනාව සමඟ අදෘශ්‍යමානව යක් සෙනෙවියන් සත් දෙනෙක් දොරටු සත මුර කළෝ ය.

බත් පිසීමට දර භාවිත නොවී ය. ජෝති පාෂාණ තුන මත සේදූ සහල් සැලිය තැබූ විට විදුලියෙන් මෙන් ගල් තුන දැල් වී බත ඉදුණු පසු

නිවී යයි. පහන් දැල්වීමක් නැත. මැණික් ආලෝකයෙන් මාළිගයෙහි අඳුර දුරු වේ. මේ සියලු සම්පත් සද්ධාදී පඤ්ච ධර්මයෙන් පරිවාරිත ප්‍රාර්ථනා සහිත චේතනාව ඤාණ සම්ප්‍රයුක්ත පුඤ්ඤාභි සංඛාර කුසලයන්ගේ ප්‍රතිවිපාකයි. නිවන සමඟ මේ සම්පත් පැතූ නිසා සම්පත්වලට නොබැඳී සුළු මොහොතින් සියල්ල අතහැර, පැවිදිව, රහත් බව ලබා, සියලු සංසාර දුකින් මිදුණ සේක.

එබැවින් තමන් සතු දේ තම කැමැත්ත නැතිව කිසිම බලවතෙකුට ගත නොහැකි වේවායි ප්‍රාර්ථනා කරගෙන සිතේ මසුරුකම් දුරලා, බලවත් පිංකම් කිරීම මැනවි. එවිට මුළු සංසාර ගමන අපරාජිතව ජෝතිමත් ව බැබලී නිවන් ආලෝකය ද ලැබිය හැකි ය.

විවේකය ඇති පරිදි දහවල් කාලයේත් සවස හයට තෙරුවන් වැඳ, හතේ සිට රාත්‍රී දොළහ පසුවෙන තුරු නොකඩවා ලිවීම නිසා දකුණත පුරා ඇති වූ දැඩි වේදනාව ඉවසා දරාගෙන ලිවීම් වශයෙන් මේ දහම් ගත සම්පාදනය කිරීමේ දී මා සිත තුළ පහළ වූ ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික කුසල චේතනා සංඛ්‍යාත පුඤ්ඤාභි සංඛාර බලයෙන්, එහි විපාක වශයෙන් මෙතැන් පටන් කිසිම බලවතෙකුට මාව මැඩලිය නොහැකි වේවා. රාග, ද්වේෂ, මෝහ, මාන, දිට්ඨියෙන් කම්පිත නොවෙම් වා. මැඩීමට අපහසු මාර බලය ඉතා පහසුවෙන් මැඩලිය හැක්කේ වෙම්වා. සෑම දෙයම වහා වටහා ගැනීමේ හැකියාව ලබම්වා. ඉතා සියුම් වූ, ගාම්භීර දහම් දැනීමේ ප්‍රඥාව ලබම්වා. දහම් ආලෝකය තුළින් සුබ ප්‍රතිපදාවෙන් නිවන් ආලෝකය ලබම්වා. නව මහා භවයෙන් ම එතෙර වෙම්වා.

# උප ග්‍රන්ථය

## නිවැරදි වූ පුන්‍ය ප්‍රාර්ථනා

ඔබ කරන හැම හොඳ වැඩකදී හෝ කරන හැම පිංකමක දීම පඤ්ච ශීලය හෝ ආජීව අෂ්ඨමක ශීලය හෝ පොහොය දින හෝ විශේෂ පිංකමක් කරන විට හෝ උපෝෂථ ශීලය සමාදම් වෙන්න. තනිව තමන් ම හෝ ස්වාමීන් වහන්සේ නමක් සිටී නම් ස්වාමීන් වහන්ස, අපට (මට) සිල් සමාදම් කරවන්න කියා හෝ සිල් සමාදම් කරවන සේක්වා කියා හෝ මෙසේ කීමට දිව නොනැමේ නම් ස්වාමීන් වහන්ස, අපට පන් සිල් ගන්න ඕනෑ. අපට සිල් සමාදම් වෙන්න ඕනෑ කියා සිතේ ඇති මාන්නය බිමින් තියා ඉල්ලන්න. එසේ ඉල්ලා සීලයක පිහිටාම කරන හැම පිංකමක් ම කරන්න. ඉන් පසු ඕපාදූප කතා නවත්වා හොඳ දේ පමණක් කතා කරමින්, එසේ නැති විට තමාගේ ප්‍රාර්ථනාව ගැනම සිත සිතා ශ්‍රමදාන, ප්‍රතිසංස්කරණ, නවකම්, සුද්ධ පවිත්‍ර කිරීම්, මිදුල්, සෑ මලු, බෝ මලු, පාරවල්, ධර්ම ශාලා, දාන ශාලා අමදින විට, දානය සඳහා අවශ්‍ය දේ ගේන්න යන විට, ඒවා සකස් කරන විට, දන් බෙදන විට, බුද්ධ පූජාව සකසන විට, ගෙන යන විට, තැන්පත් කරන විට, වඳින විට, පහන් දල්වන විට, පහන් සුද්ධ කරන විට, තෙල් දාන විට මේ ආදී සෑම පුන්‍ය ක්‍රියාවකදීම තමාගේ ප්‍රාර්ථනාව ගැන සිත සිතා එම වැඩ කරන්න. එම අවස්ථාවේ බැරි වුණොත් නොවැරදීම පසුව හෝ විවේකව හිඳ ඒ කළ සියලු දේ සිහි කර කටින් කියා යෝ සිතෙන් සිතා ප්‍රාර්ථනාව කරන්න.

ඒ කෙරෙහි විශ්වාසය තබන්න. එවිට නොඅඩුව සද්ධාව, ශීලය, ත්‍යාගය, ප්‍රඥාව ඔබ සිත තුළ වැඩේ. මේ පොත කියවීමෙන් හෝ මෙවැනි පොත් කියවීමෙන් හෝ අසා දැන ගැනීමෙන් දහම් දැනුම ඇති

වේ. ශීලයේ පිහිටා කරන ප්‍රාර්ථනාව ඉටුවෙන බව බුද්ධ දේශනාවට අනුව තේරුම් ගන්න. ශීලයෙන් තොරව කරන ප්‍රාර්ථනා අසාර්ථක බව දැන ගන්න.

දැන් මෙහි දැක්වෙන ප්‍රාර්ථනා හෝ මෙහි සඳහන් නොවෙන ඔබ කැමති වෙන, එහෙත් සසර දික් නොවෙන හොඳ ප්‍රාර්ථනා පමණක් කරන්න. අප මේ දිගු සසරේ නොවිඳි සැපයක් නැත. කාම සැප, සිටු සම්පත්, රජ සම්පත්, දිව සම්පත් පමණක් නොවේ උසස් වූ බ්‍රහ්ම සම්පත් විඳි අයයි. නමුත් අනිත්‍ය නිසා ඒ සියලු සම්පත් අද අහිමිව ඇත. භවයෙන් වැසී ඇති නිසත්, එය දැන ගැනීමට තරම් සිහිය හා නුවණ දියුණු නොකළ නිසා අපට නොපෙනේ. සිත දියුණු කළොත් දැන ගත හැකි ය. එවා දැකීම සඳහා ද පැතිය යුතු ය. ඒ සඳහාම යි මේ උපදේශය.

මෙතෙක් දිගු සසරේ නොවිඳි එකම සැපය නිවන් සැපය යි. එම නිවන් සැපය යන්තමින් හෝ විඳගනු ලැබුවා නම්, නුවණින් දුටුවා නම් එවැනි කිසිවෙක් භව සැප නොපතන්නේ ය. එබැවින් සෑමතැනදී ම, හැම පින්කමකදී ම ප්‍රධානම පැතුම අමා මහ නිවනම කර ගන්න. මේ පින නිවන් පිණිස හේතු වේවා යැයි ප්‍රාර්ථනා කරන්න.

කුසල් කර දෙව් සැප විඳින දෙවියන් සහ පව් කර අපා දුක් විඳින නිරය ප්‍රේත සත්වයන් දැක ගැනීමට දිවැස ලැබේවා යැයි පතන්න.

සසර ගමනේ විඳි අපමණ දෙව් මිනිස් සැප හා අපායවල දුක් විඳි අයුරු දැක ගැනීමට පෙර ජීවිත දකින නුවණ ලැබේවායි පතන්න. දෙවියන්ගේ සහ දුර ඇත්තාවූ ද ශබ්ද ඇසීමට දිව කන ලැබීමට පතන්න. විශම සමාජයේ සතුරු මිතුරු අය හඳුනා ගැනීමට අනුන්ගේ

සිත් දන්නා වූ නුවණ පතන්න.

තුන් ලෝකයේ ම ඇත්ත දැන ගන්න හා ජීවිතයේ සැබෑ යථාර්ථය දැන ගැනීමට විදර්ශනා ඥාණ ලැබේවායි පතන්න. නිවන් දැකීමට නොසුදුසු පින්කමක් නැත. එහෙත් සිල් රැකීමත්, සමථ භාවනාවත්, විදර්ශනා භාවනාවත් ප්‍රධානය. එය අනිවාර්ය්‍යයෙන් කළ යුතු ය.

දිවැස ලැබීමට ශීලයෙහි පිහිටා සමථ භාවනාව කරමින් තෙරුවන් උදෙසා පහන් ආලෝක පූජාව හා ඕනෑම කෙනෙකුට ආලෝක උපකරණ පූජා කිරීම, පරිත්‍යාග කිරීම වැදගත්.

පෙර ජීවිත දැකීමේ නුවණ ලැබීම සඳහා ශීලයෙහි පිහිටා, සමථ භාවනාවත්, දින පොත්, ලියන පොත් පෑන් පූජා කිරීම ආදිය විශේෂ යි.

දිව කන ලැබීමට ශීලයේ පිහිටා සමථ භාවනා කිරීම හා ශබ්ද පූජා කරමියි සිතා සාදුකාර දීම, අනුන්ට ඇසෙන්නට මිහිරි හඬින් දහම් දෙසීම, සූත්‍ර පාඨ ගාථා ශබ්ද නඟා සජ්ඣායනා කිරීම, මයික්‍රෆෝන, බෆල්, ඇම්ප් හෝන් ආදී ශබ්ද විකාශන උපකරණ සහ දුරකථන හෝ දුරකථන සඳහා කාඩ් පරිත්‍යාග කිරීම, පූජා කිරීම විශේෂ දේවල් වේ.

අනුන්ගේ සිත් දක්නා නුවණ සඳහා ශීලයේ පිහිටා සමථ භාවනා කිරීම, ගුප්ත ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීම හා ඇසුරු කරන විවිධ පුද්ගලයන්ගේ අදහස් හඳුනා ගැනීමට පුහුණු වීම ලබන කෙනාගේ අදහස් දැනගෙන ඒ කැමති දේ දැනගෙන දන් දීම සුදුසු වේ.

ප්‍රිය දේ ලබම්වා. කැමති දේම ලබම්වා. අග්‍රදේ ම ලබම්වා. උතුම් දේම ලබම්වා යැයි ප්‍රාර්ථනා කරමින් කැමති දේ, ප්‍රිය දේ, අග්‍ර දේ, උතුම් දේ දිය යුතු යි.

මම සියල්ලන්ටම ප්‍රිය වේවා. සියලු දෙනා මට ප්‍රිය වේවා යි පැතීම සුදුසුයි. එහෙත් ඒ ප්‍රියභාවය රාගයෙන්, තෘෂ්ණාවෙන් නොවේවා යි පැතීම සුදුසු යි. ප්‍රිය දේ දන් දීමෙන් හා අනුන් ප්‍රිය වන අයුරින් කටයුතු කිරීම කළ යුතු දේ ය. උදාහරණයක් වශයෙන් ඔබේ සැමියා, බිරිඳ, මව්පියෝ, ස්වාමීන් වහන්සේ නමක් හෝ ඔබ සේවය කරන තැන ප්‍රධානියෙක් හෝ ඔබ යම් බඳු ඇඳුමක් ඇඳගෙන එනවාට කැමති නම් ඔබ අකමැති වුණත් අන්‍යයා ප්‍රිය කරන, කැමති වෙන ඇඳුම ඇඳගෙන යාමෙන් ඒ කෙනා සතුටු වේ. ඔබට ප්‍රිය කරනු ඇත. ඔබ එයට ප්‍රතිවිරුද්ධ ලෙස ඇඳුම් ඇඳගෙන ගියොත් ඒ අයට ඔබව මෙලොවම අප්‍රිය වී අන්‍යයාට අප්‍රිය වන සේ ක්‍රියා කිරීම නිසා සසර ගමනේදීත් ඔබව අනුන්ට අප්‍රිය අයෙක් වේ. ප්‍රිය වචන කතා කිරීමද, කව්රුත් ප්‍රිය කරන මල්වර්ග පූජා කිරීමද (නෙළුම්, දෑසමන් ආදිය) සුදුසුය.

නිවන් දකින තුරු රාගයෙන් ද්වේශයෙන් මෝහයෙන් පීඩාවක් නොවේවා යැයි ප්‍රාර්ථනා කළ යුතු යි. ඕනෑම පින්කමක් කර එසේ පතමින් විරාගී හැඟුමින් අසුභ භාවනා කිරීම, මෛත්‍රී භාවනා කිරීම, අසන දකින දෙයෙහි යථාර්ථය දකිමින් අනිත්‍යාදි වශයෙන් සිතමින් විදර්ශනා කිරීම විශේෂ පින්කම් වේ.

මොන කුලයක උපන්නත්, මොන තනතුරක් ලැබුවත් මාන්නයෙන් උඩඟු නොවෙම්වා යැයි පැතුම සුදුසුයි. පින් කර එසේ පතන අතරම නිහතමානී වීමත් මාන්නයේ ඇති ආදීනව සිතීම වැදගත්

වේ.

උපනූපන් තැන ප්‍රඥාවන්තයෙක් වෙම්වා යැයි පැතීම සුදුසුයි. ඕනෑම පින්කමක් කර පතමින් ඒ සඳහා ඉදිකටු, කතුරු, පිහියා ආදී ආයුධ පරිත්‍යාග කිරීම, ධර්මය කියාදීම, දහම් පොත් පූජා කිරීම, තමන් දන්නා වූ ශිල්ප ශාස්ත්‍ර අනුන්ට කියාදීම සහ නොදන්නා දේ අස අසා දැන ගැනීම ඒ සඳහා කළ යුතු දේ වන අතර විදර්ශනා භාවනාව විශේෂයි.

නිවන් දකින තුරු මිසදිටු නොවෙම්වා යැයි පැතිය යුතු යි. පින් පවු නොදන්න අයට කියා දීම අනුන් වැරදි දෘෂ්ටිවලින් මිදවීම නිවැරදි ධර්මය ප්‍රගුණ කිරීම හා සම්මා දිට්ඨිය ඇති වීමට දහම් පොත පත පරිත්‍යාග කිරීම ආදිය විශේෂ පින්කම් වේ.

සතුන් මරා ජීවත්වන, පවු කරන පවුලක, පෙදෙසක නොඉපදෙම්වා යැයි පැතීම උතුම් වේ. ඒ අනුව පස් පවින් වෙන් වී පන්සිල් රැකීම හා වෙනත් පින්කම් කර පැතීම සුදුසු ය.

පහත් කුලයක නොඉපදෙම්වා කියා පතමින් පහත් වැඩ නොකිරීමද, පුටු ආදී ආසන පූජාවද, සිල්වත් ගුණවත් වැඩිහිටි අයට ගරු බුහුමන් දැක්වීම, ධර්මයට විනයට නීතියට ගරු කිරීම කළ යුතු ය. ස්වාමීන් වහන්සේලා, ගුරුවරු, මව්පියන් එනවා දකින විටම අසුනින් නැගිටීම, එවැනි උතුමන් වාඩි වූ පසු තමන් වාඩිවීම, එවැනි උතුමන් සමඟ යන විට තමන් පසුව යාම, වාහනයකින් යන විට එවැනි උතුමන්ට සුදුසු අසුන දීම, ස්වාමීන් වහන්සේලා සමඟ පුද්ගලික ගමනක් යන විට ස්වාමීන් වහන්සේ වාහනයට නඟින්න පෙර තමන් නොනැඟ සිට ස්වාමීන් වහ්නසේලා වාහනයට ගොඩ වී වාඩි වූ පසු තමන් ගොඩවීම ආදී ආචාර ධර්ම පුරුදු කිරීම උසස් කුලවල

ඉපදීමට හේතුවන අතර යම්තම් ආවාට ගියාට නොකර නැවත නැවතත් බොහෝ සෙයින් උසස් පින්කම් කිරීම සුදුසු ය.

සතෙක් මරණ සිතක් ඇති නොවේවා. අනුන් සතු දෙයක් සොර සිතින් ගන්නෙක් නොවෙම්වා. අන් පුරුෂයන් සහ අන් බිරියන් සමඟ සිතින්වත් එක්වීමක් නොවෙම්වා. බොරු කේළාම් පරුෂ වචන කියන්නෙක් නොවෙම්වා යැයි පතමින් ඊට අනුරූපව ජීවත් විය යුතු යි.

සාරිපුත්ත මහරහතන් වහන්සේ මෙන් නිවන් දකිනතුරු මත් වතුර බොන්නෙක් නොවෙම්වා යි පැතිය යුතු යි. සාරිපුත්ත මහ රහතන් වහන්සේ පෙර ජීවිත සතරකදී ප්‍රාර්ථනා සතරක් කළ සේක. පෙර රජව සිටි විට නොසන්සිඳෙන ආශා ඇති අග බිසොවුන් හැට හතර දෙනෙක් සමඟ සම්බන්ධකම් පවත්වා පුරෝහිත වූ බෝධිසත්වයන් වහන්සේ පොළඹවා ගන්න බැරිවූ තැන රජුට බොරු කේළාම් කියා පුරෝහිතතුමාට දඬුවම් කරන්න ගොස් පසුව ඇත්ත වටහාගෙන හැට හතර දෙනා මරා දේවියට දඬුවම් දෙන්න හදන විට ඇත්ත වටහා ගැනීමෙන් පසු පුරෝහිත වූ බෝධි සත්වයන් වහන්සෙගේ උපදෙසින් ඒ සැම දෙනා කෙරෙහි මැදහත්ව එදා ඊරිසියා කරන්නෙක් නොමවෙම්වා යැයි පැතූ පැතුම නිවන් දකින තුරුම ඉටු විය.

තවත් ජීවිතයක ඉපිද සුරාවෙන් මත්ව තම පුතාගේ මස් උයවාගෙන කාලා මත සිඳුණ පසු නැවත කිසිදා මත් වතුර නොබොම්වා යැයි කළ පැතුම අනුව රහත් වූ ජීවිතය දක්වාම මත් වතුර බීවේ නැත.

තවත් ජීවිතයක රජව තදින් ඇලුම් කළ සිය පුතාගේ අකල්

මරණයෙන් දැඩි ශෝකයට පත්ව මෙතැන් පටන් කිසිවෙකුට සෙනෙහසින් නොබැඳෙම්වා යැයි පැතුවේ. ඒ පැතුම අනුව රහත් වූ ජීවිතය දක්වාම කිසිවෙක් සමග සෙනෙහසින් බැඳුනේ නැත.

අරක තාපසව සත් අවුරුද්දක් මෛත්‍රී භාවනාව වඩලා කල්ප හතක් බ්‍රහ්ම ලෝකයේ සිටි නිසා ක්‍රෝධ නොකරන්නෙක් විය. නිවන් දකින තුරු ඉරිසියා නොකරමි. මත් වතුර නොබොමි. ක්‍රෝධ නොකරමි. කිසිවෙකුට සෙනෙහස නම් වූ තෘෂ්ණාවෙන් නොබැඳෙම් යැයි අධිශ්ඨානශීලීව පතන්න. ඒ අනුව කටයුතු කරන්න. එවිට නිවන් දකින තුරු සසර ගමන සුවදායක වූ ශාන්ත ගමනක් වේ.

කාමයන්ට වසඟ නොවෙම්වා. නිවන් දකිනතුරු බ්‍රහ්මචාරී වෙම්වා යැයි නැවත නැවත පතා කුසල් කළොත් නිවන ඉතා ළඟ වේ. එතරම් ඉක්මණට නිවන් ලබනු කැමති නොවේ නම් විවාහ වන තුරු කුමර බඹසර, කුමරි බඹසර වශයෙන් බ්‍රහ්මචාරී වෙම්වා යි පැතිය යුතු යි.

සසර ගමනේ ස්ත්‍රී පුරුෂ බව ද අස්ථිර ය. එබැවින් ස්ත්‍රී භාවය පිළිකුල් කෙරේ නම් කුසල් කරන වාරයක් පාසා ස්ත්‍රී භාවයට නොපැමිණෙම්වා යි පතමින් වැඩි කලක් බ්‍රහ්මචාරී වීමත්, පර පුරුෂ, පර ස්ත්‍රී සේවනයෙන් වැළකී පුරුෂ ආකල්ප පුරුදු කිරීම මැනවි.

ලස්සන, පියකරු රූපයක් ලබම්වා. එහෙත් මාගේ රූපය දැක කිසිවෙකුගේ සිත රාගයෙන් නොදැවේවා. මා කෙරෙහි කිසිවෙකුට රාගයක් ඇති නොවේවා යැයි පැතීම සුදුසුය. ඒ සඳහා සිල් රැකීම, සද්ධාවෙන් දන් දීම, මල් පූජාව, චීවර පූජාව, වස්ත්‍ර පරිත්‍යාගය, පාරවල්, සෑ මලු, බෝ මලු ආදී පුද බිම් ඇමද පිරිසිදු කිරීම, පුදබිම්, දැගැබ් විහාර කුටි ශාලා ආදිය තීන්තවලින් වර්ණාලේප කිරීම් ආදී සුදුසු පින්කම් වේ.

සතුන්ට කෑම දෙන විට මේ සත්තු කුස ගින්න නිවා ගනිත්වා. මගේ දුක් ගිනි නිවේවා. මේ සත්වයෝ කුසගිනි දුකින් මුදවනවා වාගේ මොවුන් සසර දුකෙන් මුදවන්නට ද ලැබේවා කියා ද, ඕනෑම කෙනෙකුට කෑම බීම දෙන විට මෙසේ පැතීම සුදුසු ය.

සුවඳ පුදා, ධර්මය කියා දී, ධර්මය සජ්ඣායනා කර, සුවඳ මල් පුදා, අන් අය පින්කම්වල යෙදවීම පිණිස එහි ආනිසංස කියා දී කටින් මානෙල් මල් සුවඳ විහිදේවා යි පැතිය යුතු බුද්ධ උපස්ථාන වතාවත් කර කයින් සඳුන් සුවඳ විහිදේවා යි පැතීම සුදුසු ය.

ස්වාමීන් වහන්සේලාට හෝ ඕනෑම කෙනෙකුට ගිලන් උපස්ථාන කරමින්, බෙහෙත් ලබා දෙමින් නිරෝගී බව පැතීමද ඉතාමත් සුදුසු ය. මිහිරි දේ දෙමින් මිහිරි කටහඬ පැතීම සුදුසු ය.

මෙකී නොකී ප්‍රාර්ථනා සියල්ල සසර වැඩීම පිණිස නොවේ. මට වහා නිවන් අවබෝධ වේවා. එතෙක් සසර වසන බැවින් සසර වසන තුරු නිවන් දකින තුරු සසරට නොබැඳී නිශ්සරණාධ්‍යාශයෙන් ප්‍රාර්ථනා කළ යුතු ය. හේතුව සියල්ල අස්ථිර බැවින් ලැබූ දේ නැති වෙන විට දුකට පත් වේ. ලැබූ දේ අනුව මාන්නය ඇති වේ. භව සැපතට ඇලුණොත්, බැඳුණොත් අතහැරීම අමාරු ය. මේ පොත කියවා වැරදියට ගෙන විවේචනය කරමින් අකුසල් සිදු නොකර ගත යුතු යි. කැමති අය පමණක් ප්‍රාර්ථනා තබා ගන්න සංඛාරුප්පත්ති සූත්‍රය වූ බුද්ධ දේශනාවට අනුව හේතු උදාහරණ පෙන්වා ඇත. ගත යුතු දේ ගැනීමට හොඳ නුවණම ඔබට ලැබේවා.

**''පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහි''**

## ප්‍රාර්ථනා වාක්‍යයක්

මේ කුසලයෙන් මාගේ කෙළෙස් ගිනි නිවේවා. සසර දුක් ගිනි නිවේවා. මඟ ඵල නිවන් ලබම් වා. එතෙක් සසර වසනා තුරු රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන්, මාන්නයෙන්, ඉරිසියාවෙන් පීඩාවක් නොවේ වා. මිසදිටු නොවේවා. සා පිපාසය නොම වේවා. කාය චිත්ත පීඩාවක් නොවේවා. අප්‍රිය ඇසුර නොමවේවා. කිසිවෙකුට, කිසිදෙයකට තණ්හාවෙන් නොබැඳෙම් වා. පස් පව්, දස අකුසල් නොකරන්නෙක් වෙම් වා. නැත යන වචනයවත් අහන්න නොලැබේ වා. නිදුක් නිරෝගී වෙම් වා. මා සැමට ප්‍රිය වෙම් වා. සියල්ලෝ මට ද ප්‍රිය වේවා. කරුණාවෙන්, මෛත්‍රියෙන්, ප්‍රඥාවෙන් යුක්ත වෙම් වා. මුවින් මල් සුවඳ, කයින් සඳුන් සුවඳ විහිදේ වා. මිහිරි කටහඬ ලබම්වා. ප්‍රිය වචන ඇත්තෙක් වෙම් වා. කුසලට පසු නොබසිම් වා. දිවැස ලබම් වා. අනුන්ගේ සිත් දැකිය හැකි වෙම් වා. දිව කන ලබම්වා. පෙර ජීවිත දකිම් වා. මාගේ ජීවිතයෙන් සිල් සුවඳ, ගුණ සුවඳ විහිදේ වා. මාරයාටවත් මාව මැඩලිය හැකි නොවේ වා.

### පුණ්‍ය තේජසින් ලැබෙන ආයුෂ

01. මිනිස් ලොව :- ස්ථිර නැත. අකුසල් අධික වන විට දශ වර්ශයට බසී. කුසල් අධික වන විට අසංඛ්‍ය දක්වා වැඩි වේ.

02. චාතුර්මහා රාජික දෙවියන්ට :- අපගේ අවුරුදු 50ක් එහි එක් දිනයකි. දිව්‍ය වර්ෂ 500කි. මිනිස් වර්ෂවලින් 90,000,000 (අනූ ලක්‍ෂයකි) කි.

03. තාවතිංස දෙවියන්ට :-අපගේ අවුරුදු 100ක් එහි එක් දිනයකි. දිව්‍ය වර්ෂ දහසකි. මිනිස් වර්ෂවලින් 3,6000,000 (තුන් කෝටි හැට ලක්‍ෂයකි) කි.

04. යාම දෙවියන්ට :-අපගේ අවුරුදු 200ක් එහි එක් දිනයකි. දිව්‍ය වර්ෂ දෙදහසකි. මිනිස් වර්ෂවලින් 14,40,00000 (දහතර කෝටි හතලිස් ලක්‍ෂයකි) කි.

05. තුසිත දෙවියන්ට :-අපගේ අවුරුදු 400ක් එහි එක් දිනයකි. දිව්‍ය වර්ෂ හාර දහසකි. මිනිස් වර්ෂවලින් 57,60,00000 (පනස් හත් කෝටි හැට ලක්‍ෂයකි) කි.

06. නිම්මාණරති දෙවියන්ට :-අපගේ අවුරුදු 800ක් එහි එක් දිනයකි. දිව්‍ය වර්ෂ අට දහසකි. මිනිස් වර්ෂවලින් 2,30,40,00000 (දෙසිය තිස් කෝටි හතලිස් ලක්‍ෂයකි) කි.

07. පරනිම්මිත වසවත්තී දෙවියන්ට :-අපගේ අවුරුදු 1,600ක් එහි එක් දිනයකි. දිව්‍ය වර්ෂ දහසය දහසකි. මිනිස් වර්ෂවලින් 92,160,00000 (නවසිය විසි එක් කෝටි හැට ලක්‍ෂයකි) කි.

08. බ්‍රහ්ම පාරිසජ්ජ දෙවියන්ට :- කල්පයෙන් තුනෙන් එකකි.
09. බ්‍රහ්ම පුරෝහිත දෙවියන්ට :- කල්පයෙන් භාගයකි.
10. මහා බ්‍රහ්මයන්ට :- එක් කල්පයකි.
11. පරිත්තාභ බ්‍රහ්මයන්ට :- කල්ප දෙකකි.
12. අප්පමාණාභ බ්‍රහ්මයන්ට :- කල්ප සතරකි.
13. ආභස්සර බ්‍රහ්මයන්ට :- කල්ප අටකි.
14. පරිත්තසුභ බ්‍රහ්මයන්ට :- කල්ප දහසයකි.

15. අප්පමාණසුභ බ්‍රහ්මයන්ට :- කල්ප තිස් දෙකකි.
16. සුභකිණ්ණ බ්‍රහ්මයන්ට :- කල්ප හැට හතරකි.
17. වේහප්ඵල බ්‍රහ්මයන්ට :- කල්ප පන්සියකි.
18. අවිහ බ්‍රහ්මයන්ට :- කල්ප දහසකි. (1,000)
19. අතප්ප බ්‍රහ්මයන්ට :- කල්ප දෙදහසකි. (2,000)
20. සුදස්ස බ්‍රහ්මයන්ට :- කල්ප හාර දහසකි.(4,000)
21. සුදස්සි බ්‍රහ්මයන්ට :- කල්ප අට දහසකි. (8,000)
22. අකනිට්ඨ බ්‍රහ්මයන්ට :- කල්ප දහසය දහසකි. (16,000)
23. ආකාසානඤ්චායතන බ්‍රහ්මයන්ට :- කල්ප විසි දහසකි. (20,000)
24. විඤ්ඤාණඤ්චායතන බ්‍රහ්මයන්ට :- කල්ප හතලිස් දහසකි. (40,000)
25. ආකිඤ්චඤ්ඤායතන බ්‍රහ්මයන්ට :- කල්ප හැට දහසකි. (60,000)
26. නෙවසඤ්ඤා නසඤ්ඤායතන බ්‍රහ්මයන්ට :- කල්ප අසූ හතර දහසකි. (84,000)

**කල්ප විභාගය**

ආයු කල්පය - අන්තර කල්පය - අසංඛ්‍ය කල්පය - සංවට්ට කල්පය - විවට්ට කල්පය - සංවට්ඨායී කල්පය - විවට්ඨායි කල්පය - මහ කල්පය.

01. ආයු කල්පය - එක් එක් සත්වයන්ගේ ජීවත් වන ඒ ඒ කාල වකවානුවට අයත් ආයුෂ ප්‍රමාණ ය.

02. අන්තර කල්පය - මිනිස් ලොව දශ වර්ෂයේ සිට අසංඛ්‍ය දක්වා

ආයුෂ වැඩී නැවත දස වර්ෂය දක්වා ආයුෂ අඩුවෙන කාලය එක් අන්තර කල්පයකි.

03. අසංඛ්‍ය කල්පය - මෙසේ අන්තර කල්ප විස්සක කාලය එක් අසංඛ්‍ය කල්පය කි.

03.1 සංවට්ට කල්පය - ලෝක විනාශය ආරම්භ වී වසින අවසන් වැස්සේ පටන් අන්තර කල්ප විස්සක්ම වැසි නැතිව පවතී. පැවති ග්‍රහ ලෝක ගිනි ගනී. මෙසේ වූ අනතඃ කල්ප විස්ස සංවට්ට කල්පයයි.

03.2 සංවට්ඨායි කල්පය - මෙසේ ගිනිගෙන විනාශ වී, නැවත ලෝකය හට ගැනීමට වසින පළමු වැස්ස දක්වා වු අන්තර කල්ප විස්සක කාලය සංවට්ඨායි කල්පයයි.

03.3 විවට්ඨ කල්පය - පළමු වැස්සේ පටන් ක්‍රමයෙන් ලෝකය නැවත සෑදී හිරු සඳු පහළවීම දක්වා වූ අන්තර කල්ප විස්සක කාලය විවට්ඨ කල්පයයි.

03.2 විවට්ඨායි කල්පය - සඳ හිරු පහළවීමේ පටන් නැවත ලෝක විනාශය, ආරම්භය දක්වා ලොව පවතින අන්තර කල්ප විස්සක කාලය විවට්ඨායි කල්පයයි.

04. මහා කල්පය - මෙවැනි අසංඛ්‍ය කල්ප හතරක් වූද, අන්තර කල්ප අසූවක කාලය මහා කල්පය යි. මෙම මහා කල්පවලින් බ්‍රහ්ම ලෝකවල ආයුෂ සහ පාරමී පුරණ කාලය ගණන් ගනු ලැබේ.

**ලෝක විනාශය සහ සත්ව විනාශය**

වෙනස් වන ලෝකයේ අනිත්‍යතාවය අනුවත්, සත්වයන්ගේ අකුසල් බලපෑම නිසාත්, ලෝක විනාශය සිදු වේ. මේ ආකාශ ලෝකය සත්වයන්ගේ රාග උත්සන්නතාවයෙන් ගින්නෙන් ද, ද්වේශ උත්සන්නතාවයෙන් ජලයෙන් ද, මෝහ උත්සන්නතාවයෙන් වාතයෙන් ද විනාශ වේ.

සත්වයන්ගේ ලෝභ උත්සන්නතාවයෙන් දුර්භික්ෂයෙන් ද, ද්වේශ උත්සන්නතාවයෙන් ආයුධවලින්ද, මෝහ උත්සන්නතාවයෙන් ලෙඩ රෝගවලින් ද සත්ව විනාශය වේ.

රාගාධිකකමෙන් පිතද, ද්වේශාධිකකමෙන් වාතය ද, මෝහාධිකකමෙන් සෙම ද, කිපී ශරීර ලෝකය විනාශ වේ. මේ තුන් හේතුවෙන් ම චිත්ත ලෝකය කෙළෙසේ.

**දැන හෝ නොදැන කරන මහා පාපය.**

රහත් උතුමෝ උපතක් නොලබා තෙල් සිඳී ගිය පහන් දැල්ල මෙන් කෙළෙස් ගිනි කඳ නවී සිසිල් බවට පත් වී නිවී සැනසෙන්නෝ ය. අනාගාමී උත්තමයෝ සුද්ධාවාස බඹලොව උපත ලබා එහිදීම නිවී සැනසෙන්නෝ ය. සකදාගාමී උත්තමයෝ එක් වරක් පමණක් කාම භවයේ උපත ලබා ඉන් පසු රහත් බව දක්වා දියුණු වී නිවී සැනසෙන්නෝ ය. සෝතාපන්න උත්තමයෝ උපරිම වශයෙන් සත් වරක් කාම භවයේ ඉපිද දුක් කෙළවර කර නිවී සැනසෙන්නෝ ය. ධ්‍යාන ලාභීහු එම ධ්‍යානයට අනුරූප බඹ තලවල උපදින්නෝ ය. සෙසු අනන්ත අප්‍රමාණ සත්වයන් අතර නැවත නැවත බලවත් කුසල් කර

සද්ධාදී පඤ්ච ධර්ම දියුණු කළ අය සඞ්ඛාරුප්පත්ති දේශනාවට අනුව ප්‍රාර්ථනා තැබුවෝ පැතූ තැන්වල උප්පත්ති ලබන අතර අනෙක් පෘතග්ජන සියලු සත්වයෝ කර්මානුරූපව උපත ලබන්නෝ ය.

නිවන් ලැබීම යනු කෙළෙස් නසා උප්පත්තිය වළකාලීමයි. උප්පත්තිය නැති කළ විට ජරා, මරණාදී සියලු දුක් රැස සන්නිඳේ. ඒ උප්පත්තිය නැති කරන්නේ අරිහත් මාර්ග ප්‍රඥාව සහිත සිත ඉපදවීමෙන් මයි. ඒ හැර වෙන මොන ම ක්‍රමයකින්වත් උප්පතිතිය නැවතිය නොහැක. ගලාගෙන යන දිය පාරක් එක් පැත්තකින් නවතන විට වෙනත් පැත්තකින් ගලාගෙන යයි. නොකඩවා එන කුඹී රැළක් නැවතූ විට වෙනත් පැත්තකින් පාර හදාගෙන එයි. එමෙන් කෙනෙකුගේ උපතක් වැළැක් වූ විට නොඉපදී සිටීමක් නැත. වෙනත් කොතැනෙක හෝ ඉපදීම සිදු වේ. එය වැළැක්විය නොහැක

බොහෝ බලාපොරොත්තු ඇතිව යමෙක් යම් ගමනක් යනවා අතරමගදී කවුරු හෝ ඔහුගේ ගමන වළක්වනවා. ඔහුගේ සිතට ඇති වෙන්නේ නොසතුටක් නම් ඒ ද්වේශ සහගත අකුසල් සිතකි. බලාපොරොත්තු කඩවීම අතරමංවීම නිසා සිත නොසන්සුන් වේ නම් එවිට මෝහ මූලික සිත් හෝ උද්දච්චය සමඟ යෙදෙන ද්වේශ සහගත සිතම විය හැකි ය. බලාපොරොත්තු ගමන ගැනම සිත සිතා සිටීමෙන් ලෝභ සහගත සිත්ම උපදී. තමන් යන ගමන වැළැක්වූවන් කෙරෙහි මෙත් කරුණා සිත් පහළ නොවේ. ඇතිවන්නෙම අමනාපයක්, තරහක්, වෛරයක්මය. ඒ අකුසල් සිත්ම ය. එමෙන් යම් උපතක් කරා ඇදී යන සත්වයාගේ උපතට බාධා පැමිණවීමෙන්උපත බලාපොරොත්තුවෙන් සත්වයාගේ සිතේ ඇති වෙන්නේ ද උපත වැළැක්වූවන් කෙරෙහි ඇති වෙන්නේ නොමනාපයක්, තරහක්, වෛරයක්ම ය.

සසර ගත සත්වයෝ බොහෝ සෙයින් ඔවුනොවුන්ට බැඳී පවත්නෝ ය. එබැවින් මතු භවයෙත් සසර පුරාමත් මව්පියන් වී දරුවන් වී අඹු සැමියන් වී එකතුවීමට පතති. මෙසේ පැතුවත් මවුපියන් පතා මැරෙන දරුවෝ එම මවුපියන්ට දරුවන්ව උපදින්න එන විට එම මව්පියෝ දරු උපත් සීමා කරගෙන නැවත දරු උපත් සිදු නොවන ලෙස කටයුතු කර ඇත්නම් වෙනත් අයට දරුවන් ව උපදී. එහෙත් එම මව්පියන්ට දරුවීමට එන සත්වයාට උපදින්න නොදී බාධා පැමිණ වූ විට එම සත්වයාගේ බලාපොරොත්තු කඩවීමෙන් නොසතුටු සිතක් හරහා වෛර සිතක් පහළ වූවා නම් ඊළඟට එම අකුසල් සිතේ ප්‍රත්‍ය ලැබ උපතක් සිදුවන්නේ දුගතියේ ය. අකුසල් සිතින් සුගතියක් වන මිනිස් ලොව උපත නොවන බැවින් ය.

මෙලෙසින් බොහෝ දෙනා දරු උපත් වළක්වමින් වඳ කරගෙන ඉන්න විට බෞද්ධයෙක් මැරී නැවත බෞද්ධයෙකු වී උපත කරා යන විට බෞද්ධ මව්වරුන්ගේ කුසට පිවිසීමේ දොරටු වැසී ඇත්නම් ඉඩ තිබෙන අබෞද්ධ මව් කුසකට පිවිසීමට සිදුවේ. එවිට ඔහු අසරණව අතරමංව මිත්‍යා දෘෂ්ඨියට වැටෙන අතර ඉපදී වැඩුණ දා පටන් මිත්‍යා සංකල්පයෙන් ගොඩ නැඟුන සිතින් බෞද්ධයාට බුදු දහමට පමණක් නොවේ පෙර තමන්ගේම ඥාතීන්ට වෛර කරන්නෙක් වේ.

දුගතියේ යක්ෂ, ප්‍රේත, භූත, පිසාචව උපන්නොත් ඔවුන්ට පෙර ජීවිතත් පෙර ඥාතීන් දැකිය හැකි බැවින් තම මිනිස් උපත වැළකීම නිසා සිත වික්ෂිප්ත වී අකුසල් සිත් පහළ වී එවැනි දුගති උපතක් ලැබීමෙන් පසු මිනිසාට, තම ඥාති හිතවතුන්ට හිරිහැර කරදර විපත් ආදියද ඇති කළ හැක. මිනිස් භවයේ උපදින්න මව් කුසක් නැතිව අකුසල් සිත් පහළ වී තිරිසන් සතුන් අතර ඉපිද මිනිසාට ද්‍රෝහීකම් කිරීමට පෙළඹේ. මිනිස් මව් කුස හරහා සුගති භවයට එන්න සිටින

පුණ්‍යවන්තයන්ගේ උපත වැළැක්වීම නිසා සසරේ බොහෝ කල් එවැනි අයට පින්වත් දරුවන් නොලැබීමටද හේතු වේ. කෙසේවත් දරුවන් නොලැබීමට හෝ ලැබුණත් පින් මඳ, අවාසනාවන්ත සත්වයෝ දරුවන්ව ඉපදීමට ඉඩ ඇත.

නිවනක් ගැන නොදැන භව සැපතට ගිජුව භව සැප සොයා එන සත්වයාගේ උපත වැළැක්වීම් වශයෙන් වඳකර ගැනීමත්, දරු ගැබ විනාශ කිරීමත්, මහත්ම පාපයකි. ගබ්සා කිරීම නම් වූ මහා පාපයෙන් සසර ගමනේ සෑම තැනදීම සතුරන් ඇති වීමට හේතු වේ. ගබ්සාවෙන් විනාශ වෙන සත්වයාට මව්කුස තුළදීද සිත් හා සිතුවිලි පහළ වේ. ජීවිතයට ඇලුම්කරන සත්වයෝ වෙනත් අයගේ උපක්‍රමයෙන් මැරෙන විට තමාට දුක් දී මරණ කෙනා කෙරෙහි කිසිදා කරුණා මෙත් සිතක් නූපදී. වෛර සිතක් ම උපදී. එබැවින් එම වෛර කිරීමේ කර්ම බලයෙන් සසර ගමනේ දී ඉඩ ලැබුණ ලැබුණ තැනදී වෛරයෙන් පළිගනී. විපත් කරදර ඇති කරයි. එසේ වෛරයෙන් පළි ගැනීම විපත් කරදර පැමිණ විට දුක් පීඩා ගෙනදීම අමනුෂ්‍යයන් වී හෝ තිරිසනුන් වී හෝ මිනිසුන් වී හෝ තමාගේම මව්පිය දූ දරු සහෝදර නෑයන් වී හෝ අඹු සැමියන් වී හෝ සිදු විය හැකි ය.

මෙසේ දිනපතා කෝටි ගණන් සතුන් මැරීමේත්, ගබ්සා කිරීමේත් කිසි වෙනසක් නැත. ප්‍රාණඝාත අකුසලයම යි. දරු උපත් වැළැක්වීම ප්‍රාණඝාතයක් නොවුණත් එයින් සිදුවන්නේ භව සැපත සොයා එන සත්වයාගේ සුගති උපතට බාධා කිරීම නිසා තමාට සුගතිය අහිමිවීම හා දරු උපත වැළැක්වීමෙන් තමන් කරන්නේ දරුවන් ප්‍රතික්ෂේප කිරීමයි. ඒ හේතුවෙන් සසර ගමනේ දරුවන් නොලැබීමද කර්ම නියාමයට අනුව සිදු විය හැක. එපමණක් නොව තෙරුවන් සරණ ගොස් යම්තමින් හෝ සම්මා දිට්ඨියේ පිහිටි අයට මැරී නැවත

උපදීමට හොඳ මව්කුසක් නැති වෙන විට මිත්‍යා දිට්ඨික මව් කුස තුළ ඉඩ ඇති බැවින් බොහෝ සෙයින් එවැනි උපත් ලබා මිසදිටුවන් වීමෙන් මිසදිටු පිරිස වැඩි වී හොඳ පිරිස අඩු වී මිසදිටු බලය වැඩි වී නිර්මල බුදු දහම මිනිසා කෙරෙන් තුරන් වී මුළු ලෝකයම මිසදිටු වී පාපයට බර වී මිනිසා තිරිසනුන් මෙන් වී මහා විනාශය කරා ඇදී යාමද සිදු වේ.

ආයු වර්ණාදිය පිරිහී උපදින මනුෂ්‍යයෝ දුර්වර්ණව විරූපව ගුණ හීනව කෙටි කලක් ජීවත් වෙමින් ඔවුනොවුන් කපා කොටා මරා ගන්නා වූ හීන දීන කෲර සත්ව කොටසක් වී මැරී මැරී අපාය පිරී යාමටද හේතු වේ. මේ ක්‍රමයෙන් දස වසර දක්වා ආයුෂ පිරිහීමේ ක්‍රියාදාමය අඛණ්ඩව පවතිනු ඇත. එහෙත් එම කාලය ප්‍රමාද කළ හැක්කේ ප්‍රාඥයාට පමණි. එම නිසා අද පටන් ඔබ වඳ කර ගැනීමෙන් වැළකී හොඳ දරු උපත් වැඩි කර ගෙන කුඩා කල පටන් සම්මා දිට්ඨියේ යොදවමින් පවින් වළකා ගුණ දහම් මඟ කියා දීමෙන් වැඩි දරුවන් බුදු සසුනට පුද කිරීමෙන් නිර්මල බුදු දහමත්, පින්වත් පරම්පරාවත් දිගු කල් පැවැත්වීමට හා පරමායුෂ දස වසර වීමේ කාලය දීර්ඝවීමත් සුගතිය පිරී යාමත් සිදු කළ හැකි බැවින් වඳ කර ගැනීමෙන් වැළකීමම මහා කුසල් මාර්ගයක් වේ.

## තිරිසන් සත්වයෝ මිනිසාට එරෙහිවීම

මිනසාගේ සුඛ විහරණය සඳහා මිසදිටු ගෙන දිය ගොඩ සත්වයන් බෝ කරමින් දින පතා කෝටි ගණන් මරා දැමීමත්, වස යොදා කෘමි සතුන් මැරීමත් නිසා මැරෙන සතුන් මිනිසා කෙරෙහි වෛරයෙන් නැවත තිරිසන් සතුන්ව ඉපිද මිනිසාගේ පරිභෝජනයට ගන්නා වූ භෝග විනාශ කරමින් මිනිසාට ලෙඩ රෝග බෝ කරමින් මිනිසාට එරෙහිව ක්‍රියා කරන අතර, එයින් ම තව කොටසක් යක්ෂ

ප්‍රේතව ඉපිද නොපෙනෙන අයුරින් දුර්වල සිත් ආක්‍රමණය කර පාපයට ඇද දමමින් හෝ විවිධ ලෙඩ රෝග විපත් කරදර පමුණුවමින් මිනිසාට එරෙහිව ක්‍රියා කරනු ලැබේ.

**අඥාන කුරිරු මිනිස් සත්වයෝ**

**දුල්ලභො මනුස්සත්ත පටිලාභො**

මිනිස් ජීවිතයක් ලැබීම දුර්ලභයි. මේ සියල්ල අවබෝධ කළ බුදු රජාණන් වහන්සේගේ බුදු වදනක් බව දැන දැන, අස අසා පින් බලයෙන් ම ලැබෙන උතුම් දුර්ලභ වූ මිනිස් උප්පත්තිය වළකාලමින්, වඳකර ගනිමින්, පාපයේ බලයෙන් උපදින, දුක් විඳීමට උපදින, පාප කර්ම විපාක ගෙවීමට උපදින, දුක් විඳ විඳ මැරෙන, දුක් දී අකාලයේ මරා දමන, තිරිසන් උප්පත්ති බෝ කරන අය මොන තරම් පවු රැස් කරනවාද? මෙසේ දුර්ලභ වූ මිනිස් දරු උපත් වළක්වා අපාගත තිරිසන් උපත් බෝ කරන්නෝ අනාගත සංසාරයට මහා භයානක කටුක වූ දුක් රැස්කර ගන්නෝ ය. එබැවින් එවැනි දේවල් කරන මනුෂ්‍යයෝ තරම් අඥාන, කුරිරු වූ වෙනත් සත්ව කොටසක් මේ මිහිතලය මත සිටිත්දැයි නොදනිමු.

මිනිසා පිළිබඳ වූ මේ අමිහිරි කතාවෙන් මිහිරි වූ **සංඛාරුප්පත්ති** කතාව නිමා කරන අතර, මේ පොත කියවන නුවණැත්තෝ සිත තුළ ඇති සම්මෝහය දුරු කරගෙන මිහිරි වූ සුගති සංඛ්‍යාත උසස් මිනිස් දෙව් බඹ උපත සඳහා නිවැරදි දැහැමි පැතුම් පිහිටුවා පුණ්‍යාභිසංඛාර රැස් කෙරෙත්වා. දෙව් මිනිස් බඹ ලොවත් අනිත්‍ය අස්ථිර බව දැනගෙන භවයට නොඇලී නොබැඳී, භවයෙන් එතෙරව ලබන ශාන්ත සැනසීම වන අමා මහ නිවන් ලබා දෙන

ආසවක්ඛය සඳහාද සද්ධා, සීල, සුත, ත්‍යාග, පඤ්ඤා යන ධර්ම වඩමින් සිත් දියුණු කිරීමේ වීරිය සමඟ හොඳ නුවණම පහළ වේවා. දහම් අවබෝධයෙන් සැනසුම ලබත් වා.

## වර්තමානයේ දී ප්‍රාර්ථනා කළ යුත්තක්

මේ උතුම් හෙළ බිමේ ස්වර්ණමය යුගය අතීතයට ගොස් ඇත. ඒ දුටු ගැමුණු, සද්ධාතිස්ස යුගයයි. සිත තරම් මහා බලවත් වූ විශ්මිත ශක්තියක් තවත් ලොව තුළ අවිද්‍යමානය. ලොව යම් තාක් විශ්මිත දේ නිර්මාණය කර ඇත්නම්, සොයාගෙන ඇත් නම් ඒ සිතෙහි බලයෙනි. එම බලය යහපතටද අයහපතට ද පොදුය. එබැවින් සිතට කළ නොහැකි දෙයක් නැත. බුද්ධිමත් මනුෂ්‍යයන් වශයෙන් යහපතට ම සිත යොදාගෙන, හොඳ සිතෙහි ප්‍රාතිහාර්ය තම ජීවිතයෙන් ම අත්දැකිය හැකි ය. ශ්‍රේෂ්ඨ වූ දුටුගැමුණු රජ බවට පත්වූයේ සාමණේර හිමි නමකි. එය කුසලය පදනම් කරගන්නා ලද සිතෙහි බලයෙන් සිදු වූ පැතුමක ප්‍රතිඵලයකි. රටෙන් අඩක්ම විජාතික සතුරන්ට යටත් ව තිබූ සමයෙහි සිල්වත්ව කුසල් කර, රටත් ජාතියත් බුදු දහමත් රැක ගැනීමේ පරම පවිත්‍ර චේතනාවෙන් විහාර මහා දේවියගේ කුස තුළ උපදිම්වා යැයි මරණාසන්න මොහොතේ පැතුම් තබා, සිත පිහිටුවා එතුමියගේ කුසයෙහි පිළිසිඳ ගෙන ''ගැමුණු'' නමින් උපන්නේ ය. වීරෝදාර නරපතියෙකු ලක් මවට ලැබුණේ එලෙසිනි. එම ප්‍රාතිහාර්ය පින්වත් වූ ඔබ සැමටත් කළ හැකි ය. අද සිටින බොහෝ බෞද්ධයෝ මේ ජීවිතයේ දී සසර ගමන අවසන් නොකරන්නෝ බව පැහැදිලි ය. මතු උපදමින් මැරෙමින් සසර ගමන් කරන්නෝ ය. එබැවින් අතීත මුතුන් මිත්තන් අපට උරුම කර දෙන ලද රට, ජාතිය, ආගම මතු පරපුරට හිමිකර දීම අප සැමගේ ද යුතු කමකි. මුළු ලෝකයෙන් ම සිංහලයාට ඇති එකම රට ශ්‍රී ලංකාව ය. බුදු දහමත්, සිංහල ජාතියත්

වනසා ලක් දිව අයත් කර ගැනීමට නොයෙක් බලවේග ක්‍රියාත්මකත වේ. එබැවින් මිනිස් ජාතියට, මිනිස් දේශයට, සම්බුදු දහමට හිතැති ඔබට කළ හැකි. කළ යුතු දෙයක් ඇත. සිල්වත් වන්න. කුසල් කරන්න. ජීවිතයේ සැදෑ සමය ගෙවන අයත්, තරුණ පිරිසත් සම අදහස්වලින් එකතට පෙළ ගැසෙන්න. මෙය කියවන ඔබ වෙන වෙන ම හෝ කුසල් කරන වාරයක් පාසා නිවනම පතන්න. එයට අමතරව පරගැති නොවී, ජාතිය ආගම රැක ගැනීම සඳහා ජනපති, අගමැති, ඇමති, මන්ත්‍රී තනතුරු ලැබ ධාර්මිකව එම තනතුරුවලම ඉපදෙම්වා. යැයි ප්‍රාර්ථනා කරන්න. මරණ මොහොතෙහි වෙන දෙයක් නොසිතා එම පැතුමෙන් යුතු සිත පිහිටුවා ගන්න. එවිට සංඛාරුප්පත්ති බුද්ධ දේශනාවට අනුව අනිවාර්යයෙන් එය ඉටුවේ. රට ජාතිය දහමට ලැදි සම අදහස් ඇති බහුතර පිරිසක් පාලකයන් වශයෙන් බිහිවූ විට සියලු සතුරු මිසදිටු ජාතික බලවේග පරදා, වසර 2500ක ශ්‍රේෂ්ඨ ඉතිහාසයක් ඇති බුදු දහමෙන් පෝෂිත මිනිස් ජාතිය හා පරම සත්‍ය වූ සම්බුදු දහම වසර 5000 ද ඉක්මවා පැවැත්වීමේ මහා බලය ඔබට හිමිවෙනු ඇත. ඔබගේ නාමය රන් අකුරින් ලියැවී ඉතිහාසයට එක්වෙනු ඇත. ඉන්දියන් සාගරයේ මුතු ඇටය ලෝකය තුළ බොහෝ කල් දීප්තිමත්ව බැබළෙනු ඇත. දෙව් මිනිසුන් සහිත ලෝක සත්වයාට හිත සුව පිණිස පරම සත්‍ය වූ නිර්මල බුදු දහම මිසදිටු අඳුර දුරලා තව බොහෝ කල් බැබළීමද සිදු වෙනු ඇත. එය ඔබට පාරමී ශක්තියක් වී මාර බලය සිඳ බිඳ දමා අමා මහ නිවනින් සැනසීම පිණිස ද හේතු වෙනු ඇත. එබැවින් මෙම උතුම් අදහස ඔබේ පැතුමට එකතු කරගන්න. අද සිටම ක්‍රියාත්මක වෙන්න.

**ඒ සඳහා ඔබට හොඳ නුවණම පහළ වේවා.**